دروس في العقيدة ـ سنهالي

# විශ්වාස ප්‍රතිපදාව

122

جاليات

شعبة توعية الجاليات بالزلفي

هاتف: ٤٢٣٤٤٦٦ ٠٦ فاكس: ٤٢٣٤٤٧٧ ٠٦ ص.ب: ١٨٢

# دروس في العقيدة

ترجمه للغة السنهالية :

## شعبة توعية الجاليات في الزلفي

الطبعة الأولى : ١٤٢٥/٢ هـ.


ح شعبة توعية الجاليات بالزلفي، ١٤٢٥هـ

*فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر*

شعبة توعية الجاليات بالزلفي
دروس في العقيدة – الزلفي ، ١٤٢٥ هـ
١٣٢ ص؛ ١٢ × ١٧ سم
ردمك : ٦- ٥٩- ٨٦٤- ٩٩٦٠
(النص باللغة السنهالية )
١ -العقيدة الإسلامية أ. العنوان
ديوي ٢٤٠ ١٤٢٥/٧٢٧

رقم الإيداع : ١٤٢٥/٧٢٧

ردمك : ٦-٥٩ – ٨٦٤-٩٩٦٠

الصف والإخراج: شعبة توعية الجاليات في الزلفي

# دروس في العقيدة
# විශ්වාස ප්‍රතිපදාව

අල්ලාහ් මෙසේ පවසන්නේය.

*තමාගේ ස්වාමියා (අල්ලාහ්) විසින් පහළ කළ සියලු දේ දූතයා (රසූල්) විශ්වාස කළේය. එසේම විශ්වාස වන්තයින්ද විශ්වාස කළහ. (මේ) සැම දෙනා මලක් (දූත)වරුන්, දේව ග්‍රන්ථ හා රසූල් (වක්තෘ)වරුන් විශ්වාස කළහ. අපි රසූල් වරුන් අතර වෙනස්කම් ඇති නොකරන්නෙමු. තවද, 'අපි ඇසුවෙමු. පිළිපැද්දෙමු. ස්වාමිනී, ඔබෙන් අපි සමාව අයැදින්නෙමු. ඔබ වෙතද අපි යළි පැමිණෙන්නෙමු' යනුවෙන් ඔවුහු පැවැසූහ.*

*(අල්කුර්ආන්-2:285)*

1-නබිනායක මුහමම්දු (සල්) තුමා පැවැසූ බව උමර් බින් කත්තාබ් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

නියතව ක්‍රියාවන් සියල්ල සිතුවිල්ල මත සිදුවේ. නියතව සැම මිනිසෙකුටම ඔවුනොවුන්ගේ සිතුවිල්ල අනුව පල ලැබෙන්නේය. කවරෙකුගේ හිජ්රතය (හැර යාම) අල්ලාහ් හා ඔහුගේ දූතයා වෙනුවෙන් සිදුවෙන්නේද එය අල්ලාහ් හා ඔහුගේ දූතයා වෙනුවෙන්ම පවතී. කවරෙකුගේ හිජ් රතය මෙලොවේ භාග්‍යය ලබාගැනීම වෙනුවෙන් හෝ ස්ත්‍රියෙකු විවාහකර ගැනීම වෙනුවෙන් සිදුවෙන්නේද, ඔහුගේ හිජ්රතය ඔහු හිජ්රත් කළ ඉලක්කය අනුව සිදුවේ.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

මෙම නබිතුමාගේ වදන සෑම ක්‍රියාවන් සඳහාම පදන මක් ලෙස පවතී. ක්‍රියාවන් අල්ලාහ්ගෙන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ නිවැරදි බවට පත්වීම හෝ වැරදි සහගතව පවතීම හෝ සිතුවිල්ල අනුව බව මෙහි අවධාර ණය කර ඇත. පුද්ගලයෙක් කුමක් කිරීමට සිතන්නේද, එකී ඵලයම ඔහු ලබයි. භාහිර වශයෙන් කුසල් සහගත බව පවතින ක්‍රියාවක්, එහි පිරිසිදු චේතනාවක් නොමැති බැවින්, එය ඔහුට කිසියම් පලක් ලබා නොදෙන්නේය. මේයට සාධක ලෙස පවතින අල්කුර්ආන් වැකි මෙසේය.

*දැනගන්න, පිරිසිදු වත් පිළිවෙත් (සියලු ඇදහීමයන්) අල්ලාහ්ටය.*

*(අල්කුර්ආන්-39:3)*

*අල්ලාහ් කෙරෙහි තම වැඳුම් පිදුම් (යහපත් මගෙහි) චිත්ත පාරිශුද්ධියෙන් කිරීම සඳහා ඔවුන්ට අණකරන ලදී.*

*(අල්කුර්ආන්-98:5)*

*තවද, (ම : නබි) 'ඔබ (ස්වාමියාට) ෂිර්ක් (ආදේශ) කිරී මෙහි යෙදෙන්නේනම්, ඔබගේ ක්‍රියාවන් සියල්ල විනාශ වේ. ඔබ අලාභ කරුවන්ගෙන් කෙනෙකු ලෙසට පත් වේ' යනුවෙන් ඔබටත් ඔබට පෙර සිටී අයටත් වහී (දේව පණි වුඩ) මගින් පවසන ලදී.*

*(අල්කුර්ආන්-39:65)*

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

සෑම කරුණක්ම පවතින්නේ එකී භාහිර පැවැත්මෙන් තොර, එකී අරමුණ අනුව පමණී. එහෙයින්, මිනිසෙකු ගේ භාහිරත්වය කෙරෙහි නොරැවටිය යුතුයි. සමහරවිට

ඔහුගේ හදවතෙහි අපවාදයක්ද සිදුවන්නට හැක. නමුත්, යථාර්ථයෙන් මිනිසුන් කෙරෙහි හොඳ සිතුවිල්ලක් තබා ගත යුතුයි. චන්දනාමානයන්හි මිනිසුන් අතර උස් පහත් තත්ත්වය පවතින්නේ ඔවුන්ගේ චේතනාවන් අනුවය. දිවු රීම, භාරවීම, දික්කසාදවීම හා කොන්දේසි පණවීම, ගිවි සුම් කිරීම, පොරොන්දුවීම හා මෙවන් සෑම දෙයක් සඳ හාම පවිත්‍ර චේතනාව අනිවාර්යවේ. අමතකවූ තැනැත්තා, බලකිරීමට ලක්වූ තැනැත්තා, මෝඩයා, පිස්සා හා දරුවා යනාදි අයට ආගමික නීතිරීතීන් වලංගු නොවන්නේය.

කෙනෙකු කුමන දෙය කෙරෙහි අදහස් කරන්නේද, එය ඔහුට ලැබේ. එසේ නොමැතිව එයට අමතරව වෙනත් කිසියම් දෙයක් ඔහුට ලැබේද ? මෙය කල්පනා කළ යුතු දෙයකි. මිනිසුන්ගේ හදවත්තුල පවතින චේතනාවන් ගැන අල්ලාහ් හැර අන් කවරෙකුට හෝ දැනගත නොහැක.

අන් අයට පෙන්වීම සඳහා හා ප්‍රසිද්ධිය තකා ක්‍රියාවක යෙදීම පිළිකුල් සහගත කරුණකි. මන්දයත්, මේ දෙකෙ හිම අල්ලාහ් හැර අන් දෙය අරමුණු බවට පවතින්නේය. කුසල් ක්‍රියාවන් පිරිසිදු චේතනාවෙන් තොරව පරිපූරණත් වයට නොපත්වේ. කවරෙක් හෝ මෙලොව අරමුණක් ලෙස පදනම් කරගෙන පරලොව දෙවැනි තැනකට පත්කරන් නේනම්, ඔහුට පරලොවෙහි කිසිවක් නොලැබේ.එසේම, කවරෙක් හෝ පරලොව අරමුණක් ලෙස පදනම් කරගෙන මෙලොව දෙවැනි තැනකට පත්කරන්නේ නම්, ඔහුට මෙලොව හා පරලොවෙහි යහපත් ප්‍රසාදයන් ලැබේ. කව රෙක් (අල්ලාහ් වෙනුවෙන් තොරව) මිනිසුන් වෙනුවෙන් ක්‍රියාවක යෙදෙන්නේද, ඔහු අල්ලාහ්ට ආදේශ කළේය.

අල්ලාහ්ගේ සූක්ෂ්ම ඥානය හා රහස්‍යයන් සියල්ල ඔහු දැන සිටින බව මෙම වදනෙහි අන්තර්ගතව පවතී. අල්ලාහ් මිනිසුන්ගෙන් සිදුවන වැරදි ලොවෙහි ප්‍රසිද්ධ නොකර සඟවන්නේය. මන්දයත්, අල්ලාහ් එම වැරදිකරුවන් ඔවුන්ගේ අපිරිසිදු චේතනාව හේතු කොටගෙන ඔවුන් අවනම්බුවට පත් නොකරන්නේය.

පුද්ගලයෙක් කොපමණ කුසල් ක්‍රියාවන් ඉටුකර ඇති බව සළකනු නොලබන නමුත්, ඔහු කුමණ චේතනාවෙන් ඒවා ඉටුකර ඇත්තේද යැයි සළකනු ලබන්නේය. එනම්, එය සළකනු ලබන්නේ අල්ලාහ් වෙනුවෙන් යනු පවිත්‍ර චේතනාවෙන් හා නබිනායක තුමාව අනුගමනය කිරීමෙන් පමණකි. ස්වල්ප ක්‍රියාවන් හෝ වේවා ඒවා පිරිසිදු චේතනාවෙන් පවතින්නේ නම්, එය ප්‍රමාණත්වේ.

මේ පිළිබඳව නබිනායක තුමාගේ වදන්වල සඳහන්වේ. කෙනෙක් ක්‍රියාවක් ඉටු කිරීමට පෙර එකී චේතනාව තහවුරු කරගත යුතුයි. අනිවාර්ය ක්‍රියාවක් හෝ කාලීන ක්‍රියාවක් හෝ වේවා ඒවා චේතනාවෙන් තොරව පිළිගනු නොලැබේ. කුමණ ක්‍රියාවන් වෙනුවෙන් චේතනාව මුඛයෙන් ප්‍රකාශ කළ යුතු බව නබි වදන්වල සාධක පවතින්නේද ඒවා හැර අන් කිසියම් ක්‍රියාවන් වෙනුවෙන් හෝ චේතනාව මුඛයෙන් ප්‍රකාශ නොකළ යුතුයි.

# ඉස්ලාමය හා ඊමානය

**2**-ඉබ්නු අබ්බාස් (රලි) මෙසේ වාර්තා කරන්නේය.

අබ්දුල් කෛස්ගේ දූත පිරිසක් නබිනායක මුහම්මදු (සල්) තුමා හමුවට පැමිණි අවස්ථාවේ එතුමා මෙම (සමාජය හෝ) මෙම දූත පිරිස කවරෙක් දැයි විමසීය. එයට ඔවුහු අපි රබීආ ගෝත්‍රයට අයත් පිරිස් බව කීහ. එකළ නබිතුමා 'දූත පිරිස කිසිඳු නින්දාවෙන් හා කණගාටුවෙන් තොරව සාදරයෙන් පිළිගන්නෙමු' යනුවෙන් පැවැසීය.

ඔවුහු 'අල්ලාහ්ගේ දූතවරයාණෙනි, ශුද්ධවූ මාසය හැර වෙනත් මාසවල ඔබතුමා වෙත පැමිණීමට අපිට නොහැක. මන්දයත්, අප හා ඔබතුමා අතර මුළර් ගෝත්‍රයට අයත් අවිශ්වාස වන්තයින් (බාධකයින් ලෙස) සිටිති. එහෙයින්, සැක රහිත පැහැදිලි නිසැක කරුණු කීපයක් කෙරෙහි අපට අණ කරන්න. අපි ඒවා අපට පසු පීවත්වන්නන්ට දැනුම් දෙන්නෙමු. එමගින් අපි ස්වර්ගයට පිවිසෙන්නෙමු' යනුවෙන් පවසා සමහර පානයන් ගැනද විමසූහ.

පසුව නබිනායක තුමා ඔවුන්ට කරුණු සතරක් අණ කළේය. තවත් කරුණු සතරක් අවවාද කළේය.

අල්ලාහ් පමණක් විශ්වාස කළයුතු බව අණකර, අල්ලාහ් පමණක් විශ්වාස කිරීම යනු කුමක්ද ? යනුවෙන් විමසීය. එයට ඔවුහු 'ඒ පිළිබඳ ඉමහත් ඥානවන්තයින් අල්ලාහ් හා ඔහුගේ දූතවරයාය' යනුවෙන් කීහ. එකළ නබිනායක තුමා 'වන්දනාමාන බල මහිමයට සුදුසු එකම ස්වාමියා අල්ලාහ් බවත්, නබිනායක මුහම්මදු (සල්) තුමා අල්ලාහ්ගේ

දූතයා බවත් සාක්ෂි දැරීම, සලාතය (නැමදුම) ඉටු කිරීම, සකාතය (දුගී බද්ද) ගෙවීම, රමලාන් මාසයේ උපවාස ශීල යෙහි යෙදීම හා යුධ පිටියෙන් ලැබෙන දෙයින් පහෙන් එක කොටසක් ගෙවීම යනුවෙන් පැවැසීය.

පසුව (මත්පැන් සඳහා භාවිතාකළ) මැටි පෝච්චි, ලබු කැට, ලී පීප්පාව හා තාරවලින් ආලේප කරනලද භාජන යනාදී සතරක් භාවිතා කිරීම තහනම් කළේය. මේවා ඔබලා උනන්දුවෙන් පිළිපදින්න. මෙහි නොපැමිණ සිටින් නන්ටද මේ ගැන දැනුම් දෙන්න යැයිද එතුමා පැවැසීය.
(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබී වදනෙහි අන්තර්ගත කරුණු

කුසල් ක්‍රියාවන් විශ්වාසයට අදාල කරුණකි. පොදුවෙන් එක් කරුණක් ප්‍රකාශ කරන ආගමික විද්වතෙක් පසුව එය පැහැදිළි කිරීම සතුටු දායකවේ. ප්‍රථමයෙන් මූලික දැනුම පිළිබඳවද පසුව වැදගත් ප්‍රශ්න පිළිබඳවද පැහැදිළි කළ යුතුයි. එයද ඔවුන් වටහාගත හැකි ආකාරයට කෙටියෙන් පැවසිය යුතුයි.

මෙම නබිවදන කෙරෙහි අවධානය යොමු කරන්නා එහි කරුණු පහක් අණකර ඇති බව දැන ගනී. (නමුත්, නබි නායක තුමා කරුණු සතරක් ගැන පමණක් අණකර ඇත් තේය) එනමුත්, යුධ පිටියෙන් ලැබෙන දෙයින් පහෙන් එකක් ගෙවීමද ධනයට අදාල වගකීමක් වන බැවින් එය සකාතයෙහි අන්තර්ගතවේ. මේ අනුව අණකර ඇති කරුණු සතරක් ලෙස පවතී.

තහනම් කරනලද කරුණු සතරක තහනම පසුව ඉවත් කරනලද බව සමහර නබිවදන් පිළිබඳ ප්‍රවීණයන් පවසති. මන්දයත්, මෙවන් භාජනවල මත්පැන් හැර වෙනත් දේද පානය කිරීමට හැකිවන බව පැහැදිළි නබි වදන්වල සඳ හන්වෙ. එසේම, කෙනෙක් තමා වටහාගත් දැනුම් ඥානය රැක ගැනීම, අන් අය හමුවට එය ප්‍රචාරය කිරීම, මිනිසුන් අතර එය ව්‍යාප්ත කිරීම හා පියවරෙන් පියවරට අධ්‍යාපනය ලබා ගැනීම යනාදිය කෙරෙහි උනන්දුකර ඇත. එම වක වානුවෙ හජ් කර්තව්‍යය අනිවාර්ය නොවූ බැවින් මෙම නබි වදනෙහි හජ් කර්තව්‍යය ගැන සඳහන් නොවූ බව සමහර විද්වතුන් පවසති.

දූත පිරිසක් පැමිණවිට ඔවුන්ගෙන් ඔවුන් ගැනද, ඔවුන් ගේ නම් හා ගෝත්‍රය පිළිබඳවද විමසිය යුතුයි. මෙය සුන් නත් භෙවත් නබිතුමාගේ මගකි. එසේම, ඔවුන්ගේ හදවත් තුල ඔවුන් පිටස්තර අය යන මතය ඉවත් කොට ආදරය ඇති කිරීම සඳහා ඔවුන් සාදරයෙන් පිළිගනිමින් ඔවුන්ට ආගන්තුක සංග්‍රහය කළ යුතුයි.

මෙහි ඉස්ලාම්හි අනිවාර්ය කරුණු මගින් ඊමානයට අර්ථ විවරණය කර ඇත. කිසිදු තැනක ඉස්ලාම් යනුවෙන් හෝ ඊමාන් යනුවෙන් තනිව සඳහන් වූයේනම්, එයින් එකක් අනෙකට අර්ථ විවරණයක් ලෙස පවතී. එනමුත්, ඉස්ලාම් හා ඊමාන් එකම තැනක සඳහන් වූයේනම්, දෙක ටම වෙන වෙනම අර්ථ විවරණය කළ යුතුයි.

**3**-බර්රාඋ බින් ආසිබ් (රලි) තුමා නබි වදනක් මෙලෙස වාර්තා කරන්නේය.

අපි නබිනායක මුහම්මදු (සල්) තුමා හමුවෙහි අසුන් ගෙන සිටීමු. එකළ එතුමා 'ඉස්ලාමිහි ඉතා විශේෂ කරුණු කුමක්ද ?' යනුවෙන් විමසීය. එයට එතුමාගේ ශ්‍රාවකවරුන් 'සලාතය' යනුවෙන් කීහ. එයට නබිතුමා 'හොඳයි. නමුත් මම විමසුවේ එය නොවේ' යනුවෙන් පැවැසූ කළ ඔවුහු 'සකාතය' යැයි කීහ. එයටද නබිතුමා 'හොඳයි. නමුත් මම විමසුවේ එය නොවේ' යනුවෙන් පැවැසූවිට ඔවුහු 'උපවාස ශීලය' යැයි කීහ. හොඳයි. නමුදු, මා විමසුවේ එය නොවේ' යනුවෙන් පැවැසූ කළ ඔවුහු 'හජ් කර්තව්‍යය' යැයි කීහ. පසුව නබිතුමා 'හොඳයි. නමුත් මා විමසුවේ එය නොවේ' යනුවෙන් පැවසූ කළ මවුහු 'ජිහාද් කිරීම' යනුවෙන් කීහ. එයට නබිතුමා 'හොඳයි. නමුත් මා විමසුවේ එය නොවේ' යනුවෙන් පවසා 'ඊමාන්හි (ඉස්ලාමිහි) ඉතා විශේෂ කරුණු, අල්ලාහ් වෙනුවෙන් ඔබ ආදරය කිරීම හා අල්ලාහ් වෙනු වෙන් ඔබ කෝපවීම වේ' යනුවෙන් ප්‍රකාශ කළේය.

(මූලාශ්‍රය : අහ්මද්, සහීහුල් ජාමිඋ)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

ඉස්ලාම් ධර්මයේ කුසල් ක්‍රියාවල උස් හා පහත් තත්ත් වයෙන් යුත් සමහර කරුණු පවතී. ආදරය කිරීම, ප්‍රියවීම සහ අල්ලාහ් වෙනුවෙන් කෝපවීම යනාදීන් අගාමාකුල කරුණුය. සැබැවින්ම, අල්ලාහ්ට කීකරුවන්නන් කෙරෙහි ආදරය කිරීම හා පාපකරුවන් කෙරෙහි කෝපවීම මුස්ලිම් වරයෙකුට අනිවාර්යවේ. නිසැකයෙන්ම, අල්ලාහ් වෙනුවෙන් පවතින ප්‍රීය උසස් තත්යෙන් පවතින්නේ සමහර ලෞකික හේතූන් නිසාය. මෙය සමහරවිට එකින් එක සසඳා බැලීම අනුව පවතී.

පුද්ගලයෙක් අල්ලාහ්ට කීකරුවන ප්‍රමාණය අනුව ඔහු කෙරෙහි ආදරය කළ යුතු අතර, ඔහු අල්ලාහ්ට වෙනස්කම් (පාපයන්) කරන ප්‍රමා ණය අනුව ඔහු කෙරෙහි කෝපවිය යුතුයි. කෙනෙකුගෙන් සිදුවන කීකරුවීම් හා පාප කිරීම් අනුව ඔහු කෙරෙහි ආදරය කිරීමට හා කෝපවීමට හැකි වේ. මිනිසුන් කෙරෙහි පවතින ආදරය හා කෝපය ආගමා නුකූල පදනම මත සිදුවීම අනිවාර්ය වේ. අල්ලාහ් මෙලෙස පවසන්නේය.

*අපිද විශ්වාස කළෙමු යැයි (නබි ඔබට) මෙම ගැමියන් පවසන්නෝය. ඔබලා විශ්වාස නොකළහ. නමුදු අපි කීකරු වූයෙමු (ඉස්ලාමය වෙළෙඳ ගත්තෙමු) යැයි (හැකි නම්) පවසන්න. (යනුවෙන් නබි ඔබ ඔවුන්ට) පවසන්න. මන්ද, ඔබලාගේ සිත් සතන්තුල (සත්‍ය) විශ්වාසය නොපිවිසීය.*

*(අල්කුර්ආන් - 49:14)*

**4**-සඃද් බින් අබී වක්කාස් (රලි) තුමා නබිවදනක් මෙසේ වාර්තා කරන්නේය.

මා නබිනායක මුහම්මදු (සල්) තුමා සමග සිටින කළ එතුමා එක් පිරිසකට තෑගි බෙදා දුන්නේය. නමුත් ඔවුන් අතර සිටි එක් පුද්ගලයෙකුට පමණක් එතුමා (කිසිවක්) හෝ නොදුන්නේය. ඔහු මාහට ඉතා ආදරවන්ත කෙනෙකි. මා නබිනායක තුමා අමතා 'අල්ලාහ්ගේ දූතයාණෙනි, මෙම පුද්ගලයාට පමණක් කිසිවක් හෝ නොදුන්නේ ඇයි ? ඔහු විශ්වාසියෙකු බව මම අල්ලාහ් මත දිවුරා කියමි' යනුවෙන් කීවෙමි' එකළ නබිනායක තුමා 'ඔහු මුස්ලිමෙකු බව ඔබ නොදකින්නේද ?' යනුවෙන් විමසීය.

එවිට මම මද වේලාවක් නිශ්ශබ්දව සිටියෙමි. පසුව ඔහු පිළිබඳව මම අධිකව දැන සිටින බැවින් මාගේ ප්‍රශ්නය නැවත යොමු කොට මෙම පුද්ගලයාට පමණක් කිසිවක් හෝ නොදුන්නේ ඇයි ? ඔහු විශ්වාසියෙකු බව මා අල්ලාහ් මත දිවුරා කියමි' යැයි කීමි. එකළ නබිතුමා 'ඔහු මුස්ලි මෙකු බව ඔබ නොදකින්නේද ?' යනුවෙන් පැවැසීය.

පසුවද ඔහු පිළිබඳව මා අධිකව දැන සිටින බැවින් මගේ ප්‍රශ්නය නැවත යොමු කළෙමි. එකළ එතුමා 'ඔහු මුස්ලි මෙකු බව ඔබ නොදකින්නේද ?' යනුවෙන් විමසා 'අහෝ සඃද්, මා කෙනෙකුට (තෑගි බෙදා) දුන්නෙමි. නමුදු, ඔහුට වඩා මම කිසිවක් හෝ නොදුන් පුද්ගලයා මා වෙත ඉතා ප්‍රිය වන්තයෙකු ලෙස සිටී. (එසේ ඔහුට මා නොදුන්නේ නම්, ඔහු සිය ආගම අතහැර දමා ඒ හේතුවෙන්) අල්ලාහ් ඔහුව නරකාදියෙහි මූණින් අතට තල්ලු කරයි දැයි බියට පත්වීමෙන් ඔහුට මම ලබා දුනිමි. යනුවෙන් පැවැසීය.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

නියතව, ඊමානය ඉස්ලාමයට වඩා උසස් තත්ත්වයෙන් පවතින එකකි. සෑම මුඃමින් (විශ්වාසීන්)ම මුස්ලිම්ය. නමුදු සෑම මුස්ලිම්වරුන්ම මුඃමින් නොවන්නේය. මිනිසුන් ආගමික විද්වතෙකුගෙන් ඔහු අප්‍රිය නොකරන තෙක් තම තුල පවතින සැකය ඉවත්කර ගැනීම සඳහා කීප වතාවක් තම ප්‍රශ්නය නැවත නැවත යොමු කිරීමට හා කථා බහක යෙදීමට හැක. මිනිසුන්ට ලොවෙහි දෙයක් තෑගි භෝග ලබාදීම ඔවුන්ගේ ඊමානයේ තරාතිරම අනුව නොවන්නේය.

ධනය පිරිනමා මිනිසුන් අල්ලාහ් කරා කැඳවීමටද එමගින් ඔවුන්ගේ හදවත ආකර්ශනය කිරීමටද හැක.

නබිනායක මුහම්මදු (සල්) තුමා තම සමාජය කෙරෙහි කරුණාව හා උනන්දුව දක්වා ඇත. ආගමික විද්වතෙකු තම සමාජයන්ට සැක සහිත කරුණු පිළිබඳව විවරණයක් ලබාදී ඔහුගේ අරමුණ පැහැදිලි කළ යුතුයි. එසේම, තම හදවතෙහි මතුවන සැක හා කනස්සල්ල ඉවත්කර ගැනීම සඳහා (පසුතැවිලි වීමකින් තොරව) ඒ ගැන විද්වතෙකුට පැවැසිය යුතුයි.

# ඉස්ලාමය කරා කැඳවීම

අල්ලාහ් මෙසේ පවසන්නේය.

*විශ්වාස වන්තයිනි, ඔබලා ඉස්ලාම් ආගමතුල සම්පූර්ණ යෙන්ම පිවිසෙන්න. තවද, ඔබලා සාතාන්ගේ පාද ලාංඡන යන් අනුගමනය නොකරන්න. සැබැවින්ම, ඔහු ඔබලාහට ප්‍රසිද්ධ සතුරකි.*

*(අල්කුර්ආන්–2:208)*

5–නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ වදනක් අබූ හුරෙයිරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙකුගේ අතෙහි මුහම්මදුගේ ප්‍රාණය පවතින්නේද, ඔහු කෙරෙහි දිවුරා කියමි. මෙම සමාජයෙහි කෙනෙකු ඔහු කිතු බැතිමතෙක් හෝ යුදෙව වරයෙකු හෝ වෙවා මා ගැන ආරංචිවී මා ගෙන ආ දෙය (ආගම) විශ්වාස නොකර මරණයට පත්වන්නේනම්, ඔහු අපාය වැසියෙකු මෙන් සිටී.

(මූලාශ්‍රය : මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

නබිනායක මුහම්මදු (සල්) තුමාගේ ඒක දේවත්ව කැඳවීම ආගම් අනුගමනය කරන හා පොළොවෙහි වසන සෑම දෙනාට පොදුය. එතුමා ගෙන ආ ආගම එයට පෙර පවතී ආගම් සියල්ල නිශ්ප්‍රභා කළේය. සාධක යොමු කිරීමට අනිවාර්ය වන්නේ කැඳවීම පතුරුවන අවස්ථාවේදීය. දිවුරන මෙන් අණ නොකළත්, ඉදිරිපත් කරන කරුණු සනාථ කිරීම වෙනුවෙන් දිවුරීමට හැක.

එසේම, අල්ලාහ්ට අතක් ඇති බව ඔහුගේ මහානුභාව සම්පන්නට ඔබින පරිදි සනාථ කොට ඇත. කවරෙකුට නබිනායක තුමාගේ කැඳවීම නොලැබුනේද, ඔහු පිළිබඳ තීරණය අල්ලාහ් සතුව පවතී. නබිනායක තුමා එවනු ලැබීමෙන් පසු මිනිසුන් පිළිපදින සෑම ආගමක්ම අවලංගු සහ ගතවෙ. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*තවද, කවරෙකු හෝ ඉස්ලාම් නොවන වෙන ආගමක් පිළිපැදීමට අදහස් කළේනම්, එය ඔහුගෙන් කිසිසේත් පිළිගනු නොලැබේ. තවද, ඔහු අවසාන දිනයෙහි අලාභකරුවන් අතර කෙනෙකු ලෙස සිටී.*

*(අල්කුර්ආන්-3:85)*

**6**-නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ වදනක් ඉබ්නු උමර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

මිනිසුන් වන්දනාමානය කිරීමට සුදුසු ස්වාමියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැති බවත්, නබිනායක මුහම්මදු (සල්) තුමා අල්ලාහ්ගේ දූතයා බවත් සාක්ෂි දරා, සලාතය

ඉටු කර හා සකාතය ගෙවන තෙක් ඔවුන් සමග යුද්ධ කරන මෙන් මම අණකොට ඇත්තෙමි. ඔවුන් ඒවා ඉටු කළේනම්, ඉස්ලාමයේ වගකීම් හැර ඔවුන් ඔවුන්ගේ ප්‍රාණ යන් හා ධනයන් මාගෙන් රැක ගනිති. ඉස්ලාමයේ වගකීම් පිළිබඳව අල්ලාහ් වග බලා ගනී.

(මූලාශ්‍රය : මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

නබිනායක මුහම්මදු (සල්) තුමා අල්ලාහ්ගේ අණකින් තොරව කිසිවක් නොකරන්නේය. එතුමා අල්ලාහ්ගේ පණිවිඩය මිනිසුන් අතර පතුරවන්නා හා ඔහුගේ නීතිරීතීන් ඔවුනතර ඉටු කරන්නාය. කුසල් ක්‍රියාවන් සියල්ල ඊමාන යට අදාල කරුණුවන අතර, සලාතය ඉටු නොකරන්නා හා සකාතය ගෙවීම ඉවතලන්නා කාෆිර් හෙවත් ප්‍රතික්ෂේප කරන්නාය.

ඒක දේවත්වය කුසල් ක්‍රියාවන් අතර ප්‍රථම ක්‍රියාවෙකි. මුර්ජියියා නැමැති පිරිස් කුසල් ක්‍රියාවන් ඊමානයෙන් සිට වෙන් කළ බැවින් මෙහි ඔවුන් හෙළා දැක ඇත. සලාතය ඉටු නොකරන්නා හා සකාතය ගැවීම ප්‍රතික්ෂේප කරන්නා සමග යුද්ධ කළ යුතුයි. මන්දයත්, සලාතය හා සකාතය අතර වෙනසක් නොපවතින්නේය. සකාතය ගෙවීම ප්‍රතික් ෂේප කළ අය සමග කලීෆා අබූබක්ර් (රලි) තුමා යුද්ධ කලේ මේ සාධක අනුවය.

මුස්ලිම් වරයා භාහිර වශයෙන් තම ප්‍රාණය හා ධනය රැක ගනී. නමුත් ඔහුගේ අභ්‍යන්තර කරුණු අල්ලාහ්ගේ වගකීමෙන් පවතී. වෙශධාරීන් භාහිර වශයෙන් ඉස්ලාම්හි

ක්‍රියාවල යෙදෙන බැවින් ඔවුන් හා සමග යුද්ධය නොකළ යුතු බවට මෙම වදන සාදක වේ. නමුදු ඔවුන්ගේ කරුණු පිළිබඳව අල්ලාහ් වගබලා ගනී. කවරෙක් හෝ (වන්දනා මාන බල මහිමයට සුදුසු ස්වාමියා අල්ලාහ් පමණක් බව සාක්ෂි දරා) ෂහාදාව ප්‍රකාශ කළේනම්, නබිනායක මුහම් මදු (සල්) තුමා පිළිබඳ විශ්වාසයද එහි අන්තර්ගත වේ.

7-අනස් (රලි) තුමා නබිනායක තුමාගේ වදනක් මෙසේ වාර්තා කරන්නේය.

නබිනායක මුහම්මදු (සල්) තුමා පුද්ගලයෙකු අමතා 'ඔබ ඉස්ලාම් ආගම වෙළා ගන්න' යනුවෙන් පැවැසූ කළ ඔහු 'මාහට එය අප්‍රිය බව පෙනෙන්නේය' යනුවෙන් කීය. එකළ නබිතුමා 'ඔබට අප්‍රිය බව පෙනුනද ඔබ ඉස්ලාමය වෙළා ගන්න' යනුවෙන් පැවැසීය.

(මූලාශ්‍රය : අහ්මද්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

කුසල් ක්‍රියාවල යෙදීම සඳහා මිනිසා තමාට බල කළ යුතුයි. තම සිත්සතනට බල කිරීමක් බව පෙනුනත්, කුසල් ක්‍රියාවන් කිරීම සඳහා ඉක්මන්විය යුතුයි. කෙනෙකුගේ මුල් අවධිය කොපමණ ඌණතාවයෙන් පැවැතී නමුත්, ඔහුගේ අවසන් අවධිය කොපමණ පරිපූරණත්වයෙන් පවතින්නේද යන්නෙහි පිළිබඳව සළකනු ලැබේ. කල්පනා කිරීමට හා සාධක සෙවීමට පෙර ඉස්ලාමය වෙළාගැනීම මිනිසාට අනි වාර්යවේ. ඇතැම්විට අප්‍රිය හදවතෙන් කරන කුසල් ක්‍රියා වන් පවා වලංගුවේ.

# ඉස්ලාමීය විශේෂත්වය

8-ඉබ්නු ෂමාසා අල් මහ්රි (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

අම්ර් බින් ආස් (රලි) තුමා මරණාසන්නයේ සිටින කළ අපි ඔහු වෙත ගියෙමු. එවිට ඔහු අධික වේලාවක් අඬා වැළපී, තම මුහුණ බිත්තිය දෙසට හරවා ගෙන සිටියේය. එකළ ඔහුගේ පුත්‍රයා 'මාගේ ආදරණීය පියාණෙනි, නබි නායක මුහම්මදු (සල්) තුමා මෙලෙස ඔබට සුභාසිංසනය නොකළේද? 'මා ආදරණීය පියාණනි, නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ ඔබට සුභාසිංසනය නොකළේද ? යනු වෙන් කීය. වහාම ඔහු අප දෙසට මුහුණලා 'වන්දනාමාන බල මහිමයට සුදුසු දෙවියා අල්ලාහ් හැර අන් කවරෙක් හෝ නොමැති බවත්, නබිනායක මුහම්මදු (සල්) තුමා අල්ලාහ්ගේ දූතයා බවත් සාක්ෂි දැරීම අපි රැස්කර ඇති කාර්යයන් අතර උතුම් කාර්යයකි.

සැබැවින්ම මම අවස්ථාවන් තුනක් පසුකර ඇත්තෙමි. නබිනායක මුහම්මදු (සල්) තුමා කෙරෙහි අධික වශයෙන් පිළිකුල් කළ තැනැත්තා මා හැර අන් කිසිවෙකු නොමැත. එතුමාව ඝාතනය කිරීම සඳහා මාහට අවස්ථාවක් ලැබී නම්, එතුමාව ඝාතනය කිරීමට වඩා කිසියම් දෙයක් හෝ මාහට ප්‍රිය බව නොපැවැතීය. එම ස්ථාවරයේ මා මරණයට පත්වූයේනම්, අපාය වාසීන් අතර කෙනෙක් බව මා සිටමි.

අල්ලාහ් මාගේ හදවතෙහි ඉස්ලාමය වෙළා ගැනීමේ චේතනාව මතු කළ විගස මා නබිනායක තුමා වෙත ගොස්,

'මා ඔබතුමාගෙන් බෙඅත් ප්‍රකාශ කොට ඉස්ලාමය වෙළා ගැනීම සඳහා ඔබතුමාගේ අත දිගු කරන්න' යනුවෙන් කීමි. නබිනායක තුමා තමාගේ දකුණු අත දිගු කළ විගස මාගේ අත මා නවා ගත්තෙමි. එකළ නබිතුමා 'අහෝ අම්ර්, ඔබට සිදුවූයේ කුමක්ද ? යැයි විමසීය. එක් කොන්දේසියක් තිබෙන බව මා කී කළ එතුමා 'කුමන කොන්දේසියද ?' යැයි විමසීය. 'මාගේ පාපයන් සැමට සමාව ලැබිය යුතුයි' යනුවෙන් මා කීමි. එකළ නබිනායක තුමා 'ඉස්ලාමය වෙළා ගැනීම එයට පෙර සිදුවූ පාපයන් සියල්ල විනාශ කරන බවත් හිජ්රත් (හැර) යාම එයට පෙර සිදුවූ පාපයන් සියල්ල විනාශ කරන බවත්, හජ් කර්තව්‍යය ඉටු කිරීම එයට පෙර සිදුවූ සැම පාපයන් විනාශ කරන බවත් ඔබ නොදන්නේද ? යැයි පැවැසීය.

නබිනායක තුමාට වඩා මාහට ඉතා ප්‍රිය වන්නයා හා මාගේ ඇහට ශ්‍රෙෂ්ඨ වන්නයා කවරෙක් හෝ නොමැත. එතුමා කෙරෙහි පවතින ගෞරවය නිසා සම්පූර්ණ බැල් මෙන් එතුමාව බැලීමට මාහට නොහැකිවිය. එතුමා පිළිබඳව වර්ණනා කරන මෙන් මාහට අණ කළේනම්, එය මාහට නොහැකිවෙ. මන්දයත්, මා එතුමාව මාගේ දැසින් පරිපූර්ණව නොබැලීමි. එම ස්ථාවරයේ මා මරණයට පත්වූයේනම්, මා ස්වර්ගවාසීන් අතර කෙනෙකු බව සිටියෙමි.

පසුව මාහට වගකීම් කීපයක් පැවැරිනි. ඒවා පිළිබඳ මාගේ තත්ත්වය කෙසේ පවතීද යන්නෙහි මම නොදනිමි. මම නැසී ගියේනම්, කවරෙක් හෝ අඳෝනා බස් කියන ස්ත්‍රීන් සහ ගින්න රැගෙන මා සමග නොපැමිණෙන්න. මාව භූමිදානය කළේනම්, මාගේ මිනීවල වැලිවලින් අතුරා

වහන්න. පසුව, මටුවෙක් කපා එකී මාංශ බෙදෙන වෙලාව තෙක් මගේ මිනීවළ වටකර සිටින්න. එමගින් මා තනි බව නොහඟවා සතුටුවීමට හා මාගේ ස්වාමියාගේ දූත වරුන්ට සපයන පිළිතුරු පිළිබඳව කල්පනා කිරීමට හැකිවෙ.

(මූලාශ්‍රය : මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

ඉස්ලාමය වෙළා ගැනීම එයට පෙර සිදුවූ පාපයන්ට ප්‍රති කාරයක් බව පවතී. කවරෙකු ඉස්ලාමය වෙළා ගන්නේද, එයට පෙර ඔහු කළ පාපයන් සඳහා ඔහුට දඬුවම් පනවනු නොලැබේ. එසේම, හිජ්රත් (හැර) යාම හා හජ් කර්තව්‍යය ඉටු කිරීම පාපයන් හා අකුසල් ක්‍රියාවන්ට ප්‍රතිකාර යකි. නමුත් මෙහි ප්‍රශ්නයක් මතුවෙ. එනම්, ඉස්ලාමය වෙළා ගැනීම මහා හා කුඩා පාපයන් සියල්ලටම ප්‍රතිකාර යක් වෙ. නමුත්, හිජ්රත් යාම හා හජ් කර්තව්‍යය ඉටු කිරීම පාපයන්ට ප්‍රතිකාරවීමෙහි විවිධ මතිමතාන්තර පවතී. මන්දයත්, මහා පාපයන් කමා කිරීමට පිරිසිදු චේතනාවෙන් පාපොච්චාරණය කිරීම කොන්දේසියකි. යහපත් ක්‍රියාවන්ද පාපයන් කමා කරයි. කුසල් ක්‍රියාවන් කොපමණ උතුම් භාවයෙන් පවතින්නේද, එපමණ පාපයන්ද කමා කරයි.

9–නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බවට ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ආගම් අතර අල්ලාහ්ට ඉමහත් ප්‍රිය ආගම පහසු සත්‍ය (ඉස්ලාම්) ආගමකි. (අහ්මද්) ඉබ්නු හජර් (රහ්) මෙම නබිවදන හසන් (පවිත්‍ර) බව තම ෆත්හුල් බාරී ග්‍රන්ථයෙහි සඳහන් කරයි.

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

නබිනායක මුහම්මදු (සල්) තුමාගේ ආගම නබි ඉබ්රාහීම් (අලෛ) තුමාගේ ආගමට පක්ෂපාති සත්‍ය හා සරල ආගමක්වන අතර, එතුමා එවන ලද්දේද සරල කිරීම සඳහාය. මිනිසුන් මත පටවා ඇති බර ලිහිල් කිරීම සඳහාද, ඔවුන්ගේ විලංගු කඩා දැමීම සඳහාද, අල්ලාහ්ට ඔහුගේ මහානුභාවයට ඔබින පරිදි හා නිර්මානයන්ට කරන ආදරයට සමාන නොවන පරිදි ඔහුට ආදරය කිරීම සඳහාද නබිනායක තුමා පැමිණියේය.

ආගම් අතර ශ්‍රේෂ්ඨත්වයද පවතින්නේය. නබි ඉබ්රාහීම් (අලෛ) තුමාට ඉමහත් කිට්ටුම හිතවතා අප නබිනායක තුමාය. ආගමක සත්‍ය භාවය එකී බහුතරය අනුව නොපවතී. මිනිසුන් අතර පහසුවෙන් හැසිරීම හා සුභාසිංසනය කිරීම ප්‍රිය කළ යුතු අතර, ශ්‍රමය දීමෙන් හා පිළිකුල කිරීමෙන් වැළකී සිටිය යුතුයි. නබිවදනක මෙසේ සඳහන්වේ.

'පහසු කරන්න. ශ්‍රමය නොකරන්න. යහපත් කරුණු පවසන්න. පිළිකුල නොකරන්න' යන නබිනායක තුමාගේ වදන මෙය පැහැදිළි කරයි.

(මූලාශ්‍රය : බුහාරි)

10-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බවට අබූ හුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

නිසැකයෙන්ම, මෙම ආගම සරල ආගමකි. කවරෙක් මෙම ආගම (තමාට) ශ්‍රමයක් බවට පත් කරන්නේද, එය ඔහුව අභිබවා යයි. එබැවින්, යුක්ති සහගතව සිටින්න. හැකි තරම් (කුසල්) කරන්න. කුලිය ලැබෙන බවට සතුටු

වන්න. උදේ වරුවේද සවස් වරුවේද රාත්‍රියෙහි සුළු වෙලා වක්ද (අල්ලාහ්ගෙන්) උපකාර පතන්න.

(මූලාශ්‍රය : බුහාරි)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

සතුටු භාවයෙන් සිටින අවස්ථාවල වන්දනාමනය ඉටු කිරීම මගින් ඒවාහි ස්ථිරව නිරතවීම සඳහා උදව් උපකාර පැතිය යුතුයි. කුසල් ක්‍රියාවන් ස්වල්ප වශයෙන් හෝ වෙවා අඛණ්ඩව ඉටුකිරීම කුසල් ක්‍රියාවන් අධික වශයෙන් වරින් වර ඉටු කිරීමට වඩා උතුම්ය. ඉස්ලාම් දහම සරලව පවතීම එහි විශේෂයකි. අණකර ඇති දේ ඉටු කිරීම හා වළක්වා ඇති දෙයින් වැළකීම මිනිසාගේ හැකියාව අනුව පවතී. ආගම ශ්‍රමයට පත් නොකළ යුතුයි බවද වටහාගත හැක.

ආගමෙහි සීමා ඉක්මවා නොයාමෙන් හා අතපසු කිරී මෙන් තොරව මධ්‍යස්ථව අනුගමනය කළ යුතුයි. මෙය යහ මගකි. පුද්ගලයෙකුට කිසියම් වන්දනාමානයක් පරිපූර්ණ යෙන් ඉටු කිරීමට නොහැකි වන්නේනම්, හැකිතාක් එය ඉටු කිරීමට උනන්දුවීම ඔහුට අනිවාර්යවේ. වන්දනාමාන යන් හා කුසල් ක්‍රියාවන් දහවල්හි ආරම්භ වෙලාවේ ඉටු කිරීම ශ්‍රේෂ්ඨයකි. මන්ද, ඒවා එම වෙලාවේ උනන්දුවෙන් ඉටු කිරීමට හා එය පිළිගැනීමට හැකි වේ.

රාත්‍රියෙහි ස්වල්ප වෙලාවක් හෝ සිටගෙන වන්දනාමාන කිරීම උතුම්ය. මන්ද යත්, අල්ලාහ්ගේ ආශීර්වාදයෙන් එය තම අරමුණ කරා යාමට උපකාරවේ. එසේම, අස්ර් හා මග් රිබ් සලාතය අතර කුර්ආනය පාරායනා කිරීම හා අල්ලාහ් සිහි කිරීම සතුටු දායක වේ. මුස්ලිම් වරයෙකු (ආගමෙහි)

මධ්‍යස්ථය අනුගමනය කර, තමාට හැකි දෙය ඉටු කර, නබිනායක තුමාගේ මග පිළිපදිමින් සිටින කල ඔහුට සුභාසිංසනය පවතී.

**11**-නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූසර්ද් අල්කුද්රි (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙක් අල්ලාහ්ව ස්වාමියා ලෙසත්, ඉස්ලාමය ජීවන මාර්ග (ආගම) ලෙසත්, නබිනායක මුහම්මදු (සල්) තුමාව අල්ලාහ්ගේ වක්තෘවරයා ලෙසත් පිළිගන්නේද, ඔහුට ස්වර්ගය අනිවාර්ය වේ.

(මූලාශ්‍රය : මුස්ලිම්)

## නබී වදනෙහි අන්තර්ගත කරුණු

කවරෙක් මෙම කරුණු තුන පවිත්‍ර චේතනාවෙන් විශ්වාස කර, එය සත්‍යභාවයෙන් ප්‍රකාශ කරන්නේද, ඔහුට අල්ලාහ් ස්වර්ගය අනිවාර්ය කරයි. මන්දයත්, ඔහු ඉස්ලාම්හි මූලික කරුණු තුනක් සත්‍ය කළේය. දහමෙහි මහත් අනිවාර්ය කරුණු ඉටු කළේය. ඒනම්, අල්ලාහ් කෙරෙහිද, සත්‍ය ආගම කෙරෙහිද හා සත්‍ය වන්තයාවූ නබිනායක මුහම්මදු (සල්) තුමා කෙරෙහිද විශ්වාස කිරීමකි.

**12**-නබිනායක තුමාගේ අනුගාමික වූ ආයිද් බින් අම්ර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

මක්කාව ජයග්‍රහණය කළ දින නබිනායක මුහම්මදු (සල්) තුමා පිරිවරමින් එතුමාගේ සහාබාවරුන් (මිත්‍රයන්) සිටින කළ මා අබූ සුෆ්යාන් (රලි) තුමා සමග පැමිණියෙමි. එකළ ඔවුහු ‘මෙන්න අබූ සුෆ්යාන් හා ආයිද් බින් අම්ර්

යන අය පැමිණ සිටිති' යැයි ඔවුහු කීහ. වහාම නබිතුමා 'එසේමයි. ඔවුන් ආයිද් බින් අම්ර් හා අබූසුෆ්යාන්ය. නමුදු, ඉස්ලාමය ඔවුන්ට වඩා උතුම්ය. ඉස්ලාමය (සැම දා) උසස් ස්ථානයකින් පවතින අතර, එය (කිසිඳු දිනක හෝ) පහත් ස්ථානයකින් නොපවතී.

(මූලාශ්‍රය : බයිහකී)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

ලොවෙහි පවතින ආගම් හා දහම් අතර ඉමහත් උතුම් ධර්මය අල්ලාහ්ගේ සත්‍ය ආගමකි. මුස්ලිම් නොවන්නා කුමණ උසස් තරාතිරමක හෝ ගෞරවනීය තත්වයක හෝ කොපමණ ධනවත්ව හෝ සිටියත්, මුස්ලිම් වරයා ඔවුන්ට වඩා ශ්‍රේෂ්ඨයා බව සිතාගත යුතුයි. මන්ද, මේවා සියල්ලට වඩා ඉස්ලාමය ඉතා ශ්‍රේෂ්ඨවෙ.

ගරු කිරීම, අගය කිරීම හා ආදරය කිරීම යනාදියන්හි මුස්ලිම් හා මුස්ලිම් නොවන්නන් අතර සමානව නොහැසි රිය යුතුයි. මුස්ලිම්වරයා ඉස්ලාමය පිළිගෙන සිටින බැවින් ඔහුට විශේෂත්වයක් ලබා දිය යුතුයි.

සමහරුන් 'මුස්ලිම් වරයා මුස්ලිම් නොවන්නාට උරුමක් කාරයෙකු විය හැක. එනමුත්, මුස්ලිම් නොවන්නා මුස්ලිම් වරයාට උරුමක්කාරයෙක් විය නොහැක' යන්නෙහි නබි නායක තුමාගේ මෙම වදන සාධකයක් වශයෙන් සනාථ කරන්නෝය. නමුත්, නිවැරදි මතයනම් ඔවුනතර කවරෙක් හෝ කවරෙකුට උරුමක්කාරයෙක් විය නොහැක.

**13**-නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන් දුන් බව අබූසර්ද් අල්කුද්රී (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙක් ඉස්ලාමය වෙළා ගෙන, ඒ අනුව සිය ජීවිතය ගත කරන්නේද, ඔහු පෙර කළ සෑම කුසල් ක්‍රියාවන් සඳහාම අල්ලාහ් ඔහුට කුලිය සටහන් කරයි. ඔහු පෙර කළ සෑම අකුසල් ක්‍රියාවන්ම විනාශ කරනු ලබන්නේය. පසුව ඔහුගේ කුසල් හා අකුසල් වෙනුවෙන් ප්‍රතිකාර කිරීම සිදු වේ. එනම්, කුසලක් වෙනුවෙන් එවන් දහය සිට හත්සීය ගුණයක් දක්වාවූ කුසලට අදාල කුලියද, අකුසලක් වෙනුවෙන් එය අල්ලාහ් කමා නොකළේනම්, එවන් අකුසලකට සමාන දඬුවමද ප්‍රතිපල වශයෙන් ලබාදෙනු ලැබේ.

(මූලාශ්‍රය : බුහාරි හා නසාර්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

ඉස්ලාම්හි විශේෂ කරුණු හා අති විශේෂ කරුණු අන්තර්ගතව පවතී. මෙමගින් ඉස්ලාම්හි සමහර කරුණු තවත් සමහර කරුණුවලට වඩා විශේෂත්වයෙන් පවතින බව වටහා ගත හැක. මේ අනුව කෙනෙකුගේ ඉස්ලාම්හි ස්ථාවරය වැඩියෙන් හා අඩුවෙන් පවතී.

ඉස්ලාමය වෙළා ගැනීම එයට පෙර සිදුවූ පාපයන් විනාශ කරයි. එසේම තව්බා හෙවත් පාපොච්චාරණය කිරීම පෙර කළ පාපයන් විනාශ කරයි. කෙනෙකු කරන කුසල් ක්‍රියාවන් ඔහුගේ අකුසල් ක්‍රියාවන්ට ප්‍රතිකාරයක් වශයෙන් පවතී. නමුදු ඒවා අල්ලාහ් වෙනුවෙන් යනු පවිත්‍ර චේතනාවෙන් හා නබිනායක මුහම්මදු (සල්) තුමාව අනුගමනය කරමින් පවතීම කොන්දේසියෙකි.

අල්ලාහ් කුසලක් වෙනුවෙන් එවන් හත්සීය ගුණයක් දක්වා කුසලක්ද අකුසලක් වෙනුවෙන් එවන් අකුසලක් පමණක්ද ලබා දීමෙන් ඔහුගේ කරුණාව වටහාගත හැක. සමහරවිට අල්ලාහ් කෙනෙකුගේ අකුසල් ක්‍රියාවන් ඔහුගේ කුසල් ක්‍රියාවන්ට ප්‍රතිකාරයක් වශයෙන් පත් නොකොට ඒවාට ඔහු සමාව ලබා දෙයි.

නමුත්, මහා පාපයන් වෙනුවෙන් පාපොච්චාරණය කිරීම අනිවාර්යවේ. මන්දයත් මේ බව සඳහන් කරන වෙනත් නබි වදන් මෙය සනාථ කරයි. අවිශ්වාසීන්ගේ කුසල් ක්‍රියාවන් පිළිගනු නොලැබීම කවුරුත් දන්නා කරුණක්වන අතර, මෙයට මෙම නබිවදනද සාධක වශයෙන් පවතී. පොදුවෙන් පවසනලද මෙම නබිවදන හා මෙවන් නබිවදන් ස්ත්‍රීන්ටද බල පවත්වේ. මන්ද යත්, මිනිසා යන වචනයෙහි ස්ත්‍රී හා පිරිමින් සැම දෙනා අන්තර්ගත වේ.

14-ඉබ්නු මස්ඌද් (රලි) තුමා නබිවදනක් මෙසේ වාර්තා කරන්නේය.

පුද්ගලයෙක් නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් 'අල්ලාහ්ගේ දූතයාණෙනි, අඥාන කාලයෙහි අපි කළ දෙය වෙනුවෙන් දඬුවම් පණවනු ලැබේද ?' යනුවෙන් විමසීය. එකළ එතුමා 'කවරෙක් ඉස්ලාමය වැළඳගෙන කුසල් ක්‍රියාවන්හි යෙදෙන්නේද, අඥාන කාලයෙහි ඔහු කල ක්‍රියාවන් වෙනුවෙන් දඬුවම් කරනු නොලැබේ. කවරෙක් ඉස්ලාමය වෙළාගෙන අකුසල් ක්‍රියාවන්හි යෙදෙන්නේද, ඔහු පෙර හා පසු කළ පාපයන් සඳහාද දඬුවම් කරනු ලැබේ.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

ඉස්ලාමය වෙළා ගැනීම අඥාන කාලයෙහි කළ දේය කමා කරන බව පැහැදිලි කර ඇත. මෙවන් භාග්‍යයන් ලැබෙන්නේ කවරෙක් ඉස්ලාමය පිළිගෙන කුසල් ක්‍රියාවල යෙදෙමින් යුක්ති සහගතව කටයුතු කරන්නේද ඔහුටය. පාපයන් විනාශවීමට ඉස්ලාමය වෙළගැනීම පමණක් ප්‍රමාණවත් නොවන්නේය. නමුත්, ඒ වෙනුවට ඉස්ලාමය පිළිගෙන එය සත්‍ය කරමින් එකී කරුණු ස්ථිර භාවයෙන් ඉටු කළ යුතුයි.

ඉස්ලාමය වෙළා ගැනීමෙන් පසුද තම ආත්මයට අපරාධ කරන අය වෙත අඥාන කාලයේ ක්‍රියාවන් ඉතිරිව පවතී. පාපයෙහි යෙදීම දුර්භාග්‍ය කරුණක් වන අතර, පාපයන්හි අඛණ්ඩව යෙදීම අනතුරු දායක කරුණකි.

**15**-හකීම් බින් හිසාම් (රලි) තුමා නබි වදනක් මෙසේ වාර්තා කරන්නේය.

නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් 'අල්ලාහ්ගේ දූත යාණෙනි, මා අඥාන කාලයේ පින් කිරීම, වහලුන් නිදහස් කිරීම හා පවුල් ඥාතීන් විසන්ධි නොකර එක්ව හැසිරීම යනාදි කාර්ය වන්දනාමාන බව සිතමින් ඉටු කළෙමි. මේවා වෙනුවෙන් මාහට කුලිය ලැබේද ?' යැයි විමසුවෙමි. එකළ එතුමා 'ඔබ (ඉස්ලාමයට) පෙර කළ කුසල් ක්‍රියාවන්(ට අයත් ප්‍රතිඵල) සමගම ඔබ ඉස්ලාමය වෙළා ගත්තේය' යනුවෙන් පැවැසීය.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

පුද්ගලයෙකු ඉස්ලාමය වෙළා ගත්තේනම්, ඉස්ලාමයට පෙර ඔහු කළ කුසල් ක්‍රියාවන් සඳහා අල්ලාහ්ගේ කරුණාවක් වශයෙන් ඔහුට කුලිය සටහන් කරනු ලැබේ. නියත වශයෙන්ම, ඉස්ලාම් කුසල් ක්‍රියාවන් පරපූර්ණය කර, අකුසල් ක්‍රියාවන් විනාශ කරයි. යහපත් ප්‍රකාශයන් හා ක්‍රියාවන් තහවුරු කිරීම හා අයහපත් ප්‍රකාශයන් හා ක්‍රියාවන් විනාශ කිරීම සඳහා ඉස්ලාම් දහම පැමිණිය. නබිනායක මුහම්මදු (සල්) තුමා 'මම එවනු ලැබ ඇත්තේ සත් ගුණ ධර්මයන් පරිපූර්ණ කිරීම සඳහාය' යනුවෙන් පැවැසූ බව අබූ හුරෙරා (රලි) තුමා වාර්තා කරන්නේය.

(මූලාශ්‍රය : බයිහකී)

16–නබිනායක මුහම්මදු (සල්) ප්‍රකාශ කළ වදනක් අබූ හුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙක් කුමණ දෙය සමග ඉස්ලාමය වෙළා ගන්නේද, එය ඔහුටම හිමිවේ.

(මූලාශ්‍රය : බයිහකී)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

කවරෙක් තමගේ සතුව ඇති හිමිකම් වස්තු, ඉඩම් හා වෙනත් සම්පත් සමග ඉස්ලාමය වෙළා ගන්නේද, ඒවා ඔහුටම හිමිවේ. ඔහුට නොවන බව කරන තර්කය සනාථවන තෙක් ඔහුගේ තර්කය පිළිගත හැක. නියතව, අයිතිවාසිකම් රැක ගැනීම සඳහාද, නිවැරදි ගිවිසුම් හා පොරොන්දු වලංගු කිරීම සඳහාද ඉස්ලාමය පැමිණිය.

17-සග්‍ර් බින් අබ්ලා (රලි) තුමා නබි වදනක් මෙලෙස වාර්තා කරන්නේය.

ඉස්ලාම් දහම පැමිණ අවස්ථාවෙ බනූ සුලයිම් ගෝත්‍රයේ පිරිසක් තම ඉඩම අතහැර ගියහ. මා එය අර ගත්තෙමි. පසුව ඔවුන් ඉස්ලාමය වෙළාගත් විගස එම ඉඩම පිළිබඳව මා සමග තර්ක කරමින් මෙම ප්‍රශ්නය නබිනායක මුහම් මදු (සල්) තුමා වෙත ඔවුන් යොමු කළහ. එතුමා එම ඉඩම ඔවුන්ටම ලබාදී 'කවරෙක් ඉස්ලාමය වෙළා ගත්තේද, ඔහු ගේ ඉඩමට හා සම්පතට ඔහුම හිමිකාරයාය.

(මූලාශ්‍රය : අහ්මද්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

මිනිසුන් ඉස්ලාම් දහම වෙළා ගත්තේ නම්, ඔවුන්ගේ (පැරණි) සම්පත් හා වස්තුවලට ඔවුන්ම හිමිකරුවන් ලෙස පත්කරනු ලැබේ. ඒවා ඔවුන්ගෙන් උදුරාගත නොයුතුයි. ඉස්ලාමය වෙළා ගැනීමට පෙර කෙනෙකු කළ අයිතිවාසි කම් පිළිබඳ ගිවිසුම් ඉස්ලාම් නීතිරීතියට පටහැනි නොවන් නේනම්, එය වලංගුවේ. මිනිසුන්ගේ සම්පත්, චංචල දේපල හා නිවැස් යනාදීන් ඔවුන්ගේම බව තහවුරු කරනු ලැබේ. මක්නිසාද යත්, මුදල් හා චංචල දේපල යනාදීන් ඔවුන්ටම හිමිවේ.

# ඉස්ලාම්හි අනිවාර්ය කරුණු

18-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ඉබ්නු උමර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ඉස්ලාම් නමැති ගොඩනැගිල්ල කුළුනු පහක් මත ගොඩ නගා ඇත. ඒවා වන්දනාමානය කිරීමට සුදුසුම ස්වාමියා අල්ලාහ් හැර අන් කවරෙක් හෝ නැති බවත්, නබිනායක මුහම්මදු (සල්) තුමා අල්ලාහ්ගේ වහලෙකු හා දූතයෙකු බවත් සාක්ෂි දැරීම, සලාතය ඉටු කිරීම, සකාත් හෙවත් දුගී බද්ද ගෙවීම, හජ් කර්තව්‍යය ඉටු කිරීම හා රමලාන් උපවාස ශීලයෙහි යෙදීම යනාදීන්ය.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

ක්‍රියාවන් උසස් හා පහත් තත්වයෙන් පවතී. ඒවා අතර වැදගත් හා ඉතා වැදගත් කරුණු කීපයක් ඇත්තේය. රුකුන් හෙවත් කුළුනු, ෆර්ල් හෙවත් අනිවාර්ය කරුණු හා සුන්නත් හෙවත් කාලීන කරුණු යන කරුණු කීපයක්ද ඇත්තේය. ඉස්ලාම්හි කුළුනු පහකි. මීට අමතරව සමහරුන් වැඩිකර හා අඩුකර පවසති. කුසල් ක්‍රියාවන් ඊමාන්හි අන්තර්ගතවේ. නමුත් මුර්ජියියා නමැති පිරිස් මෙම මතය පිළි නොගනිති. අල්ලාහ් හා ඔහුගේ දූතවරයා කෙරෙහි සාක්ෂි දැරීමට පෙර ඒ ගැන කල්පනා කිරීම හෝ සාධක සෙවීම හෝ අනවශ්‍ය වේ.

කවරෙක් ඉස්ලාම්හි අනිවාර්ය කරුණු ඉටු කරන්නේද, ඔහු මුස්ලිම් වරයාය. ඔහු එය ප්‍රසිද්ධියෙන් ඉටු කළේනම්, ඔහු බාහිර වශයෙන් මුස්ලිම් වරයා බවට පත් වේ. ඔහු ඒවා විශ්වාස කර, ඉටු කළේනම්, ඔහු බාහිර හා අභ්‍යන්තර වශයෙන් මුස්ලිම් වරයා බවට පත් වේ.

සමහරවිට නබිනායක තුමා පැවැසූ වචනයෙන් තොරව එකී තේරුම සහගතව නබිවදන් වාර්තා කර ඇත. මන්ද යත්, සමහරුන් හජ් කර්තව්‍යය පෙරටද, උපවාස ශීලය පසුවටද සඳහන් කරති. නමුත්, (ඉස්ලාමිහි) ප්‍රථම කරුණු ෂහාදා හෙවත් ඒක දේවත්ව සාක්ෂි දැරීමකි. මෙම සාක්ෂි දැරීමෙන් තොරව එයට පසු පවතින කරුණු ඉටු කළේනම් ඒවා අවලංගු වේ.

# ඉස්ලාමිහි චිහ්නයන් හා සළකුණු

**19**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බවට අබූ හුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

නිසැකයෙන්ම, මාර්ගවලට සළකුණු කීපයක් පවතින සේම ඉස්ලාම් දහමටද සළකුණු කීපයක් ඇත්තේය. ඒවා අතර, අල්ලාහ්ව විශ්වාස කිරීම, ඔහුට කිසියම් ආදේශයක් නොකිරීම, සලාතය ඉටු කිරීම, සකාතය ගෙවීම, රමලාන් උපවාසයේ යෙදීම, හජ් කර්තව්‍යය ඉටු කිරීම, කුසල් ක්‍රියා වන්අණ කිරීම, අකුසල් ක්‍රියාවන් වැළකීම, නිවැස්තුල පිවිසෙන කළ නිවැසියන්ට සලාම් කීම හා එක් පිරිසක් පසු කර ගමන් කරන කළ ඔවුන්ට සලාම් කීම යනාදීන් අන්තර්ගත වේ.

කවරෙක් මේවායින් එකක් හෝ අතපසු කළේද, ඔහු ඉස්ලාමයේ කොටසක් අතපසු කළේය. කවරෙක් හෝ මේවා සියල්ල අතපසු කළේද, ඔහු ඉස්ලාමය මුළුමනින්ම ප්‍රතික්ෂේප කළේය.

(මූලාශ්‍රය : අස්සහීහා)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

මෙහි ඉස්ලාම්හි සමහර ගුණාංගයන් වර්ණනාකර ඇත. ඉස්ලාමයට සමහර බාහිර සළකුණු ඇත්තේය. එමගින් මුස් ලිම් වරයා කවරෙකු දැයි හැඳින්වනු ලැබේ. මෙයට සලාතය, උපවාසය, සකාතය හා මෙවන් කරුණු උදාහරණවේ. මුස්ලිම් හා මුස්ලිම් නොවන්නා වෙන්කර පෙන්වන බාහිර සළකුණු කීපයක්ද ඇත්තේය. ඉස්ලාම්හි පවතින උතුම්භාවය වෙනත් ආගම් අතර විශේෂත්වයෙන් පවතී. මෙය ඉස්ලාමටම අදාල විශේෂත්වයක් හා ශ්‍රේෂ්ඨත්වයකි.

**20**-නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අනස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙක් අපගේ සලාතය ඉටුකර, අපගේ (සලාතය ඉටු කළ යුතු කිබ්ලාව (දිශාව)ට මුහුණලා, අපි කැපූ දෙය අනු භව කරන්නේද, සැබෑ මුස්ලිම්වරයා ඔහුමය. ඔහු අල්ලාහ් ගේ හා ඔහුගේ දූතවරයාගේ වගකීමෙන් සිටී. එහෙයින්, (ඔබලා) අල්ලාහ්ගේ වගකීම කඩ නොකරන්න.

(මූලාශ්‍රය : මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

නියත වශයෙන්ම, සලාතය අතපසු කරන්නා මුස්ලිම් නොවන්නේය. ඔහුට අල්ලාහ්ගේ හා ඔහුගේ දූතවරයාගේ වගකීම්ද නොමැත. සත්‍ය වශයෙන්ම, ඉස්ලාම්හි බාහිර සළකුණ සලාතයකි. සලාතය හා කැපීම ඒකදේවත්වයෙහි සළකුණු බැවින් ඒවා දෙක එකට පවසා ඇත. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

*(ම : නබි,) නියතව, මාගේ සලාතය, මාගේ වන්දනාමානය, මම ජීවත්වීම හා මා නැසීයාම විශ්වයෙහි අධිපතියාවූ අල්ලාහ් වෙනුවෙන්ය යැයි ඔබ පවසන්න.*

*(අල්කුර්ආන්-6:162)*

*ඔබ ස්වාමියා වෙනුවෙන්ම වන්දනාමානය කරන්න, ඔහු වෙනුවෙන්ම කැපීම් කරන්න.*

*(අල්කුර්ආන්-108:2)*

මුෂ්රික්වරු (ආදේශකරුව)න් අධිකව යොමුවූ ෂිර්කය අල්ලාහ් හැර අන් දෙයට හිස නැමීම හා අල්ලාහ් හැර අන් දෙයට කැපීම් කිරීමකි. එහෙයින්, සලාතය හා කැපීම පිරිසිදු චේතනාවෙන් අල්ලාහ්ට පමණක් යොමු කළ යුතු බව පවසන ඒකදේවත්වය පැමිණිය. මුස්ලිම්වරයා සලාතය ඉටු කරන්නාට අයත් අල්ලාහ්ගේ වගකීමෙන් (සලාතය ඉටු නොකිරීම මගින්) ඉවත් නොවිය යුතුයි. කෙනෙකු මුස්ලිම් වරුන් සමග සලාතය ඉටු කළේනම්, ඔහු අල්ලාහ්ගේ වගකීම හැර ඔහුගේ වගකීම රැක ගනී. මිනිසුන්ගේ තත්වය පිළිබඳව තීරණය කිරීමට ඔවුන්ගේ බාහිර ක්‍රියාවන් හැර වෙනත් මිම්මක් නොමැත.

**21**-අබ්දුල්ලාහ් බින් අම්රු (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

පුද්ගලයෙක් නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් 'ඉස්ලාම්හි ගුණවත් කරුණු කුමක්ද ?' යනුවෙන් විමසීය. එයට නබිතුමා 'ඔබ ආහාර සැපයීම හා හඳුනන සහ නාඳුනන අයට සලාම් කීම' යනුවෙන් පැවැසීය

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

ඉස්ලාමිහි ක්‍රියාවන් අතර උස් පහත් තත්ත්වයක් පවතී. ආහාර සැපයීම උසස් ක්‍රියාවක් බැවින් ඒ සඳහා උනන්දු කර ඇත. ප්‍රශ්න කරන අවස්ථාව හා ප්‍රශ්න කරන පුද්ගලයා අනුව විවිධ අන්දමින් පිළිතුරු සැපයිය යුතුයි. හඳුනන අයට සලාම් කීම ආගම අනිවාර්ය කළ කරුණකි. පොදුවෙන් හඳුනන හා නාඳුනන අයට සලාම් කිව යුතුයි. කුසල් ක්‍රියාවන් හා සත් ගුණ ධර්මයන් ඉස්ලාම් දහමට අදාල කරුණුය. ස්වල්ප ක්‍රියාවන්ද පවිත්‍ර චේතනාවෙන් හා නිසියාකාරව ඉටු කිරීමෙන් ඒවා උතුම් තත්ත්වයෙන් පවතී. ප්‍රථමයෙන් සලාමය ආරම්භ කරන්නාට විශේෂත්වයක් ඇත.

**22**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවසූ බවට අබ්දුල්ලාහ් බින් අම්රු (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙකුගේ දිවෙන් හා අතින් අන් මුස්ලිම්වරුන් රැක වරණය ලබන්නේද, සැබෑ මුස්ලිම් වරයා ඔහුමය. එසේම, කවරෙක් අල්ලාහ් වළක්වා ඇති දෙයින් වැළකී සිටින්නේද, සැබෑ මුහාජිර්වරයා ඔහුමය.

(මූලාශ්‍රය : බුහාරි)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

කවරෙක් තම සහෝදර මුස්ලිම් වරයාට හිරහැර කිරීමෙන් වැළකී සිටින්නේද, සැබෑ මුස්ලිම් වරයා ඔහුමය. හිරිහැර කරන අවයන් අතර අත් හා දිව මුල් තැන ගනී. මුස්ලිම්වරයාට හිරහැර කිරීම මහා පාප ක්‍රියාවකි. හිරිහැර

කිරීමෙන් වැළකී සිටීම යහපත් ශීලීන්ගේ ක්‍රියාවකි. සැබෑ මුස්ලිම් වරයාගේ ඉස්ලාමය පාප ක්‍රියාවෙන් හා අකුසල් ක්‍රියාවෙන් ඔහුව වළක්වයි. තම සහෝදර මුසිලිම් වරුන් සමග සමගියෙන් කටයුතු කිරීම මුස්ලිම් වරයාගේ සත් ගුණාංගයකි.

කවරෙක් තහනම් හා වළක්වා ඇති කරුණු අතහැර, පාප කිරීමෙන්ද වැරදි කිරීමෙන්ද වෙනස්කම් කිරීමෙන්ද ඉවත්වී, එම පාපයන් කෙරෙහි පාපොච්චාරණය කර හා මෙවන් පාපයන්ගෙන් තමාව ආරක්ෂා කරගෙන සිටින්නේද සැබෑ මුහාජිර්වරයා ඔහුමය. නබිවදනෙහි සඳහන් පරිදි සැබෑ මුහාජිර් වරයාගේ යථාර්ථය මෙයමවේ.

# ඒකදේවත්වය කෙරෙහි අණ කිරීම

**23**–නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව හාරිස් අල් අෂ්අරී (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

නිසැකයෙන්ම, අල්ලාහ් සකරියා (අලෙ) තුමාගේ පුත් යහ්යා (අලෙ) තුමාට කරුණු පහක් ඉටුකරන ලෙසද, ඒවා ඉටුකරන මෙන් බණූ ඉශ්‍රායෙල් සමාජයන්ට අණකරන ලෙසද අණ කළේය. එතුමා මදක් ප්‍රමාදවූවිට නබි ඊසා (අලෙ) තුමා එතුමාගෙන් 'ඔබ කරුණු පහක් ඉටුකරන මෙන්ද ඒවා ඉටුකරන මෙන් බණූ ඉශ්‍රායෙල් සමාජයට අණ කරන මෙන්ද අණකර ඇත්තේය. ඒවා ඔබ ඔවුන්ට අණ කළ යුතුයි. නැතහොත් මම ඔවුන්ට අණකළ යුතුයි' යනුවෙන් කීය.

එකල යහ්යා නබිතුමා ඊසා නබිතුමා අමතා 'මාගේ සහෝදර, ඔබ මාව අභිබවා ගියේනම්, මා වේදනා ා කිරීම හෝ පොළොවෙහි එරීම හෝ කෙරෙහි මා බියට පත්වීමි' යනුවෙන් පවසා බයිතුල් මුකද්දස් දේවස්ථානය පිරෙන තෙක් බණු ඊශ්‍රායෙල්වරුන් එහි එක් රැස් කළේය. පසුව එතුමා උස් තැනක හිඳගෙන සිටිමින්, අල්ලාහ්ව ප්‍රශංසා හා ගුණ වර්ණනා කළේය. පසුව 'නියතව, අල්ලාහ් කරුණු පහක් කෙරෙහි මා ඉටුකරන මෙන්ද, ඒවා ඉටුකරන ලෙස ඔබලාට අණ කරන මෙන්ද මාහට අණ කළේය.

ඒවා අතර ප්‍රථම කරුණු 'ඔබලා අල්ලාහ්ට (පමණක්) වන්දනාමානය කරන්න. ඔහුට කිසිඳු දෙයක් හෝ ආදේශ නොකරන්න' යන්නේය. මෙයට උදාහරණය මෙසේය. පුද් ගලයෙක් රත්රන් හෝ රිදී වැනි තම පවිත්‍ර ධනයෙන් වහ ළෙක් මිළට ගත්තේය. ඔහු (ඔහු යටතේ) වැඩ කටයුතුවල නිරතවී, එමගින් ලැබෙන තම හාම්පුතාට අයත් ආදායම වෙනත් හාම්පුතෙකුට දීමට පටන් ගත්තේය.

ඔබලාගෙන් කවරෙක් හෝ තම වහළා මෙසේ හැසිරීම කෙරෙහි සතුටු වන්නේද ? සැබැවින්ම, ඔබලාව නිර්මාණය කළේද, ඔබලාට ආහාර පානයන් සපයන්නේද අල්ලාහ්ය. එනම්, ඔහුටම වන්දනාමානයන් ඉටු කරන්න. ඔහුට කිසි වක් හෝ ආදේශ නොකරන්න.

මම ඔබලාට සලාතය ඉටු කරන මෙන් අණ කරමි. නියතව, අල්ලාහ් තම වහළා හැරී නොබලා සිටින කල් තම මුහුණ ඔහුගේ මුහුණට මුහුණලා තබා සිටී. එනිසා, ඔබලා සලාතය ඉටු කළේනම්, වටපිටා හැරී නොබලන්න.

මා ඔබලාට උපවාස ශීලයේ යෙදෙන මෙන් අණ කරමි. මෙයට උදාහරණයක් මෙසේය. පුද්ගලයෙක් කස්තුරි පසුම්බියක් සමග මිනිසුන් අතර සිටින කළ එකී සුගන්ධය එහි සිටින සැම දෙනා අනුභව කරති. සැබැවින්ම, උපවාස යෙහි යෙදෙන්නාගේ මුඛයෙන් පිටවෙන ගන්ධය අල්ලාහ් වෙත කස්තුරියට වඩා සුගන්ධව පවතී.

මා ඔබලාට සාකාතය ගෙවන මෙන් අණ කරමි. මෙයට උදාහරණයක් මෙසේය. එක් පුද්ගලයෙකුව ඔහුගේ සතුරන් අත් අඩංගුවට ගෙන, ඔහුගේ දෑත සිය බෙල්ලෙහි බැඳ දමා ඔහුව ඝාතනය කිරීම සඳහා ගෙන ආහ. එකළ ඔහු ඔවුන් අමතා 'මා ඔබලාට කිසිවක් හෝ වන්දියක් ලබා දී මාව නිදහස්කර ගැනීමට හැකිද ?' යනුවෙන් විමසීය. පසුව (ඔවුන්ගේ කැමැත්ත පරිදි) විශාල වශයෙන් හා ස්වල්ප වශයෙන් ඔවුන්ට වන්දියක් ලබාදී ඔහු නිදහස්විය.

අල්ලාහ්ව අධික වශයෙන් සිහි කරන මෙන් මා ඔබලාට අණ කරමි. මෙයට උදාහරණය මෙසේය. පුද්ගලයෙකුව ඔහුගේ සතුරන් ඔහුව ලුහුබැඳමින් වේගයෙන් එළවාගෙන පැමිණෙති. ඔහු වහාම ආරක්ෂිත කොටුවක්තුල පිවිසී තමාව ආරක්ෂාකර ගත්තේය. කෙනෙකු අල්ලාහ්ව සිහි කරමින් සිටින කළ ඔහු ෂාතාන්ගේ උවදුරුවලින් අධිකව ආරක්ෂාවී සිටී.

නබිනායක මුහම්මදු (සල්) තුමා 'අල්ලාහ් මාහට අණ කළ කරුණු පහක් කෙරෙහි මා ඔබලාට අණ කරමි. ඒවා ඔබලා ජමාඅතයෙන් (සාමූහිකව) ජීවත්වන්න. එකී නායකයාගේ අණට සවන් දෙන්න. ඔහුට කීකරුවන්න. හිජ්රත්

කරන්න. අල්ලාහ්ගේ මාවතෙහි ජිහාද් කරන්න. මන්දයත්, කවරෙක් ජමාඅතය අතහැර වියත ප්‍රමාණයක් හෝ පිටත් වූයේද, ඔහු තමාගේ බෙල්ලෙන් ඉස්ලාමීය වළල්ල ඉවත්කර ගත්තේය. ඔහු නැවත ඉස්ලාමය තුල පිවිසිය යුතුයි.

කවරෙක් ජාහිලියියා හෙවත් අඥාන කාලයේ කියමන් මගින් අඬගසන්නේද, ඔහු අපාය ගොඩක කෙනෙකි' යනු වෙන් පැවැසූ කළ අපි 'අල්ලාහ්ගේ දූතයාණෙනි, ඔහු උප වාසයෙහි යෙද හා සලාතය ඉටු කළත්ද ?' යනුවෙන් විම සීමු. එවිට නබිතුමා 'ඔහු උපවාසයෙහි යෙදුනත්, සලතාය ඉටු කළත්, තමාව මුස්ලිම් වරයෙක් බව තර්ක කළත් (ඔහු නරකාදියෙහි සිටී). අල්ලාහ් මුස්ලිම් වරුන්ට නම්කර ඇති මුස්ලිම්, මුඃමින් හා අල්ලාහ්ගේ දාසයා යනාදි නම් වලින්ම ඔවුන්ව අඬගසන්න' යනුවෙන් පැවැසීය.

(මූලාශ්‍රය : අහ්මද් හා සහීහුල් ජාමිඋ)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

පැරණි වක්තෘවරුන් සහ පැරණි සමාජයන් පිළිබඳ කරුණුද මිනිසුන්ට ගුරුකමක් ලැබීම සඳහා සමහර ඓති හාසික කරුණුද සඳහන්කර ඇත. මිනිසා කුසල් ක්‍රියාවන් කෙරෙහි ප්‍රමාද නොකර සීඝ්‍රව ඉටු කිරීම අනිවාර්ය වේ. වක්තෘවරුන් තම ස්වාමියා පිළිබඳව අධික බියකමින් සිටි යහ. දැනුම් ඥානය ලබාදීම සඳහා මිනිසුන් එක්රැස් කළ යුතු අතර, කරන උපදෙස්හි ආරම්භයෙන් අල්ලාහ්ව ප්‍රශංසා කළ යුතුයි. කුසල් ක්‍රියාවන් අණකරන හා අකුසල් ක්‍රියාවන් වළක්වන අය ඒවා පලදායිකවීම සඳහා ඒවා තම ක්‍රියාවෙහි යෙදෙන්නෙකු ලෙස සිටිය යුතුයි.

ඒකදේවත්වය පිළිබඳ ඥානය අධ්‍යාපන ඥානයන් අතර ප්‍රථම ඥානයකි. මිනිස් හදවතෙහි ගැඹුරෙන් සටහන්වීම සඳහා ඔවුන් දැන සිටින හා වටහා ගැනීමට හැකි කරුණු මගින් උදාහරණ ලබාදී පැහැදිලි කළ යුතුයි. ෂිර්කය හෙවත් ආදේශ කිරීම මහා පාපයකි. සලාතය ඉටුකරන කළ හේතු වකින් තොරව හැරී බැලීම තහනම්ය. මෙසේ අධික වශයෙන් හැරී බැලීමෙන් සලාතය අවලංගු වෙ. ක්‍රියාවන්ට අදාල කුලිය එගේ වර්ගය අනුව ලබා දෙනු ලැබේ.

නිසැකයෙන්ම, උපවාසයෙහි යෙදෙන්නා තමාව ශ්‍රමයට පත්කර, එමගින් ඔහුගේ මුඛයේ ගන්ධය වෙනස්වන කළ එම ගන්ධය අල්ලාහ් වෙත කස්තුරියේ සුගන්ධය බවට පත්වෙ. සැබැවින්ම, සකාතය පාප බන්ධනාගාරයෙන් සිට මිනිසාව නිදහස් කරයි. මුස්ලිම් වරයාව සාතාන්ගේ උවදුරු වලින් ආරක්ෂා කරන ඉමහත් දෙය නම් එය දික්රුල්ලාහ් හෙවත් අල්ලාහ්ව යාඥා කිරීමවෙ. මුස්ලිම් ජමාඅතය (සමාජය) සමග එක්ව සිටීම හා එකී නායකයාට ඔහු පාපයන් කෙරෙහි අණ නොකරන තෙක් කීකරුවීම මුස්ලිම් වරයාට අනිවාර්යවෙ. එසේම, අඥාන කාලයේ කියමන් මගින් අඬ ගැසීම තහනම්ය. මේවා සියල්ල ඉස්ලාම් දහමට එරෙහි හා විරුද්ධ කරුණකි.

**24**–මුගයිරා බින් සඅද් (රලි) තුමා තම පියාගෙන් හෝ බාප්පාගෙන් ලැබූ වදනක් මෙසේ වාර්තා කරන්නේය.

ගර්කද් යන ස්ථානයේ නබිනායක මුහම්මදු (සල්) තුමා සිටි අවස්ථාවෙ මම එතුමාගේ ඔටුවාගේ කඩිවාලම අල්ලා ගත්තෙමි. වහාම මම එතුමාගෙන් සිට ඉවත් කරන ලදී.

එකල එතුමා 'ඔහුව අත හරින්න. ඔහු කිසියම් අවශ්‍යතාව යක් මත පැමිණිය' යනුවෙන් පැවැසීය. එවිට මා 'ස්වර්ගය කරා මාව ලඟා කරන හා නරකාදියෙන් මාව දුරස්කරන ක්‍රියාවක් ගැන මාහට දැනුම් දෙන්න' යනුවෙන් විමසීමි. එකල නබිතුමා තම හිස අහස දෙසට ඔසවා 'ඔබ කෙටි යෙන් විමසා ඇත්තේනම්, ඔබට හොඳය. ඔබ දීර්ග කළේය. ඔබ අල්ලාහ්ට (පමණක්) වන්දනාමානය කරන්න. ඔහුට කිසිවක් හෝ ආදේශ නොකරන්න. සලාතය ඉටු කරන්න. සකාතය ගෙවන්න. හජ් කර්තව්‍යය ඉටු කරන්න. රමලාන් උපවාසයෙහි යෙදෙන්න. මිනිසුන් ඔබ සමග කෙසේ හැසි රිය යුතු බව ඔබ සිතන්නේද, එසේම ඔබද ඔවුන් සමග හැසිරෙන්න. ඔබ මිනිසුන්ගෙන් කුමන දේ ප්‍රිය කරන්නේද, එයම ඔබද ඔවුන්ට ප්‍රිය කරන්න. ඔබ කෙරෙහි කුමණ දේ අප්‍රිය කරන්නේද, එය මිනිසුන්ගෙන් වළක්වන්න' යනුවෙන් පවසා 'ඔටුවාගේ කඩිවාලම අත් හරින්න' යැයි පැවැසීය.

(මූලාශ්‍රය : අහ්මද්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

කුසල් ක්‍රියාවන් ඊමානයෙහි අන්තර්ගතවෙ. ඒකදේවත් වයට පසු ක්‍රියාවන් අතර උතුම්වූ ක්‍රියාව සලාතයකි. අනි වාර්ය නොකළ ක්‍රියාවන් කාලීන ක්‍රියාවන්ය. ඒවා අනිවාර්ය නොවෙ. සත් ගුණධර්මයන්ද ඊමානයේ කොටසකි. මිනිසුන් අතර යහකමෙන් හැසිරීම උතුම් ක්‍රියාවකි. උපදෙස් කරන කළ කෙටියෙන් කළයුතු අතර, ශ්‍රේෂ්ඨ කරුණුවලට වැද ගත්කමක් ලබා දිය යුතුයි. නියතව, ආගම යනු විශ්වාස කිරීම, ප්‍රකාශ කිරීම හා ක්‍රියාවෙහි යෙදවීමකි.

# ඒකදේවත්වයේ විශේෂත්වය

**25**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව උබාදා බින් සාමිත් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

වන්දනාමානය කිරීමට සුදුසු ස්වාමියා අල්ලාහ් හැර අන් කිසිවෙක් නොමැති බවත්, නබිනායක මුහම්මදු (සල්) තුමා අල්ලාහ්ගේ වහළා හා දූතයා බවත්, නබි ඊසා (අලෛ) තුමා අල්ලාහ්ගේ වහළා, දූතයා හා අල්ලාහ් මර්යම් තුමිය වෙත යොමුකළ ආඥාව සහ ඔහුගේ ප්‍රාණය බවත්, ස්වර්ගය හා නරකාදිය සත්‍ය බවත් කවරෙක් තිරසාරව විශ්වාසකර ඒ අනුව ක්‍රියා කරන්නේද, ඔහුව අල්ලාහ් ඔහුගේ ක්‍රියාවන් වෙනුවෙන් ස්වර්ගයට ප්‍රවිශ්ට කරයි.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

පවිත්‍ර ඒකදේවත්වයට අවශ්‍ය කරුණු කීපයක් සඳහන් කර ඇත. නබි ඊසා (අලෛ) තුමා අල්ලාහ්ගේ වහළා හා දූතයා බව විශ්වාස කිරීම මෙයට උදාහරණයකි. මන්දයත්, ත්‍රිත්ව ප්‍රතිපත්තිය අනුගමනය කරන්නන් මෙම ශ්‍රේෂ්ඨමත් කරුණෙහි අල්ලාහ්ව ප්‍රතික්ෂේප කළහ. නබි ඊසා (අලෛ) තුමාව අල්ලාහ් තමාගේ ආඥාවෙන් නිර්මානය කිරීම, එම ආඥාව මර්යම් වෙත යොමු කිරීම හා ඊසා (අලෛ) තුමා අල්ලාහ්ගෙන් සිට පැමිණි ප්‍රාණයක් වීම යනාදීන් විශ්වාස කිරීම පවිත්‍ර ඒකදේවත්වයට අවශ්‍යවන කරුණුය. දාසයෙක් මේවා විශ්වාස කළේනම්, ඔහු කුරුස් වාදීන්ගෙන් ඈත්වී සැක රහිත සත්‍යභාවය පිළිගත් අයෙක් ලෙසට පත්වේ.

ස්වර්ගය, නරකාදිය හා නැවත පණ පොවා නැගිටීම පිළිබඳව විශ්වාස කිරීමද ඒක දේවත්වයට අවශ්‍යවන කරුණකි. කවරෙක් මෙම විශ්වාසය කෙරෙහි ක්‍රියා කරන්නේද, ඔහු පාප ක්‍රියාවන් කර ඇතත් ඔහු (කළ පාපයට අදාල දඬුවම ලැබීමෙන් පසු) ස්වර්ගයට පිවිසේ. ඔහුගේ නිත්‍ය ලැගුම් ස්ථානය භාග්‍යයෙන් පිරී පවතින ස්වර්ගයකි. ස්වර් ගයට දොරටු අටක් ඇති බව වෙනත් නබිනායක තුමාගේ වදනක වාර්තාවෙ.

**26**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අනස් බින් මාලික් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙක් අල්ලාහ්ට කිසිඳු ආදේශයක් නොකළ ස්ථාවර යෙන් අල්ලාහ්ව බැහැ දකින්නේද, ඔහු ස්වර්ගයට පිවිසේ.
(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

මෙම නබි වදනෙහි තේරුම පෙර සඳහන් කර ඇත. දාසයෙක් පවිත්‍ර හදවතින් හා නිවැරදි ආගමෙන් අල්ලාහ්ව බැහැ දැකීම සඳහා ඔහු තම ප්‍රතිපත්තිය නිවැරදිකර ගැනීමටද, ෂිර්කය මිශ්‍රනය වීමෙන් හා මිථ්‍යාමතික අපවිත්‍රයෙන් සිය ඒකදේවත්වය පවිත්‍රකර ගැනීමටද දැඩි ලෙස වෙහෙස දැරිය යුතුයි. මක්නිසාදයත්, නියතව අල්ලාහ් ඔහුට ආදේශ කරන සැම දෙනාට ස්වර්ගය තහනම්කර ඇත.

# පාපකාර ඒකදේව වාදීන්ට අපාය නිත්‍ය නොවීම

**27**-නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බවට අබූ සර්ද් අල්කුද්රී (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ස්වර්ග වාසීන් ස්වර්ගයටද අපාය වාසීන් අපායටද පිවි සෙති. පසුව අල්ලාහ් 'කවරෙකුගේ හදවතෙහි අබ ඇට ප්‍රමාණයෙන් විශ්වාසය පවතින්නේද, ඔවුන් (අපායෙන් සිට) පිටමත් කරන්න' යනුවෙන් පවසයි. (ඒ අනුව) ඔවුන් අපා යෙන් පිටමත් කරනු ලැබේ. එකළ ඔවුහු (අපායේ ගින්නට) දැවී රොස්වී සිටිති. පසුව ඔවුන් හයාත් නමැති ගංගාවෙහි ගිල්වනු ලැබේ. එමගින් ඔවුහු ගලා යන ගංගාවක අසල පිහිටි ගොඩබිමක බීජයන් අළුදමා සරුවන සේ සරුවන්ව සිටිති. ඒවා නැමී කහ පැහැයෙන් තිබීම ඔබ නොදුටුවෙද?
(මූලාශ්‍රය : බුහාරි)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

මිනිසුන් අතර ඔවුන්ගේ විශ්වාසය උස් හා පහත් තත්ත් වයෙන් පවතී. පාපකාර විශ්වාසීන් නිරන්තරව නරකාදියෙහි නොසිටිති. මුස්ලිම්වරයා තමාගේ පාප ක්‍රියාවන් වෙනුවෙන් අපායට පිවිසේ. කුසල් ක්‍රියාවන් විශ්වාසයට අයත් එකකි. විශ්වාසය සමහරවිට අධිකවේ. සමහරවිට අඩුවේ. මිනිසා තමාගේ කිසියම් කුසලක් හෝ ස්වල්ප වශයෙන් සැළකිය නොයුතුයි.

මෙහි මිනිස් හැඟීමෙන් වටහා ගත හැකි කරුණු මගින් අර්ථ විවරණයකර ඇත. නියතව, පරලොවෙහි මිනිසුන්ගේ ක්‍රියාවන් කිරෙනු ලැබේ. කරුණක් ඉදිරිපත් කරන කළ මිනිසුන් දැන සිටින උදාහරණ මගින් ඉදිපත් කළ යුතුයි. මෙහි නරකාදියෙහි දඬුවම කෲරයෙන් පවතින බව සඳහන් වෙ. ස්වල්ප කුසල් ක්‍රියාවන් හේතුකොට සමහරුන් නර කාදියෙන් පිටමන් කිරීම අල්ලාහ් තම දාසයන් කෙරෙහි දක්වන කරුණාවෙහි අති විශාලත්වයකි.

**28**-නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අනස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ලාඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් ප්‍රකාශ කරන යමෙකු ගේ සිතෙහි තිරිඟු පිටි ප්‍රමාණයක කුසල් තිබෙන්නේද ඔහුද, ලාඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් ප්‍රකාශ කරන තවත් කෙනෙකුගේ සිතෙහි තිරිඟු ඇට ප්‍රමාණයක කුසල් තිබෙන් නේද ඔහුද, ලාඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් ප්‍රකාශ කරන තවත් කෙනෙකුගේ සිතෙහි පරමාණුව ප්‍රමාණයක කුසල් තිබෙන්නේද ඔහුද, අපායෙන් නිදහස්වෙති.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබී වදනෙහි අන්තර්ගත කරුණු

පාප ක්‍රියාවන්හි යෙදුනු ඒකදේවවාදීන් අපායෙන් සිට පිටත්වෙති. නමුත් මහා පාප ක්‍රියාවල යෙදුනු අය නරකාදි යෙහි වේදනා කරනු ලැබේ. මුර්ජියියා නැමැති පිරිසගේ මතය මෙයට වෙනස්ය. මහා පාපයෙහි යෙදු අයද (ඒ සඳහා දඬුවම් ලැබීමෙන් පසු) අපායෙන් සිට පිටමන් වෙති. කාරි ජියියා නමැති පිරිසගේ මතය මෙයට වෙනස්ය.

නබිනායක මුහම්මදු (සල්) තුමා ‘ලාඉලාහ ඉල්ලල්ලාහ්’ යන ප්‍රකාශය සමග ‘සිතෙහි තිරිඟු පිටි ප්‍රමාණයක කුසල් තිබෙන කළ’ යන (හදවතෙහි පවතින) විශ්වාසය (කුසල) එකට එකතු කළ ආකාරය අනුව ඊමානය යනු ප්‍රකාශය හා විශ්වාසය අන්තර්ගත එකකි.

මිනිසුන් වටහා ගැනීම සඳහා ඔවුන්ට භාගවත කරුණු මගින් පැහැදිලි කළ යුතුයි. නියතවශයෙන්ම, අල්ලාහ් දාස යෙකුට ඔහුගේ කිසියම් කුසලක් හෝ විනාශ නොකරයි. ඊමානය සමහරවිට අධික වෙ. තවත් සමහරවිට අඩුවෙ.

# ආදේශ කිරීම පිළිබඳ අවවාදය

අල්ලාහ් මෙසේ පවසන්නේය.

*නියත වශයෙන්ම, අල්ලාහ් තමාට ආදේශ කිරීමට සමාව නොදෙන්නේය. මෙය හැර (වෙනත්) සියල්ල සඳහා තමා කැමැති අයට සමාව ලබා දෙන්නේය. කවරෙක් අල්ලාහ්ට ආදේශ කරන්නේද, නියත වශයෙන්ම, ඔහු මහා පාපයක් බොරුවට කාල්පනිකව ගොතන්නේය.*

*(අල්කුර්ආන්-4:48)*

*තවද, (ඕ : නබි) ‘ඔබ (ස්වාමියාට) ෂිර්ක් (ආදේශ) කිරී මෙහි යෙදෙන්නේ නම්, ඔබගේ ක්‍රියාවන් සියල්ල විනාශ වේ. ඔබ අලාභ කරුවන්ගෙන් කෙනෙකු ලෙසට පත් වේ’ යනුවෙන් ඔබටත් ඔබට පෙර සිටි අයටත් වහී (දේව පණි වුඩ) මගින් පවසන ලදී.*

*(අල්කුර්ආන්-39:65)*

*කවරෙක් අල්ලාහ්ට ආදේශ කරන්නේද, නිසැකයෙන්ම, අල්ලාහ් ඔහුට ස්වර්ගය තහනම් කරයි. තවද ඔහුගේ ලැගුම් ස්ථානය අපායකි. මෙවන් අක්‍රමකරුවන්ට උපකාර කරන්නන් කිසිවෙක් නොමැත.*

*(අල්කුර්ආන්-5:72)*

*කවරෙක් අල්ලාහ්ට ආදේශ කරන්නේද, ඔහු අහසෙන් සිට (මූණින් තලා වී) වැටුනු අයෙකු ලෙසට පත්වේ. පසුව, ඔහුව පසමීන් පැහැරගෙන ගිය මෙන් හෝ සුළඟ ඔහුව ඔසවාගෙන ගොස් දුරස්තර අගාධයෙහි විසිකළ මෙන් හෝ පත්වේ.*

*(අල්කුර්ආන්-22:31)*

**29**-අබූහුරෛරා (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

නබිනායක මුහම්මදු (සල්) තුමා 'විනාශය ගෙනදෙන මහා පාපයන් හතක් කෙරෙහි ඔබලා වැළකී සිටින්න' යනුවෙන් පැවැසූ කළ, (එතුමාගේ ශ්‍රවකවරුන්) 'අල්ලාහ්ගේ දූතයාණෙනි, ඒවා කුමක්ද ?' යනුවෙන් විමසූහ. එයට නබි තුමා '(ඒවා) අල්ලාහ්ට ආදේශ කිරීම, හූනියම් කිරීම, හේතු වෙන් තොරව අයුක්ති සහගතව ප්‍රාණයක් ඝාතනය කිරීම, අනාථයන්ගේ ධනය අනුභව කිරීම, පොළිය අනුභව කිරීම, යුධ පිටියෙන් පළා යාම හා විශ්වාසනීය අසරණ පතිව්‍රතා ස්ත්‍රීන්ට දොස් පද කීම' යනුවෙන් ප්‍රකාශ කළේය.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

පාපයන් උස් පහත් තත්ත්වයෙන් පවතී. ඒවා අතර සම හර පාප ක්‍රියාවන් ඒවාහි යෙදුන අයට විනාශය ගෙන දෙයි.

(අල්ලාහ්ට) ආදේශ කිරීම මහා පාපයෙකි. මන්දයත්, එය අල්ලාහ්ගේ දිව්‍යමය භාවයෙහි කලංකයක් ඇති කිරීම, ඔහු ගේ ආගමෙහි වැරදි සහගතව හැසිරීම හා ඔහුව ප්‍රතික් ෂේප කිරීමකි. සැඟව පවතින ඥානයන් තමා දැන සිටින බවට තර්ක කිරීම හා මිනිසුන්ට හිරහැර කිරීම හූනියම් කිරීමෙහි අන්තර්ගතවන බැවින් එය මහා පාපයක් ලෙස පවතී.

අහිංසක මුස්ලිම් වරයෙකුව ඝාතනය කිරීමෙන් ඔහුගේ රුධිරය පිටත් කිරීම, ප්‍රාණය විනාශ කිරීම, මෙලොවෙහි ජීවත්වීමට අයත් මූලික පදනම නැති කිරීම යනාදිය සිදුවන බැවින් එයද මහ පාපයකි. නමුත්, ආගමානුකූල හේතුවක් මත පවතින පළිගැනීම හා මෙවන් වෙනත් දඬුවමක් පමු ණුවීම නීතියෙන් පිටින් ලැබෙන අවසරයකි. මන්ද, මෙම දඬුවම් අල්ලාහ්ගෙන් සිට පැමිණ ආඥාවක් වන අතර, ෂරී අතය හෙවත් ඉස්ලාමීය නීති පද්ධතිය වටහාදෙන නීතියකි. තමා විසින් තම ධනය රැක ගැනීමට නොහැකි අසරණ අනාථයන්ගේ ධනය හා සම්පත් අනිසි ලෙස අනුභව කිරී මද මහා පාපයකි.

එසේම, පොළිය අනුභව කිරීමද මහා පාපයෙකි. මෙය අල්ලාහ් හා සමග සටන් කිරීමක් හා ධනයෙන් ඔහුගේ සීමාවන් ඉක්මවා යාමකි. සතුරන් මුහුණට මුහුණලා සටන් කිරීම අතපසු කර පලා යාමද මහා පාපයෙකි. මෙමගින් මෙම ආගමට හා මෙම ආගම පිළිපදින්නට නින්දාවක් ඇති වන අතර, සතුරන් (කාෆිර්වරුන්)ට ශක්තියක්ද විශ්වාසීන් හට බෙලහීන කමක්ද ඇති වන්නේය.

එමෙන්ම, තමාගේ කන්‍යාභාවය රැකගෙන තම රහස් ප්‍රදේශ ආරක්ෂාකර සිටින විශ්වාසනීය ස්ත්‍රීන්ට දොස්පද කීමද මහා පාපයකි. එවන් ස්ත්‍රීන් පාපයට තුඩුදෙන කාරණාවන් ගැනද, එයට රැකුල් දීම ගැනද හා එකී මාර්ගයන් ගැනද නොදැන සිටින අතර, මෙවන් සෑම දෙයින් වැළකී සිටින්නන්ය. මෙහි මහා පාපයන් හතක් පමණක් සඳහන් කළ ඇත්තේ ඒවා පාපයන්ගේ මූලිකයන් හා මහා පාපයන් වශයෙන් පවතින බැවිනි. සමහර විද්වතුන් හතට වඩා අධිකව සඳහන් කර ඇත්තේය.

**30**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබූ හුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

අල්ලාහ් 'කවරෙක් හෝ කිසියම් කාර්යයෙහි යෙදී සිට එහි මා හැර අන් දෙයක් මා සමග ආදේශ කරන්නේද, මා ඔහුව හා ඔහු සමාන කළ දෙය (එසේම) අත් හරිමි.

(මූලාශ්‍රය : ග්‍රන්ථය : මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

ආදේශ කරන්නාගේ ක්‍රියාවන් කිසිවක් හෝ පිළිගනු නොලැබේ. ඇඳහීම්වලට පවිත්‍ර චේතනාව අනිවාර්ය වේ. මිනිසුන්ට පෙන්නුම් කිරීම සඳහා ක්‍රියාවක යෙදීම ආදේශ කිරීමකි. පුද්ගලයෙක් අන් අය දැකීම හා ප්‍රශංසා කිරීම සඳහා ක්‍රියාවක යෙදෙන්නේනම්, එය (පිළි නොගෙන) ඔහු වෙතම හරවා එවනු ලැබේ. මිනිසුන්ට පෙන්නුම් කිරීම සඳහා කරන ක්‍රියාවන් අතර සමහරයන් පිළිගැනීමක් වශයෙන් හෝ තවත් සමහරයන් ප්‍රතික්ෂේප කිරීමක් වශයෙන් හෝ නොපවතී. ඒවා සියල්ල ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පුද්ගලයෙක් ක්‍රියාවක යෙදෙනවිට ඔහු අල්ලාහ්ව පමණක් සිහාගත යුතු අතර, ඔහු ආදේශ කිරීමෙන් සිය සිතුවිල්ල ආරක්ෂාකර ගත යුතුයි.

**31**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබූ දර්දාඋ (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

අල්ලාහ් සෑම පාපයන් සඳහාම සමාව ලබා දෙන්නේය. නමුදු, මුෂ්රික් (ආදේශ කරුවෙක්) ලෙස නැසී ගිය පුද්ගල යාට හෝ ඕනෑකමින් විශ්වාස වන්තයෙකුව ඝාතනය කළ විශ්වාසියාට හෝ ඔහු සමාව ලබා නොදෙන්නේය.
(මූලාශ්‍රය : අබූදාවූද් හා ඉබ්නු හිබ්බාන්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

නිශ්චය වශයෙන්ම, අල්ලාහ් ඔහුට ආදේශ කරන්නාට සමාව නොදෙන්නේය. ඔහුගේ ක්‍රියාවන් පිළිගනු නොලබන අතර, ඔහු කළ කුසල් ක්‍රියාවන් ඔහුට කිසියම් පලක් හෝ ලබා නොදෙන්නේය. මිනිසා කළ මහා පාප ක්‍රියාවන් පිළි බඳව ඔහු පාපොච්චාරණය නොකළේනම්, ඒවා අල්ලාහ්ගේ කැමැත්තෙහි පවතී. ඔහු කැමැතිනම්, කමා කරයි. නැත හොත් වෙදනා කරයි.

නියතව, විශ්වාසියෙකුව ඕනෑකමින් ඝාතනය කිරීම නර කාදියෙහි ඔහුගේ ස්ථිරභාවය තහවුරු කරයි. ඕනෑකමින් ඝාතනය කිරීම අනුමත කරමින් ඝාතනය කළ අයට ස්ථිර අපාය බව සමහරුන් පවසති.

**32**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබූ දර්දාඋ (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ඔබ කැබැලි වශයෙන් කපන ලද්දේද, ගින්නෙහි දවන ලද්දේද අල්ලාහ්ට කිසිවක් හෝ ආදේශ නොකරන්න. අනිවාර්යවූ සලාතයන් ඕනෑකමින් අතපසු නොකරන්න. කවරෙක් එය ඕනෑකමින් අතපසු කරන්නේද, ඔහුගෙන් සිට අල්ලාහ්ගේ වගකීම ඉවත්වේ. (එබැවින්) මත්පැන් පානය නොකරන්න. මන්දයත්, එය පාපයන් සැමට යතුරකි.

(මූලාශ්‍රය : ඉබ්නු මාජා)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

කුමණ අවස්ථාවක හෝ මිනිසා ඒකදේවත්වයෙන් පෙරලීම තහනම්ය. ඔහුගේ හදවත සැම විටම ඊමානය ගැන සැනසුම් භාවයෙන් සිටිය යුතුයි. කුෆ්රය තෘප්ති භාවයෙන් පිළිගැනීම ඔහුට තහනම්ය. නමුත්, වේදනාව දරා ගැනීමට නොහැකිවූ කළ එම වේදනාවෙන් මිදීමට අවශ්‍ය ප්‍රමාණය පමණක් කුෆ්රය ඇති කරන වචන පවාද දිවෙන් ප්‍රකාශ කළ හැක.

සලාතය අතපසු කරන්නා ප්‍රතික්ෂේප කරන්නාට සමාන වන්නයෙකු බවට පත්වන අතර, ඔහු අල්ලාහ්ගේ ආගම පිට පැත්තට වීසිකළ අයෙකු ලෙසද පත්වේ. ලොවෙහි සිදුවන පාපයන් සැමට මත්පැන් පදනමකි. මන්ද, මත්පැන් පානය කරන්නාගේ බුද්ධිය මුළාවට පත් වේ. පසුව ඔහු සැම පාපයන් හා අකුසල් ක්‍රියාවන්හි යෙදෙයි.

# උමරයෙහි විශේෂත්වය

**33**-උමර් බින් කත්තාබ් (රලි) තුමා නබි වදනක් මෙසේ වාර්තා කරන්නේය.

ක්හයිබර් යුද්ධය පැවැත්වූ දින නබිතුමාගේ ශ්‍රාවකරු වන් පිරිසක් පැමිණ 'මෙම පුද්ගලයා ෂහීද් (දිවි පුදන්නා)ය. මෙම පුද්ගලයා ෂහීද් (දිවි පුදන්නා)ය. යැයි කියා ගෙනම ගියහ. පසුව ඔවුන් එක් පුද්ගලයෙකුව පසුකර යාමෙන් පසු 'ඔහුද ෂහීද් (දිවි පුදන්නා)ය' යනුවෙන් පැවැසූහ. වහාම නබිනායක මුහම්මදු (සල්) තුමා 'එසේ නොව, මම ඔහුව නරකාදියෙහි ඔහු වංචා කළ ඇඳුමක් සමග දුටුවමි' යනු වෙන් පැවැසීය. පසුව නබිතුමා 'කත්තාබ්ගේ පුත්‍ර, ඔබ මිනි සුන් අතර ගොස් "විශ්වාස වන්තයින් හැර අන් කවරෙක් හෝ ස්වර්ගයට පිවිසීමට නොහැක" යැයි ඔහුන්ට දැනුම් දෙන්න' යනුවෙන් පැවැසීය. (ඒ අනුව) මා මිනිසුන් අතර ගොස් 'දැන ගන්න විශ්වාස වන්තයින් හැර අන් කවරෙක් හෝ ස්වර්ගයට පිවිසීමට නොහැක' යැයි දැනුම් දුන්නෙමි.

(මූලාශ්‍රය : මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

මෙම වැදගත් දැනුම් දීම මගින් උමර් (රලි) තුමාගේ විශේෂත්වය සනාථවෙ. මිනිසුන්ට පලදායික වන්නේ නම්, වගකීමෙන් නිදහස්වීම වෙනුවෙන්ද, (මිනිසුන් එරෙහිවීමට නොහැකි තරමට) සාධක සනාථ කිරීම සඳහාද මිනිසුන් ගෙන් අඥානකම ඉවත් කිරීම සඳහාද ප්‍රයෝජනවත් ඥානය පිළිබඳව ප්‍රසිද්ධියෙන් දැනුම් දීම අනිවාර්ය වෙ. ආගමික

විද්වතෙක් ප්‍රථමයෙන් මූලික දැනුම හා වැදගත් කරුණු වටහා දිය යුතුයි.

**34**-අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් ශ්‍රේෂ්ඨමත් ක්‍රියාව කුමක්ද ? යනුවෙන් විමසන ලදී. එයට එතුමා 'අල්ලාහ්ව හා ඔහුගේ දූතයාව විශ්වාස කිරීමකි' යනුවෙන් පැවැසීය. පසුව කුමක්ද ? යනුවෙන් විමසූ කළ එතුමා 'අල්ලාහ්ගේ මාවතෙහි ජිහාද් කිරීමකි' යැයි පැවැසීය. පසුව කුමක්ද ? යනුවෙන් විමසූ කළ එතුමා 'පිළිගත් හජ් කර්තව්‍යයෙකි' යනුවෙන් පැවැසීය.

(මූලාශ්‍රය : බුහාරි)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

ඊමානය එකී වර්ගයෙහි උස් පහත් තත්ත්වයෙන් පවතී. විශ්වාසීන්ගේ ක්‍රියාවන් අතරද උස් පහත් තත්ත්වය පවතින්නේය. මුර්ජියියා යනු පිරිස ඊමානයෙන් ක්‍රියාවන් ඉවත් කළ බැවින් ඔවුන් මෙහි පොළා දැක ඇත. ප්‍රශ්න කරන්නන්ගේ විවිධත්වය අනුව පිළිතුරුද විවිධත්වයෙන් පවතී. අල්ලාහ්ව හා ඔහුගේ දූතයාව විශ්වාස කිරීමෙන් පසු හැර කිසියම් ක්‍රියාවක් හෝ පිළිගනු නොලැබේ. අල්ලාහ්ගේ මාවතයෙහි ජිහාද් කිරීම උතුම් ක්‍රියාවක්වන අතර, අල්ලාහ් කරා ලංගාවීමටද අයත් උතුම් මාර්ගයෙකි. ක්‍රියාවන් අතර ශ්‍රේෂ්ඨමත් ක්‍රියාව පාපයන් මිශ්‍රණය නොවූ හජ් කර්තව්‍යයකි. ආගමික විද්වතුන්ගෙන් (ඔවුන් අප්‍රියවන තරම්) අධික වශයෙන් තොරව දැනුම් ඥානය පිළිබඳව නැවත නැවත විමසිය යුතුයි.

# ඊමානයේ ගුණාංග හා සළකුණු

අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔබලාගේ මුහුණු නැගෙනහිර හෝ බස්නාහිර දෙසට හැරවීමෙන් (පමණක්) යහකම් කළ බවට නොසැලකේ. නමුදු, යහකම් (අල්බිර්) වන්නයා කවරෙකු නම්, අල්ලාහ් ගැනද, අවසාන දිනය ගැනද, දේව දූතයන් ගැනද, දේව ග්‍රන්ථයන් ගැනද වක්තෘවරුන් ගැනද විශ්වාස කරන්නන්ය. (තවද) තමාගේ ධනය ප්‍රියභාවයෙන් සිය පවුල් ඥාතීන්ටද, අනාථයන්ටද, දිළින්දන්ටද, මගීන්ටද, සිගන්නන්ටද හා වහලුන් නිදහස් කිරීමටද ලබා දෙන්නන්ය. (එසේම) සලාතය (නිසි පරිදි) ඉටුකර, සකාතය ගෙවා, පොරොන්දුවක් ලබා දුන්නේ නම්, එය (නිසි ලෙස) ඉටුකර, (සාගතයෙන් ඇති වන) අසීරුථාවෙහිද, (රෝගය වැනි) දුෂ්කරථාවෙහිද සහ යුද්ධය කරන අවස්ථාවෙහිද ඉවසීමෙන් සිටින්නන්ය. සැබෑ සත්‍ය වන්නයින් ඔවුන්මය. තවද, සැබෑ බිය භක්තිකයින්ද ඔවුන්මය.*

*(අල්කුර්ආන්-2:177)*

*නියතවශයෙන්ම, විශ්වාසවන්තයින් ජයග්‍රහණය කළහ. ඔවුහු කවුරුන් නම්, ඔවුන් තම සලාතයෙහි නිශ්කලංක යෙන් සිටිති. අනවශ්‍ය දෙයින් වැළකී සිටිති. සකාතය (නිසි ලෙස) ගෙවති. තම රහස් පෙදෙස ආරක්ෂාකර ගනිති. එනමුත්, තම බිරියන් හෝ තම දකුණු අත හිමිකරගත් (වහලු) ස්ත්‍රීන් හැර. (ඔවුන් හා සමග ආශ්වාදයෙහි යෙදීමෙන්) ඔවුහු සැබැවින්ම, නින්දාවට නොලක්වෙති. නමුත්, කවරෙක් මෙයටත් අමතරව (වෙනත් මාර්ග) සොයන්නේද,*

ඔවුහු සීමා ඉක්මවා යන්නන්ය. තවද, ඔවුහු තමන් වෙත (විශ්වාසය සඳහා) භාර කරනලද දේ හා තමන් ලබා දුන් පොරොන්දු රැකවලදී ආරක්‍ෂා කරති. එසේම, ඔවුහු තම සලාතයන් නිසි පරිදි රැකවලදී ඉටු කරති. ෆිර්දවුස් නැමැති ස්වර්ගය ලබා ගන්නා හිමිකරුවන් ඔවුන්මය. ඔවුහු එහි සදාකාලිකව රැඳී සිටිති.

(අල්කුර්ආන් - 23:1 - 11)

**35**- නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බවට අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ඊමානය (විශ්වාසය) හැත්තෑවටත් වඩා අධික කොටස් වලින් සමන්විතකි. ඒවා අතර ඉමහත් විශේෂ කොටස ලා ඉලාහ ඉල්ලල්ලාහ් (වන්දනාමානය කිරීමට සුදුසු ස්වාමියා අල්ලාහ් හැර අන් කවරෙක් හෝ නොමැත) වේ. ඒවා අතර ඉතා පහත් කොටස මාර්ගයෙහි (ගමන් කරන මගීන්ට) අවහිරව පවතින දෙය ඉවත් කිරීමකි. ලැජ්ජාවීමද විශ්වාස යෙහි කොටසකි.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

ඊමාන්හි කොටස් හා වර්ග පිළිබඳව පැහැදිළිකර ඇති අතර, ඊමානය උස් හා පහත් තත්ත්වයෙන්ද පවතින බවද සඳහන් වේ. ඊමානයේ ඉතා වැදගත්, ඉතා ශ්‍රේෂ්ඨමත් හා ඉතා උතුම් දෙය ලාඉලාහ ඉල්ලල්ලාහ් වේ. කුසල් ක්‍රියාවන් ඊමානයට අදාල එකකි. ඊමානය උස් හා පහත් තත්ත්ව යෙන් හා වර්ග කීපයකින් පවතින බැවින් එය සමහරවිට වැඩිවේ. තවත් සමහරවිට අඩුවේ.

මාර්ගයෙහි මගීන්ට අවහිරව පවතින දෙය ඉවත් කිරීම ඇතුලු කිසියම් කුසලක් හෝ සුළු ලෙස නොසිතිය යුතුයි. කිසියම් කුසල් ක්‍රියාවක් හෝ ඒකදේවත්වයෙන් තොරව පරිපූර්ණව නොපවතී.

36–නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙක් අල්ලාහ්ව ස්වාමියා ලෙසද, ඉස්ලාමය ජීවන මග ලෙසද, මුහම්මදු (සල්) තුමාව අල්ලාහ්ගේ දූතයා ලෙසද පිළිගන්නේද ඔහු ඊමානයේ ආශ්වාදය රස වින්දේය.

(මූලාශ්‍රය : මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

මිනිසුන් ප්‍රඥා ඥානයෙන් වටහා ගැනීමට හැකිවන දේ මගින් තේරුම් කළ යුතුයි. ඉස්ලාම් දහම්හි මූලික කරුණු තුනක්ය. ඒවා අල්ලාහ්ව ස්වාමියා ලෙසද, ඉස්ලාමය ජීවන මග ලෙසද සහ නබිතුමාව අල්ලාහ්ගේ දූතයා ලෙසද පිළිගැනීමකි. විශ්වාසීන් මෙම මූලික කරුණු පිළිබඳව උස් හා පහත් තත්ත්වයෙන් සිටිති. දේව විශ්වාසය ගැන තෘප්ති වීම හදවතෙන් කරන ක්‍රියාවකි. මිනිසා කොපමණ තරම් ඒකදේවත්වය සනාථකර ඊමානය පවිත්‍ර කරන්නේද එතරම් ඔහුට ඊමානයේ ආශ්වාදය රස විඳීමට හැකි වෙ.

37–නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අනස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙක් හෝ මත ගුණාංග තුනක් පවතින්නේද, ඔහු එමගින් ඊමාන්හි ආශ්වාදය ලබාගනී. (ඒවා) ඔහුට අල්ලාහ්

හා ඔහුගේ දූතවරයා අන් කිසිවෙකුටත් වඩා ප්‍රියවීම, ඔහු කෙනෙකුව අල්ලාහ් වෙනුවෙන්ම ප්‍රිය කිරීම හා ඔහුව ගින්නෙහි විසිකිරීම අප්‍රියකරන සේම නැවත (ආගම අතහැර) කුෆ්රය කරා යාමද අප්‍රිය කිරීම වේ.

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

ඊමානයට ආශ්වාදයක් ඇති බව සනාථවේ. ඊමානය පරිපූර්ණ කළ අය එම ආශ්වාදය ලබා ගනී. අල්ලාහ්ව හා ඔහුගේ දූතයාව ප්‍රිය කිරීමද, අන් සැමට වඩා මෙම දෙදෙනා කෙරෙහි ප්‍රිය කිරීමට ප්‍රමුඛතාවය ලබා දීමද අනිවාර්ය වේ. අල්ලාහ්ව ප්‍රිය කිරීමෙහි ඔහුගේ දූතයාව ප්‍රිය කිරීමද ඇතුලත් වේ. අල්ලාහ් වෙනුවෙන් ප්‍රිය කිරීම ඊමානයේ අංගයක් වන අතර, අවිශ්වාසීන් අප්‍රිය කිරීමද ඊමානයේ අංගයක් බව පැහැදිලි වේ.

කුෆ්රය (අවිශ්වාසය) හා කාෆිර්වරුන් (අවිශ්වාසීන්)ගේ ක්‍රියාවන් අප්‍රිය කළ යුතුයි. එසේම, ඉස්ලාමයෙන් පිටමන් වීම හා නැවත කුෆ්රය කරා යාම අප්‍රිය කළ යුතුයි. මෙහි අල්ලාහ් හා ඔහුගේ දූතයාව හැර අන් අය ප්‍රිය කිරීම තහනම් බව පැහැදිලිකර ඇත. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*(ඔ : නබී) ඔබ පවසන්න. ඔබලාගේ පියවරුන්, ඔබලාගේ දරුවන්, ඔබලාගේ සහෝදරයන්, ඔබලාගේ බිරියන්, ඔබලාගේ ඥාතීන්, ඔබලා උපයා ගත් සම්පත්, අලාභ සිදුවේ දැයි ඔබලා බියට පත්වන ඔබලාගේ වෙළඳාම සහ ඔබලාට ප්‍රියවූ ඔබලාගේ නිවැස් යනාදීන් අල්ලාහ් හා ඔහුගේ දූතයාට වඩාද, ඔහුගේ මාවතෙහි ජිහාද් කිරීමට වඩාද ඔබලාට ප්‍රියවන්නේ නම්, අල්ලාහ් තම තීන්දුව (දඬුවම) ගෙන*

*ඒම කෙරෙහි ඔබලා අපේක්ෂා කරමින් සිටින්න. අල්ලාහ් නපුරු මිනිසුන්ට යහමග නොපෙන්වයි.*

*(අල්කුර්ආන්-9:24)*

**38**-ජාබිර් බින් අබ්දුල්ලාහ් (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

අල්ලාහ්ගේ දූතයාණෙනි, ඊමාන්හි ශ්‍රේෂ්ඨමත් කරුණු කුමක්ද ? යැයි නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් (එතුමාගේ ශ්‍රාවකරුවන්) විමසූ කළ, එතුමා 'ඉවසීම හා කමා කිරීම අන්තර්ගත ඊමානයකි' යනුවෙන් පැවැසීය.

(මූලාශ්‍රය : ඉබ්නු අබී ෂයිබා)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

වැදගත් කරුණු හා ශ්‍රේෂ්ඨමත් ගුණාංග මගින් ඊමානය පැහැදිලිකර ඇත. ඒවා ඉවසීම හා කමා කිරීම වෙ. මන්ද යත්, ඉවසීම ඊමානයේ හිසකි. මිනිසා අණ කළ ඇති දේ ඉටු කරන්නේද වළක්වා ඇති දෙයින් වැළකී සිටින්නේද දෛවය කෙරෙහි ඉවසා සිටින්නේද එමගිනි. අල්ලාහ්ගෙන් ලැබෙන කුලිය කෙරෙහි විශ්වාස කිරීමද, ඔහුගේ උතුම්වූ පොරොන්දුව කෙරෙහි හදවත තෘප්තිවීමද කමා කිරීමෙහි අන්තර්ගතවෙ. එසේම ඊමාන්හි විශ්වාසයන්, ක්‍රියාවන් හා ගුණාංගයන් අන්තර්ගත වෙ.

**39**-අබු උමාමා (රලි) තුමා නබි වදනක් මෙසේ වාර්තා කරන්නේය.

පුද්ගලයෙක් නබි මුහම්මදු (සල්) තුමා අමතා 'අල්ලාහ් ගේ දූතයාණෙනි, ඊමාන් යනු කුමක්ද ?' යනුවෙන් විමසීය.

එයට එතුමා 'මගේ කුසල් ක්‍රියාවන් ඔබට ප්‍රීතියද, ඔබේ අකුසල් ක්‍රියාවන් ඔබට කණගාටුවද ඇති කළේ නම්, ඔබ සැබෑ විශ්වාස (ඊමාන්)වන්තයාය' යැයි පැවැසීය. 'අල්ලාහ් ගේ දූතයාණෙනි, පාපය යනු කුමක්ද ?' යනුවෙන් ඔහු නැවත විමසීය. එකළ නබිතුමා 'ඔබේ හදවතෙහි (වැරදිද නිවැරදිද යැයි) චලනය කරන දෙය (පාපය එයමවේ) අත් අරින්න' යැයි පැවැසීය.

(මූලාශ්‍රය : අහ්මද්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

විශ්වාස වන්තයා කරන කුසල් ක්‍රියාවන් ඔහුහට සතුට ගෙන දෙයි. ඔහු කීකරුවීම ඔහුට ප්‍රිතිය ඇති කරයි. ඔහු කරන පාපයන් ඔහුට කණගාටුව ඇති කරයි. මුනාෆික් හෙවත් අවස්ථාවාදියා හා නපුරු මිනිසා මෙයට වෙනස්ය. කීකරුවීම ඔහුට ප්‍රිතිය ඇති නොකරන අතර, ඔහුට එකී සතුට නොහැඟේ. පාපයන් ඔහුට කණගාටු ඇති නොකරන අතර, ඔහුට එකී තිත්ත භාවයද නොහැඟේ. කළ කුසල් ක්‍රියාවන් ගැන සතුටුවීම කුලිය ගුණ කරයි. සිදුවූ අකුසල් ක්‍රියාවන් ගැන කණගාටුවීම දඬුවම ලිහිල් කරයි. නියතව, සැබෑ විශ්වාස වන්තයා වෙත තම විශ්වාසයෙහි ප්‍රමාණය දැන ගැනීමේ හදවත්මය උරගලක් ඇත්තේය.

**40**-නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ෆළාලත් බින් උබයිද් (රලි) මෙසේ වාර්තා කරන්නේය.

සැබෑ විශ්වාස වන්තයා කවරෙක් බව මා ඔබලාට දැනුම් දෙන්නද ? මිනිසුන්ගේ ප්‍රාණයන්ට සහ ධනයට කවරෙක් රැකවරණය ලබා දෙන්නේද, (විශ්වාස වන්තයා) ඔහුමය.

කවරෙකුගේ දිවෙන් හා අතින් මිනිසුන් ආරක්ෂාවරණය ලබත් තේද, මුස්ලිම්වරයා ඔහුමය. කවරෙක් අල්ලාහ්ට කීකරුවී මෙහි තම හදවත සමග සටන් කරන්නේද, මුජාහිද් වරයා (සටන් කාමියා) ඔහුමය. කවරෙක් පාපයන් සහ අකුසල් ක්‍රියාවන් අප්‍රිය කරන්නේද, මුහාජිර් වරයා ඔහුමය.

(මූලාශ්‍රය : අහ්මද්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

නබි මුහම්මදු (සල්) තුමා විශ්වාසියෙකුව ඔහුගේ ශ්‍රේෂ්ඨ මත් ලක්ෂණ හා උතුම් ගුණාංග මගින් විග්‍රහ කළේය. එම විශ්වාසියා මිනිසුන්ට හිරිහැර නොකරයි. මිනිසුන් ඔහුගේ හානියෙන් ආරක්ෂාවරණය ලබා ඔහු මගින් සැනසුම් ලබති. ඔවුන්ගේ ප්‍රාණය සහ ධනය ඔහුගෙන් ආරක්ෂා වෙ. නබි නායක තුමා මුහාජිර් වරයාව හිජ්රතයේ වැදගත් කරුණක් මගින් විවරණය කළේය. එම කරුණු පාපයෙන් සිට වහාම ඉවත් වීම, පාපයන් අප්‍රියකර, ඒවාහි නැවත නොයෙදීම හා සැඟවන කරුණු දැන සිටින අල්ලාහ් වෙත පවිත්‍ර චේතනා වෙන් පාපොච්චාරණය කිරීම වෙ.

**41**–සුෆ්යාන් බින් අබ්දුල්ලාහ් (රලි) තුමා නබි වදනක් මෙසේ වාර්තා කරන්නේය.

මා නබි මුහම්මදු (සල්) තුමාගෙන් 'අල්ලාහ්ගේ දූතයාණෙනි, ඔබතුමාගෙන් පසු අන් කවරෙකුගෙන් හෝ මා විම සිය නොයුතු වදනක් මට කියා දෙන්න' යැයි විමසීමි. එයට එතුමා 'අල්ලාහ් කෙරෙහි විශ්වාස කළෙමි' යනුවෙන් පවසා, පසුව ඒ කෙරෙහි ස්ථිරතාවයෙන් සිටින්න' යැයි පැවැසීය.

(මූලාශ්‍රය : මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

මෙම වදන ආගම පිළිබඳ සාරාංශයක් සහ ආගමෙහි කරුණු සියල්ල එක් රැස්කරන එකකි. මෙකී තේරුම විශ් වාසයෙන්ද, ක්‍රියාවෙන්ද ප්‍රකාශයෙන්ද පිළිගැනීම හා මෙම උතුම්වූ මගෙහි ස්ථිර භාවයෙන් සිටීමකි. එනම්, එහි සදා කාලිකව හා අඛණ්ඩව සිටීමකි. 'අල්ලාහ් කෙරෙහි විශ්වාස කළෙමි' (ආමන්තු බිල්ලාහ්) යන වදන අල්ලාහ්ගේ මවා පාලනය කරන බලය, ඔහුගේ දේවය බලය, ඔහුගේ නම් සහ ගුණාංග, ඔහු ඔහුගේ ධර්ම ග්‍රන්ථවල පහළ කළ දේ හා ඔහුගේ රසූල් (දූත)වරුන් ගෙන ආ දේ විශ්වාස කිරීමද අන්තර්ගතව පවතී. 'ස්ථිර භාවයෙන් සිටින්න' යන වචන යෙහි තේරුම ආගමානුකූල කරුණු නිසියාකාරව හා අලං කාරමත්ව ඉටුකිරීමවෙ. මෙය ආගමෙහි පරිපූර්ණතාවයකි.

**42**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අනස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කෙනෙක් තම පියා, දරුවා හා අන් සැම දෙනාට වඩා මා කෙරෙහි ප්‍රිය කරන තෙක් ඔබලාගෙන් කවරෙක් හෝ (සැබෑ) විශ්වාස වන්තයා විය නොහැක.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

මෙම වදන නබිතුමාගේ ශ්‍රවකරුවන් අමතා ප්‍රකාශකර ඇතත්, සමාජයේ සැම දෙනාට මෙය වලංගුවෙ. ප්‍රිය කිරීම හා අප්‍රිය කිරීම හදවත පිළිබඳ ක්‍රියාවක් වන අතර, එය ආගමෙ කරුණක්ද වෙ. විශ්වාස වන්තයින් අතර මවුන්ගේ

විශ්වාසයෙහි උස් පහත් තත්ත්වයක් පවතී. ඊමානය සම හරවිට වැඩිවෙ තවත් සමහරවිට අඩුවෙ. නබිනායක තුමාව ප්‍රිය කිරීම එතුමාගේ සමාජයට අනිවාර්ය වෙ. නබිනායක තුමා කෙරෙහි ආදරය කිරීම ආගමෙහි අනුගමනය කළ යුතු බලවත් කරුණකි. නබිනායක තුමාට දක්වන ආදරයට වඩා පියා, දරුවන් සහ අන් අයට දක්වන ආදරයට ප්‍රමුඛ තාවය ලබා දීම තහනමය.

**43**–නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අනස් (රලි) තුමා වාර්තා කරන්නේ මෙසේය.

තමාට ප්‍රිය කරන දේම තම සහෝදරයා කෙරෙහිද ප්‍රිය කරන තෙක් ඔබලාගෙන් කවරෙක් හෝ (සැබෑ) විශ්වාස වන්තයෙකු විය නොහැක.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

හදවත පිළිබඳ ක්‍රියාවන්ද ඊමානයෙහි අන්තර්ගත වෙ. මිනිසුන් අතර මෙහි උස් පහත් තත්ත්වයක් පවතී. මුස්ලිම් වරයා තමාට යහපතක් අපේක්ෂා කරන සේම තම සහෝදර මුස්ලිම් වරයාටද එය ආපේක්ෂා කිරීම, තමා දෙයක් අප්‍රිය කරන සේම ඔහුටද එය අප්‍රිය කිරීම ඔහුට සිය සහෝදරයා කෙරෙහි පවතින වගකීමකි.

මුස්ලිම් වරුන් රැවටීම හෝ ඔවුන්හට වංචා කිරීම හෝ නොකළ යුතුයි. මක්නිසාදයත්, මෙය විශ්වාසීන්ගේ ගුණාංග නොවන්නේය. වන්දනාමානවල යෙදෙන කළ ඊමානය වැඩි වෙ. පාප හා වැරදි ක්‍රියාවල යෙදෙන කළ එය අඩුවෙ.

# ඊමානය අඩුවීම හා වැඩිවීම

**44**-නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ වදනක් හන්ළලා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

මාගේ ප්‍රාණය කවරෙකුගේ අතෙහි පවතින්නේද, ඔහු මත දිවුරා කියමි. ඔබලා මා සමග සිටිනවිට කුමණ තත්ත්ව යෙහි සිටින්නේද, එවන් තත්ත්වයෙහි සහ අල්ලාහ්ව සිහි කිරීමෙහි ස්ථිරතාවයෙන් සිටින්නේනම්, ඔබලාගේ නින්දෙහි සහ (ඔබලා ගමන් කරන) මගෙහි දේව දූතවරුන් ඔබලා සමග අත්වැල් බැඳ ගනිති. එනමුත්, අහෝ හන්ළලා, සුළු වෙලාවක් අල්ලාහ්ව සිහි කිරීමෙන්ද, තවත් සුළු වෙලාවක් ලෞකික කාර්යවලද නිරතවන්න. (තුන් වතාවක් පැවසීය)
(මූලාශ්‍රය : මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

විශ්වාසීන්ගේ තත්ත්වය විවිධාකාරයෙන් පවතී. සමහර විට ඔවුන්ට සුළු වශයෙන් හෝ නොසැළකිලිකම් ඇතිවේ. නබිනායක මුහම්මදු (සල්) තුමාගේ සහාභාවරු (මිතුර)න් එතුමාගේ සභාවෙහි සිටින කළ ඔවුන්ගේ තත්ත්වය උතුම් තත්වයෙන් පවතී. මිනිසා මත පවතින අහංකාරකම ඉවත් වීම, ඔහුගේ වහළුත්වය ස්ථිරවීම සහ ඔහු තම ස්වාමියා ගෙන් පාපොච්චාරණය කිරීම සඳහා ඔහු පාපයෙහි යෙදීම ඔහුට අනිවාර්යවූ එකක් සේ පවතින බව මෙහි සඳහන්වේ. නිර්මානයන් මැවීමද, ඒවා විනාශ කිරීමද අල්ලාහ්ට පහසු කාර්යයකි. යහපත්ශීල විශ්වාස වන්තයින් සමහර අවස්ථා වල මලක්වරුන්ව දකිති. සමහර අවස්ථාවල ඔවුන් සමග

අතට අතදී ආචාර කරති. මෙවන් සිදුවීම් සමහර යහපත් ශීල විශ්වාස වන්තයින්ට සිදුවී ඇත්තේය. මලක්වරුන් යහ පත් ශීලයන්ගේ නිවැස්හි ඔවුන්ව මුණ ගසති.

**45**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබ්දුල් ලාහ් බින් අම්රු (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ඇඳුම් දිරාපත්වන සේ ඔබලාගෙන් කෙනෙකුගේ හදව තෙහි ඊමානයද දිරාපත් වෙ. එබැවින්, ඔබලාගේ හදවතෙහි ඊමානය අළුත් කරවන මෙන් අල්ලාහ්ගෙන් අයැදින්න.

(මූලාශ්‍රය : තබරානී)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

පාපයක යෙදීමෙන් මිනිසාගේ ඊමානය දුර්ලකමට පත් වෙ. (අල්ලාහ් පිළිබඳ සිතුවිල්ල කෙරෙහි) නොසැළකිලිමත් වීමෙන් එය හදවතෙහි දිරාපත් වෙ. රෙදි අළුත් කරන සේ ඊමානයද අල්ලාහ්ව සිහි කිරීම, ප්‍රාර්ථනා කිරීම, කුර්ආනය පාරායනා කිරීම සහ පොදුවෙන් කුසල් ක්‍රියාවන්හි යෙදීම යනාදීන් මගින් අළුත් කළ යුතුයි. එසේම, මිනිසා ඊමානය වැඩි කරන මෙන්ද, එහි ස්ථිරථාවයෙන් හා අඛණ්ඩව සිටී මට පිහිටවන මෙන්ද අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළ යුතුයි.

**46**-නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

පුද්ගලයෙක් දුරාචාරයෙහි යෙදෙන කළ ඔහුගෙන් ඊමා නය පිටත්වී (ඔහුට උඩින්) වළාකුලු සේ පවතී. පසුව ඔහු (අල්ලාහ්ගෙන් පාපොච්චාරණය කර) එයින් නිදහස් වූයේ නම්, එම ඊමානය ඔහු වෙත ආපසු පැමිණේ.

(මූලාශ්‍රය : අබූදාවූද්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

පාපයන්හි විපාකයන් පිළිබඳව පැහැදිලිකර ඇත. එය ඊමානයේ පරිපූර්ණභාවය පළුදුකර එහි ඌණතාවයක් ඇති කරයි. සැබැවින්ම, සමහර අවස්ථාවල ඊමානය මිනිසාගෙන් ඉවත් වේ. පාපයන්හි යෙදීමෙන් ඊමානයට කිසියම් බාධාවක් හෝ සිදු නොවන බව පවසන මුර්ජියියා පිරිසගේ මතය මෙහි ප්‍රතික්ෂේපකර ඇත. අහ්ලුස් සුන්නත් වල්ජමාඅත් (නබිතුමාගේ ජීවන සැලැස්ම හිරසාර ලෙස පිළිගෙන අනුගමනය කරන්නන්) හි ප්‍රතිපත්තිය අනුව ඊමානය අවස්ථාවන් අනුව අඩු හා වැඩිවේ.

ප්‍රඥා ඥානය මගින් මිනිසුන් වටහාගත හැකි කරුණු මගින් උදාහරණ කළ යුතුයි. දුරාචාරය පාපයන් අතර ඉමහත් නින්දිත ක්‍රියාවකි. මිනිසා තමාගේ ඊමානය ඔහුගෙන් ඉවත්වී යාම කෙරෙහි අවවාදයෙන් හා අවධානයෙන් සිටිය යුතුයි. එය පාප ක්‍රියාවන්ගෙන් වැළකී සිටීමෙන් හා පවිත්‍ර චේතනාවෙන් පාපොච්චාරණය කිරීමෙන් කළ හැක.

**47**–නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බවට අබූහුරෛරා (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

දුරාචාරය කරන්නා දුරාචාරයෙහි යෙදෙන කළ විශ්වාසියෙකු ලෙස නොසිටී. මත්පැන් පානය කරන්නා එය පානය කරනවිට විශ්වාසියෙකු ලෙස නොසිටී. සොරකම් කරන්නා සොරකම කරනවිට විශ්වාසියෙකු ලෙස නොසිටී. මිනිසුන් ඉදිරියෙහි වටිනා සම්පත් මංකොල්ල කන්නා එය කරනවිට විශ්වාසියෙකු ලෙස නොසිටී.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

මහා පාප ක්‍රියාවන් පරිපූර්ණ ඊමානයට හාත්පසින්ම වෙනස් එකකි. සත්‍යයෙන්ම, ඊමානය විශ්වාස වන්තයාව පාපයේ යෙදීමෙන් වළක්වයි. පාපයන් ඊමානයට බාධාවක් නොකරන බව පවසන මුර්ජියියා පිරිස මෙහි ප්‍රතික්ෂේප කර ඇත. මෙහි මහා පාපයන්හි යෙදෙන්නන්ට දැඩි ලෙස අවවාදකර ඇත. පාපයන්හි මහා පාපයන් හා සුළු පාපයන් යන දෙකම අන්තර්ගතව පවතී.

# ලාඉලාහ ඉල්ලල්ලාහි කොන්දේසි

**48**–අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

අපි නබිනායක මුහම්මදු (සල්) තුමා වටකර එක් සභා වක හිඳගෙන සිටියෙමු. අප සමග අබූබක්ර් (රලි) තුමා හා උමර් (රලි) තුමාද සිටියහ. එකළ නබිනායක තුමා අප අත රින් නැගිටට පිටත්විය. බොහෝ වෙලාවක් ගතවූවද එතුමා ආපසු නොපැමිණියේය. එතුමාට සතුරන්ගෙන් කුමක් හෝ කරදරයක් සිදුවී ඇති දැයි අපි බියට පත්වීමු. වහාම අපි එතැනින් නැගිටටෙමු. ප්‍රථමයෙන් බියට පත්වූයේ මමය. මා එතුමාව සොයාගෙන ගියෙමි. අවසාන වශයෙන් බණූ නජ්ජාර් ගෝත්‍රයේ අන්සාර්වරුන්ට අයත් වත්තකට පැමිණීමි. එහි (ඇතුළුවීමට) කිසියම් දොරටුවක් ඇත්තේ දැයි සොයා බැලුවද කිසිවක් නොදුටුමි. පිටත පිහිටා ඇති එක් ළිඳක සිට වත්ත දෙසට දුවන දිය ඇලක් දුටිමි. කපටි නරියෙකු සේ හැංගි හැංගි මා ඒ මාර්ගයෙන් ගොස් නබිනායක තුමා වෙත ගියෙමි.

(මාව දුටු එතුමා) ආ : අබූහුරෛරාද ? යනුවෙන් විමසීය. ඔව බව කීමි. මොකද ප්‍රශ්නය ? යනුවෙන් එතුමා විමසූ කළ මා 'අප අතරෙහි සිටි ඔබතුමා (හදිසියෙන්ම) නැගිටට පිටත්වූයේය. බොහෝ වේලාව ගතවුවද ඔබතුමා ආපසු පැමිණියේ නැත. සතුරන්ගෙන් ඔබතුමාට කුමක් හෝ සිදුවී ඇති දැයි අපි බියට පත්වීමු. ප්‍රථමයෙන් මම බියට පත්වූ හෙයින් කපටි නරියෙකු සේ හැංගි හැංගි මෙහි පැමිණීමි. මාගේ පිටුපස මිනිසුන් බලාගෙන සිටිති' යනුවෙන් කීමි.

එකළ නබිනායක (සල්) තුමා 'අහෝ අබූහුරෛරා, යනුවෙන් අමතා එතුමාගේ සෙරෙප්පු දෙක මාහට ලබාදී, මේ දෙක රැගෙන ගොස් මෙම වත්තෙහි පිටත 'වන්දනාමානය කිරීමට සුදුසු ස්වාමියා අල්ලාහ් හැර අන් කිසිවෙක් හෝ නොමැති බව හදවතෙහි ස්ථිර භාවයෙන් සාක්ෂි දරන කවරෙකු ඔබට හමුවන්නේද ඔහුට ස්වර්ගයෙකි යන සුභාසිංසනය පතන්න' යනුවෙන් පැවැසීය.

පසුව මට ප්‍රථමයෙන් මුණගැසුනේ උමර් (රලි) තුමාය. ඔහු මාගෙන් 'අහෝ අබූහුරෛරා, මොකද මේ සෙරෙප්පු දෙක ? යනුවෙන් විමසීය. එකළ මම 'මේවා නබිනායක තුමාගේ සෙරෙප්පු දෙකකි. 'හදවතහි ස්ථිරභාවයෙන් වන්දනාමානය කිරීමට සුදුසු ස්වාමියා අල්ලාහ් හැර අන් කිසිවෙක් හෝ නොමැති බව සාක්ෂි දරන කවරෙකුව හමුවන්නේද ඔහුට ස්වර්ගයෙකි යන සුභාසිංසනය කරන මෙන් එතුමා මේවා දෙක දී මාව එව්වේය' යනුවෙන් කීය. වහාම උමර් (රලි) තුමා මාගේ පපුවට ඔහුගේ අතින් පහරයක් දුන්නේය. එවිගස මා පිටුපසින් බිමට වැටුනෙමි. ඔහු 'අහෝ අබූහුරෛරා, ආපසු හැරී යන්න' යනුවෙන් ඔහු කී බැවින්,

මම ආපසු නබිනායක තුමා හමුවට ඉකි ගසා අඬාගෙන ගියෙමි. උමර් (රලි) තුමාද මාගේ පිටුපසින් ලුහු බැඳමින් පැමිණියේය.

(මා දුටු) නබිනායක තුමා 'අහෝ අබූහුරෙයිරා, ඔබට වූයේ කුමක්ද ? යනුවෙන් විමසීය. එකල මා 'මම උමර් (රලි) තුමාව මුණගැසීමි. ඔබතුමා මාහට පවසා එවූ කරුණ ඔහුට කීමි. වහාම ඔහු මාගේ පපුවට පහර දුන්නේය. මා පිටුපසට වැටුනෙමි' යනුවෙන් කීවෙමි. එකල නබිතුමා මාව ආපසු යන මෙන් අණ කළේය.

පසුව එතුමා 'අහෝ උමර්, ඔබ මෙසේ හැසිරීමට තුඩුදුන් හේතුව කුමක්ද ?' යනුවෙන් විමසීය. එයට උමර් (රලි) තුමා 'අල්ලාහ්ගේ දූතයාණෙනි, මාගේ මව හා පියා ඔබතුමාට පූජා කර කියමි. වන්දනාමානය කිරීමට සුදුසු ස්වාමියා අල්ලාහ් හැර අන් කිසිවෙක් හෝ නොමැති බව හදවතින් ස්ථිරභාවයෙන් සාක්ෂි දරන කවරෙක් ඔබ හමුවන්නේද, ඔහුට ස්වර්ගයකි යන සුභාසිංසනය කරන මෙන් ඔබතුමාද අබූහුරෙයිරාට ඔබතුමාගේ සෙරෙප්පු දෙකත් දී එව්වෙ ? යනුවෙන් විමසීය. එයට නබිනායක තුමා 'ඔව් එසේමයි' යනුවෙන් පැවසීය.

එයට උමර් (රලි) තුමා 'එසේ නොකරන්න. මිනිසුන් එය විශ්වාස කරමින් කුසල් ක්‍රියාවන්හි නොයෙදී සිටීමට හැකි බව මම බියවෙමි' යනුවෙන් කීය. එයට සවන් දුන් නබිතුමා 'ඔවුන් (කුසල් ක්‍රියාවන්හි යෙදීමට) අත්හරින්න' යනුවෙන් පැවැසීය.

(මූලාශ්‍රය : මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

එක් පුවතක් විශ්වාස කිරීම සඳහා සළකුණක් වශයෙන් කිසියම් දෙයක් හෝ ලබාදී එවීමට හැක. සතුටුදායක පුව තක් සැමට පොදුවෙන් දැනුම් දිය යුතුයි. සමහර මිනිසුන්ට ප්‍රශ්නයක් ඇතිවේදැයි බිය නොවන්නේනම්, දැනුම් ඥානය සැමට ව්‍යාප්ත කළ හැක. උමර් (රලි) තුමා අබූහුරෛරාගේ පුවත දැනුම් දීමට ඉඩ නොදී ඔහුව හරවා එව්වේය. 'මිනි සුන් එම පුවත පිළිගෙන කුසල් ක්‍රියාවන්හි නොයෙද සිටී දැයි තමා බියවන බව උමර් (රලි) තුමා නබිනායක මුහම් මදු (සල්) තුමාට කීය. එය නබිතුමා පිළිගත්තේය.

**49**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබූ හුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

වන්දනාමාන කිරීමට සුදුසු ස්වාමියා අල්ලාහ් හැර අන් කිසිවෙක් නොමැති බවත්, මා අල්ලාහ්ගේ දූතයා බවත් සාක්ෂි දරා, ඒවා කෙරෙහි කිසියම් සැක කිරීමකින් තොරව සිටිමින් කවරෙක් හෝ අල්ලාහ්ව බැහැ දකින්නේද, ඔහු ස්වර්ගයට පිවිසේ.

(මූලාශ්‍රය : මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

පුද්ගලයෙක් අල්ලාහ් හා ඔහුගේ දූතයා පිළිබඳ සාක්ෂි දෙකම එකට ප්‍රකාශ කළ යුතු බව සනාථවේ. ඒවා දෙකම එකට එකක් අවශ්‍යව පවතී. එවායින් එකක් අනෙකෙන් තොරව පරිපූර්ණයට නොපත්වේ. මේවා දෙකම කෙරෙහි සාක්ෂි දරන්නාට ඒවා දෙකම පිළිබඳ ස්ථිරතාවයක් අවශ්‍ය වේ. මන්දයත්, මෙම සාක්ෂි දෙක කෙරෙහි සැක කිරීම එම

සාක්ෂි දෙකම නිශ්ඵල කරයි. ඒකදේවවාදීන්ගේ රැඳුම් ස්ථානය ස්වර්ගය වේ.

ලාඉලාහ ඉල්ලල්ලාහ් කෙරෙහි ස්ථිර භාවයෙන් පිළිගත් අය එකී අරමුණ කරා ක්‍රියා කළ යුතුයි. හදවතෙන් කරන විශ්වාසය කුසල් ක්‍රියාවකි. ඒකදේවත්ව සාක්ෂිය, ප්‍රකාශ කිරීම පමණක් ප්‍රමාණවත් නොවන අතර, ඒ අනුව ක්‍රියාවන් හිද යෙදිය යුතුයි.

**50**–අබූ මූසා අල් අෂ්අරී (රළි) තුමා නබි වදනක් මෙසේ වාර්තා කරන්නේය.

මම නබිනායක මුහම්මදු (සල්) තුමා හමුවට පැමිණිමි. මා සමග මාගේ සමාජයේ පිරිසක්ද සිටියහ. එකළ එතුමා (අප අමතා) 'ඔබලා සතුටුවන්න. ඔබලාට පසුව සිටින අයට මෙම සුභාසිංසනය දැනුම් දෙන්න. කවරෙක් වන්දනාමාන කිරීමට සුදුසු ස්වාමියා අල්ලාහ් හැර අන් කවරෙක් හෝ නොමැති බව සත්‍යභාවයෙන් සාක්ෂි දරන්නේද, ඔහු ස්වර්ගයට පිවිසේ' යනුවෙන් පැවැසීය.

පසුව මිනිසුන්ට සුභාසිංසනය කිරීම සඳහා නබිනායක තුමාගෙන් සිට අපි පිටත්වූයෙමු. අපි (මගෙහි) උමර් (රළි) තුමාව මුණ ගැසුනෙමු. ඔහු අපව නබිනායක තුමා වෙත නැවත කැඳවාගෙන ගියේය. පසුව ඔහු නබිනායක තුමාව අමතා 'අල්ලාහ්ගේ දූතයාණෙනි, එසේනම්, මිනිසුන් (මෙය විශ්වාස කර) කුසල් ක්‍රියාවන්හි නොයෙදමින් සිටිති' යනුවෙන් කීය. එයට නබිනායක තුමා කිසිවක් හෝ නොපවසා නිශ්ශබ්දව සිටියේය.

(මූලාශ්‍රය : අහ්මද්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

හදවතට ප්‍රියවන කාර්යයන් ගැන මිනිසුන්ට සුභාසිංස නය කළ හැක. ඒවා අතර පවිත්‍ර ඒකදේව වාදීන්ට ස්වර්ග යෙහි පිවිසීමේ භාග්‍යය ලැබෙන බව සුභාසිංසනය කිරීම උතුම්ය.

කවරෙක් ලාඉලාහ ඉල්ලල්ලාහ් යන වදන තමාගේ හද වතෙන් විශ්වාස කර, එය සත්‍ය ලෙසට ප්‍රකාශ කර, එය අල්ලාහ් වෙනුවෙන් යතු පවිත්‍ර චේතනාවෙන් හා එකී අර මුණ කරා ක්‍රියා කරන්නේද, ඔහුගේ ප්‍රකාශය ඔහුට පල ලබා දෙයි.

කවරෙක් මෙසේ ක්‍රියා කරන්නේද, ඔහුගේ රැඳුම් ස්ථා නය භාග්‍යයන් පිරී ස්වර්ගය. නබිනායක මුහම්මදු (සල්) තුමා අල්ලාහ්ගේ දූතයා බව සාක්ෂි දරන තෙක්, වන්දනා මානය කිරීමට සුදුසු ස්වාමියා අල්ලාහ් හැර අන් කවරෙක් නොමැති බව දරන සාක්ෂිය පරිපූරණත්වයෙන් නොපවති. ක්‍රියාවන් අතර උතුම් ක්‍රියාව මෙම (ඒක දේවත්ව) සාක්ෂි දැරීමකි. අල්ලාහ්ගේ දූතවරුන් මිනිසුන් කැඳවූයේ මෙම සාක්ෂිය කරාය.

**51**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව උස්මාන් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙක් වන්දනාමානයට සුදුසු ස්වාමියා අල්ලාහ් හැර අන් කවරෙක් හෝ නොමැති බව දැන ගෙන සිටින කළ මරණයට පත්වෙන්නේද, ඔහු ස්වර්ගයට පිවිසේ.

(මූලාශ්‍රය : මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

මෙහි දැනීම යනුවෙන් අල්ලාහ්ගේ ඒකදේවත්වය, මහුගේ දිව්‍යමය භාවය සහ මහුගේ ඒකීයභාවය ස්ථිරව විශ්වාස කිරීම, එම විශ්වාසය පිරසිදු චේතනාවෙන් පවතීම, මෙම ප්‍රකාශය සත්‍ය කිරීම හා මෙම සත්‍ය පදනම අනුව ක්‍රියා වෙහි යෙදීමකි. මෙය අල්ලාහ්ගේ තෘප්තිය ලබා ගැනීම හා මහුගේ ස්වර්ගයේ ලැගුම් ගැනීම සඳහාය. ලාඉලාහ ඉල්ලල් ලාහ් යන මෙම වචනයෙහි ඇති බව ප්‍රකාශ කිරීම සහ නැති බව ප්‍රකාශ කිරීම යන කරුණු දෙකක් අන්තර්ගතව පවතී. එනම්, වන්දනාමානය කිරීමට සුදුස්සා අල්ලාහ් හැර අන් කවරෙක් හෝ නොමැති බව කීම නැති බව ප්‍රකාශ කිරීමක් ලෙසද, වන්දනාමාන බලයට සුදුස්සා අල්ලාහ් පම ණක් බව කීම ඇති බව ප්‍රකාශ කිරීමක් ලෙසද පවතී.

# ලාඉලාහ ඉල්ලල්ලාහ් විශේෂත්වය

**52**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබ් දුල්ලාහ් බින් අම්රු (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

සැබැවින්ම, අල්ලාහ් පරලොව දිනයේ මගේ සමාජයෙන් කෙනෙකුව නිර්මානයන් අතරින් රැගෙන එයි. පසුව මහුට සටහන් පත් අනූ නවයක් දිගහැර පෙන්වයි. සෑම සටහන් පතක්ම බැල්මක (දුර) ප්‍රමාණයක පවතී. පසුව මහුගෙන් ‘මෙයින් කිසිවක් හෝ මබ ප්‍රතික්ෂේප කරන්නේද ? (ක්‍රියා වන්) රැකවරණයෙන් සටහන් කරන මාගේ ලිපිකරුවන් මබට අසාධාරණයක් කර ඇත්තේද ?’ යනුවෙන් විමසයි. ‘එසේ නොවේ ස්වාමිනී’ යැයි මහු කියයි. පසුව අල්ලාහ්

'ඔබ වෙත කිසියම් කාරණාවක් හෝ කුසලක් ඇත්තේද ?' යැයි අසයි. එයට ඔහු තිගැස්සී කිසිවක් නොව ස්වාමිනී' යනුවෙන් කියයි. වහාම අල්ලාහ් 'ඔව් අප වෙත ඔබට එක් කුසලක් (පමණක්) ඇත්තේය. අද දින ඔබට අසාධාරනය කරනු නොලැබේ' යනුවෙන් පවසයි.

පසුව ඔහු වෙනුවෙන් එක් කාඩ පතක් ගෙනෙනු ලැබේ. එහි 'වන්දනාමානය කිරීමට සුදුසු ස්වාමියා අල්ලාහ් හැර අන් කිසිවෙක් නොමැති බවත් නබිනායක මුහම්මදු (සල්) තුමා අල්ලාහ්ගේ වහළා හා දූතයා බවත් සාක්ෂි දරමි' යන වදනක් සඳහන් වේ. එය ගෙනෙන ලෙස අල්ලාහ් පවසයි. එකල එම පුද්ගලයා 'මගේ ස්වාමිනී, මෙතරම් සටහන් පත් තිබියදී මෙම කාඩ පත කුමකටද ? යනුවෙන් අසයි. එකල ඔහුට 'ඔබට කිසිදු අසාධාරනයක් කරනු නොලැබේ' යනු වෙන් පවසා පසුව (තරාදියේ) එක් තට්ටුවක එම සටහන් පත්ද, අනෙක් තට්ටුවේ මෙම කාඩ පතද තබනු ලැබේ. එකල සටහන් පත්වල බර අඩුවෙන්ද කාඩ එකේ බර වැඩි යෙන්ද පවතී. අසීමිත කරුණා වන්තයාවූද අපරිමිත ආදර වන්තයාවූද අල්ලාහ්ගේ නාමය සමග කිසියම් දෙයක් හෝ බරව නොපවතී.

(මූලාශ්‍රය : අහ්මද්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

ලා ඉලාහ ඉල්ලල්ලාහ් උතුම්වූ වදනක් වන අතර, එය තරාදියේ බරව පවතින එකකි. මෙය ක්‍රියාවන් අතර බරවූ, කුසල් අතර මහත්වූ හා වැඳුම් පිදුම්වල ඉතා උතුම්වූ එකක් දවේ. කවරෙක් හෝ ලාඉලාහ ඉල්ලල්ලාහ් යන වදන පවිත්‍ර

චේතනාවෙන් විශ්වාසකර, එය සත්‍ය භාවයෙන් ප්‍රකාශ කර, එය සත්‍ය බවට සනාථකර එකී පරමාර්ථය කරා ක්‍රියා කරන්නේද, ඔහුට එය පලදායික පවතී. ඔහුගේ පාපයන් සමා කරනු ලැබේ.

මෙම වදනෙහි අල්ලාහ්ගේ කරුණාව හා භාග්‍යයන් පිළි බඳව සඳහන්කර ඇත. මිනිසා තම ස්වාමියා ගැන හොඳ සිතුවිල්ලකින්ද, ඔහුගේ භාග්‍යයන් අපේක්ෂා කරමින්ද, ඔහු ගේ සමාව කෙරෙහි අවිශ්වාස නොකරමින්ද, ඔහුගේ දායා දයන් කෙරෙහි ආශා කරමින්ද සිටිය යුතුයි. මන්දයත්, ඔහු සමා වන්තයා හා ශ්‍රේෂ්ඨ වන්තයාය.

(පරලොව දිනයේ) සමහරුන් සාක්ෂීන් ඉදිරියෙහි ප්‍රශ්න කරනු ලැබේ. නියත වශයෙන්ම, අල්ලාහ් තම වහලුන්ට (ස්වල්ප වශයෙන් හෝ) අසාධාරනය කරන්නෙක් නොවේ. නියත වශයෙන්ම පරලොව දිනයෙහි කිසියම් පරිවර්තක යෙකු නොමැතිව අල්ලාහ් වහලුන්ගෙන් කෙළින්ම ප්‍රශ්න කරයි.

පරලොව දිනයේ මිනිසුන්ට ක්‍රියාවන් සටහන් කරනලද පුස්තකය ලබා දෙනු ලබන බවත්, කුසල් හා අකුසල් ක්‍රියා වන් සටහන් කරනු ලබන බවත් මෙම නබි වදනෙන් තහ වුරුවේ. ඒකදේවත්වයට ඉමහත් ශ්‍රේෂ්ඨත්වයක් ඇති බවත් ක්‍රියාවන් සටහන් කරන මලක් (දූත) වරුන් සිටින බවත් විශ්වාස කළ යුතු බවත් කුසල් ක්‍රියාවන් අකුසල් ක්‍රියාවන් විනාශ කරන බවත් මෙම වදනෙහි අන්තර්ගත වේ.

**53**-උසාමා බින් සෙයිද් (රලි) තුමා නබි වදනක් මෙසේ වාර්තා කරන්නේය.

නබිනායක මුහම්මදු (සල්) තුමා එක් සේනාවක් සමග අපව එව්වේය. අපි ජුහෙනා ගෝත්‍රයට අයත් හුරක්කාත් නැමැති පිරිසට උදැසනම හදිසි පහරදීමක් කළෙමු. එකළ මා කෙනෙකුව අල්ලා ගත්තෙමි. වහාම ඔහු ලාඉලාහ ඉල් ලල්ලාහ් යැයි කීවේය. මා ඔහුව කොටා ඝාතනය කළෙමි. එය මාගේ හදවතෙහි වේදනාවක් ඇති කළේය.

එබැවින්, මා නබිනායක තුමා වෙත පැමිණ ඒ බව කීමි. එකළ නබිනායක තුමා 'ලාඉලාහ ඉල්ලල්ලාහ් යැයි ප්‍රකාශ කළ තැනැත්තාවද ඔබ ඝාතනය කළේ ? යනුවෙන් විමසීය. 'අල්ලාහ්ගේ දූතයාණෙනි, ඔහු එසේ ප්‍රකාශ කළේ ආයුධ යට බියෙන්ය' යනුවෙන් මම කීමි. එකළ නබිනායක තුමා 'ඔහු ආයුධයට බියවී එසේ ප්‍රකාශ කළේද ? නැද්ද යන බව ඔබ ඔහුගේ හදවත විවෘතකර බැලුවේද ? යනුවෙන් ප්‍රශ්න කළේය. 'එදින මම ඉස්ලාමය වෙළා ගැනීමට තිබු නානේ' යනුවෙන් මම ආශාවන තරමට එතුමා මාහට එසේ නැවත නැවත කීවේය.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

කවරෙක් ලාඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් ප්‍රකාශ කරන් නේද, ඔහුගේ ප්‍රාණයට ආරක්‍ෂාවරණය ලැබේ. ඔහු පිළිබඳ කරුණු අල්ලාහ් සතුව පවතී. එය ප්‍රකාශ කළ තැනැත්තා ආරක්‍ෂාවරණය ලබයි. අවස්ථාවාදියා කාෆිර්වරයාට වඩා දුෂ්ට යක් වුවද, මෙලොවෙහි කාෆිර්වරයා සමග කටයුතු කරන සේ ඔහු සමග කටයුතු නොකළ යුතුයි. මන්ද යත්, ඔහු ඉස්ලාමය ප්‍රසිද්ධකර, කුෆ්රය (අවිශ්වාසය) සඟවන්නේය.

කවරෙක් පවිත්‍ර චේතනාවෙන් ලා ඉලාහ ඉල්ලල්ලාහ්ව ප්‍රකාශ කරන්නේද, පරලොවෙහි එය ඔහුට පලදායක වේ. පුද්ගලයෙක් නිවැරදි කරුවෙකුගේ රුධිරය පිට නොකිරීම සඳහා හා කිසියම් මුස්ලිම් වරයෙකුගේ ප්‍රාණයක් ඝාතනය නොකිරීම සඳහා ඔහු යුද්ධයෙහි යෙදෙන කළ සතුරා පිළි බඳ සත්‍යභාවය දැනගත යුතුයි. මිනිසුන්ගේ හදවතෙහි පවතින සිතුවිල්ල ගැන දැනගැනීම මිනිසාට අනවශ්‍ය වේ. එය අල්ලාහ් හා සමග සම්බන්ධ කරුණකි.

# අල්ලාහ්ගේ නම් හා ගුණාංග

අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔහු අල්ලාහ්ය. ඔහු කවරෙක් නම්, (වන්දනාමානය කිරීමට සුදුසු) ස්වාමියා ඔහු හැර අන් කිසිවෙක් නොමැත. (ඔහු) සැඟවුනු හා ප්‍රසිද්ධ කරුණු කෙරෙහි ඥාන වන්තයාය. අසීමිත කරුණාවන්තයා හා අසම දයාවන්තයාය.*

*ඔහු අල්ලාහ්ය. ඔහු කවරෙක් නම්, (වන්දනාමානය කිරීමට සුදුසු) ස්වාමියා ඔහු හැර අන් කිසිවෙක් නොමැත. ඔහු රජුය. ඉතා පවිත්‍ර වන්තයාය. සැනසුම් වන්තයාය. අභය ලබා දෙන්නාය. රැකබලා ගන්නාය. (සැම දෙනා) අභිබවා යන බලවතාය. (තම ආඥාව) මැඩ පවත්වන්නාය. අහංකාර වන්තයාය. ඔවුහු ආදේශ කරන දෙය කෙරෙහි ඉමහත් පවිත්‍ර වන්තයාය.*

*ඔහු අල්ලාහ්ය. නිර්මාණය කරන්නා (ඔහුම)ය. (ඒවා පිළියෙළකර) මවන්නා (ඔහුම)ය. (මැවිලිවල) රූප කරන්නා (ඔහුම)ය. ඔහුට අලංකාරමත් නාමයන් ඇත්තේය. අහස්හි*

*හා පොළොවෙහි ඇති (සියළුම) දේ ඔහුව පිහිකර පවිත්‍ර කරති. තවද, ඔහු සැම දෙය අභිබවා යන්නා හා සූක්ෂ්ම වන්තයාය.*

*(අල්කුර්ආන්-59:22-24)*

*අල්ලාහ්ට අලංකාරමත් නාමයන් ඇත්තේය. එහෙයින්, ඔබලාද එමගින්ම ඔහුව අඬගසා ප්‍රාර්ථනා කරන්න. ඔහු ගේ නාමයන් කෙරෙහි (වැරදි සහගතව) ගොතන්නන් (නොසළකා) අත් හරින්න. ඔවුහු කරමින් සිටින ක්‍රියාවන්ට අදාල කුලිය ඔවුන්ට ලබා දෙනු ලැබේ.*

*(අල්කුර්ආන්-7:180)*

**54**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබූ හුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

සැබැවින්ම, අල්ලාහ්ට නම් අනූ නවයක් ඇත්තේය. කව රෙක් ඒවා රැකවලදී කටයුතු කරන්නේද, ඔහු ස්වර්ගයට පිවිසේ. අල්ලාහ් ඒකිතයකි. ඔහු ඔත්තයම ප්‍රිය කරයි.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අල්ලාහ්ගේ ඒකදේවත්වය පරිපූර්ණ එකකි. ඔහු ඒකීක යාය. ඔහුහට සමානව කිසිවක් නොමැත. අල්ලාහ්ට ප්‍රිය කිරීමේ ගුණාංගයක් ඇති බව සනාථ වේ. අල්ලාහ් විවිධ මිනිසුන්, වචනයන්, ක්‍රියාවන්, ස්ථානයන් හා කාලයන් ප්‍රිය කරයි. එසේම ගණනෙහි ඔත්තය ප්‍රිය කරයි. ෂරීඅත් නම් ආගමෙහි අධික කරුණු ඔත්තයෙන්ම පවතින්නේය. දහවල් කාලයේ සලාතය ඔත්තයෙන් අවසන්වේ. එය මග්රිබ් සලා තයකි. එසේම, රාත්‍රී කාලයේ අවසන් සලාතයද ඔත්තයෙන්

අවසන්වේ. එය විත්ර් සලාතයකි. මක්කාවේ කඃබා දේවස්ථානය තවාෆ් (වට) කිරීමද, සෆා හා මර්වා අතර සඊ (සක් මන්) කිරීමද හත් වතාවකි. එසේම, තස්බීහ් කිරීම තිස්තුන් (33) වතාවන්වන අතර, අල්ලාහ්ගේ අලංකාරමත් නාමයන්ද අනූ නවයකි.

**55**–නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අනස් බින් මාලික් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

අස්සලාම් (සාමය) යනු අල්ලාහ්ගේ නාමයෙන් එකකි. එය පොළොවෙහි ජීවත්වන්නන් සඳහා තබා ඇත. එබැවින්, ඔබලා අතර සලාමය පතුරුවන්න.

(මූලාශ්‍රය : අල්අදබුල් මුෆ්රද්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අස්සලාම් යනු අල්ලාහ්ට අයත් නමකි. මහුට බොහෝ නම් ඇති අතර, ඒවා සියල්ල අල්කුර්ආන් හා නබිතුමාගේ වදන් සාධක මගින් සනාථකර ඇත. අල්ලාහ්ගේ නම් හා ගුණාංග සනාථ කරන සාධකයන් දැන ගැනීමද, ඒවායින් මහුට සුදුසු නාමයන් හා ගුණාංග තෝරා ඒවා වටහා දෙන කරුණ අනුව ක්‍රියා කිරීමද මිනිසාට අනිවාර්ය වේ. මෙයට අස්සලාම් (සාම වන්තයා), අර් රහ්මාන් (අසීමිත කරුණා වන්තයා), අල්කරීම් (ශ්‍රේෂ්ඨ වන්තයා, දාන වන්තයා) හා අල් හලීම් (සෞම්‍ය වන්තයා) යනාදීන් උදාහරණ වේ.

විශ්වාසීන් අතර සලාමය පතුරුවීම අනිවාර්ය වේ. මන්ද යත්, එමගින් මවුනතර සහෝදරත්වය, ප්‍රේමය හා සමගිය ඇති වන්නේය. ෂරීඅත් හෙවත් ආගම අණ කරන විශ්වාස

වන්තයින් අතර සමගිය ඇති කිරීමද සලාමය පතුරුවීමේ එක් අරමුණකි. කවරෙකුගේ දිවෙන් හා අතින් අන් මුස්ලිම් වරයා බියෙන් තොරව සිටින්නේද, සැබෑ විශ්වාස වන්තයා ඔහුමය.

**56**-යඋලා බින් උමයියා (රළි) තුමා නබි වදනක් මෙසේ වාර්තා කරන්නේය.

නබිනායක මුහම්මදු (සල්) තුමා විවෘත ස්ථානයක ජල ස්නානය කරමින් සිටි පුද්ගලයෙකුව දුටුවේය. වහාම එතුමා මිම්බර් (දේශනා) කුටියෙහි නැග අල්ලාහ්ව ප්‍රශංසා හා ගුණ වර්ණනාකර, පසුව 'නියතව අල්ලාහ් ලැජ්ජා වන්තයා හා (අඩුපාඩු) සැඟ වන්නාය. ඔහු ලැජ්ජාවීම හා (අඩුපාඩු) සැඟවීම ප්‍රිය කරයි. එබැවින්, ඔබලාගෙන් කවරෙක් හෝ ජල ස්නානය කරන්නේ නම්, ඔහු තමාව ආවරණය කළ යුතුයි' යනුවෙන් ප්‍රකාශ කළේය.

(මූලාශ්‍රය : අබූදාවූද්, සහීහුල් ජාමිඋ)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අල්ලාහ්ට අධික ලැජ්ජා වන්තයා හා (අඩුපාඩු) සැඟ වන්නා යන නම් දෙකක් ඇත්තේය. 'නියතව, අල්ලාහ් මදු රුවක් හෝ එයට වඩා කුඩා දෙයක් හෝ නිදසුනක් වශ යෙන් පෙන්වීමට ලැජ්ජා නොවන්නේය' (2:26) යනුවෙන් අල්ලාහ් පවසන්නේය.

අල්ලාහ්ට ඔහුගේ ගරුත්වයට හා මහානුභාවයට ඔබින ලැජ්ජාවක් ඇති අතර නිර්මානයන්ගේ ලැජ්ජාවට එය කිසි සේත් සමානව නොපවතී. අල්ලාහ්ට ප්‍රියවීම යන ගුණාංග යක්ද ඇති බව සනාථවේ. මිනිසා ජලස්නානය කරන කළ

හා මළ මූත්‍රා පහ කරනවිට ආවරණයකර ගැනීම අනිවාර්ය වේ. ලැජ්ජාවීම හා ආවරණය කර ගැනීම විශ්වාස වන්තයා ගේ ගුණාංගයන්ය. එසේම, ලැජ්ජාවීම ඊමාන (විශ්වාස)යේ ද අංගයකි. ලැජ්ජාවීම උතුම් යහපත්කමක්ද වේ.

මදීනා (අන්සාර්) කාන්තාවක් නබිනායක තුමා අමතා 'අල්ලාහ්ගේ දූතයාණෙනි, නිසැකයෙන්ම, අල්ලාහ් සත්‍යයට ලැජ්ජා නොවන්නේය...' යනුවෙන් පැවැසූවාය. අල්ලාහ්ට ඔහුගේ මහානුභාවයට ඔබින පරිදි ලැජ්ජාවීමක් ඇති බව මෙහි තහවුරුවේ.

**57**-නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව සල්මානුල් ෆාර්සී (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

නියතව අල්ලාහ් ලැජ්ජා වන්තයා හා දාන වන්තයාය. මිනිසෙක් තම දෑත ඔසවා ඔහුගෙන් ප්‍රාර්ථනා කළේ නම්, ඔහුව හිස් අතින් හරවා යැවීමට ඔහු ලැජ්ජා වන්නේය.

(මූලාශ්‍රය : අහ්මද්, සහීහ් ජාමිඋ)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අල්ලාහ්ගේ මහාණුභාවයට ඔබින පරිදි ලැජ්ජාවීම හා දානය කිරීම යන ගුණාංග දෙකක් ඔහුට ඇති බව සනාථ වේ. අල්ලාහ්ගේ ගුණාංගයන් අපගේ ගුණාංගවලට සමානව නොපවතින හෙයින්, ඔහුගේ ලැජ්ජාවීමද අපගේ ලැජ්ජා වීමට සමානව නොපවතී. ප්‍රාර්ථනා කරන කළ දෑත් ඔසවීම එකී සාර ධර්මයකි. ප්‍රාර්ථනා කිරීමෙන් ලැබෙන අභිවෘධිය ගැන පැහැදිළිකර ඇත.

ප්‍රාර්ථනාවෙ ප්‍රතිඵලය සැමට පොදුය. මිනිසා අල්ලාහ්ගේ දායාදයන් කෙරෙහි අවිශ්වාසය නොකළ යුතුයි. අල්ලාහ්ගේ පරෝපකාර හැකියාව විශාල වශයෙන්ද ඔහුගේ දායාදයන් සැමට පොදුවෙන්ද පවතී.

**58**-අනස් බින් මාලික් තුමා මෙසේ වාර්තා කරන්නේය.

නබිනායක මුහම්මදු (සල්) තුමාගේ කාලයේ (එක් අවස් ථාවක) බඩු මිළ ඉහළට ගියේය. (ඒ පිළිබඳව මිනිසුන් නබි නායක මුහම්මදු (සල්) තුමා වෙත පැමිණ) 'අල්ලාහ්ගේ දූත යාණෙනි, බඩු මිළ පාලනයක් කරන්නට බැරිද ?' යනුවෙන් විමසූහ, එයට එතුමා 'නිසැකයෙන්ම, නිර්මාණය කරන්නා අල්ලාහ්ය. (ආහාර) සීමිත කරන්නාද, පරෝපකාරයෙන් ලබා දෙන්නාද, පෝෂණය කරන්නාද, බඩු මිළ පාලනය කරන් නාද ඔහුමය. මා කිසිවෙකුගේ ප්‍රාණයට හෝ දේපළට හෝ අසාධාරණයක් කර, 'මාහට ඔහු අසාධාරණය කළේය' යැයි මට කවරෙක් හෝ දොස් නොකියන ස්ථාවරයේ අල්ලාහ්ව බැහැදැකීමට කැමැත්තෙමි' යනුවෙන් ප්‍රකාශ කළේය.

(මූලාශ්‍රය : අහ්මද් හා සහීහ් අල්ජාමිඋ)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අල්ලාහ්ගේ මහානු භාවයට ඔබින පරිදි මෙහි ඔහුගේ ගුණාංග සනාථකර ඇත. නබිනායක මුහම්මදු (සල්) තුමා මෙම ගුණාංග අල්ලාහ්ට කෙසේ හිමි කළේද, එසේම, අපිද හිමි කළ යුතුයි. මක්නිසාදයත්, නිර්මාණයන් අතර අල්ලාහ් ගැන අධිකව දැන සිටින්නා නබිනායක තුමාය. මිනිසුන්ට අපරාධ කිරීම හා ඔවුන්ගේ සම්පත්වලට සහ දේපළට හානි සිදු කිරීම කෙරෙහි අවවාද කර ඇත.

වෙළඳ භාණ්ඩවල මිළ සහ ලාභය වංචා සහගත හෝ වැරදි සහගත හෝ නොවන බව මිනිසුන් දැන සිටින කළ වෙළඳුන්ට අවහිර කිරීමෙන් වැළකී සිටිය යුතුයි. නබිනායක තුමාගේ පරිපූරණ භක්තිය ගැනද, තම ස්වාමියා කෙරෙහි පවතින එතුමාගේ බියකම ගැනද හා එතුමාගේ යුක්තිය ගැනද සඳහන්කර ඇත.

**59**–හානිඋ බින් යසීද් (රලි) මෙසේ වාර්තා කරන්නේය.

ඔහු තම කණ්ඩායම සමග නබිනායක මුහම්මදු (සල්) තුමා හමුවට පණිවිඩයක් රැගෙන පැමිණ අවස්ථාවේ එම පිරිස් ඔහුව අබුල් හකම් (විනිශ්චය කරුවන්ගේ පියා) යැයි අඬගැසීම කෙරෙහි එතුමා සවන් දුන්නේය. වහාම එතුමා ඔහුව කැඳවා 'නියත වශයෙන්ම, හකම් (විනිශ්චයකරුවා) අල්ලාහ්ය. විනිශ්චය පවතින්නේ ඔහු සතුය. එසේ තිබියදී ඔබ අබුල් හකම් (විනිශ්චය කරුවන්ගේ පියා) යනුවෙන් කැඳවනු ලබන්නේ කුමක් නිසාද?' යනුවෙන් විමසීය.

එවිට ඔහු 'මාගේ සමාජයේ කිසියම් කරුණක් ආරාවුල කට ලක්වූ කළ ඔවුහු මා වෙත පැමිණෙති. මා ඔවුන් අතර විනිශ්චය කරමි. එය දෙපාර්ශයම පිළිගනිති' යනුවෙන් කීය. එයට නබිතුමා 'ආ මෙය උතුම් යහකමක් නේ ? ඔබට දරුවන් සිටින්නේද ? යැයි විමසූ කළ ඔහු 'මාහට ෂුරෛහ්, මුස්ලිම් හා අබ්දුල්ලාහ් යන දරුවන් (තිදෙනෙක්) සිටිති' යැයි කීය. මවුනතර ලොකු දරුවා කවරෙක්ද ? යනුවෙන් විමසූවිට ඔහු 'සුරෛහ්' යැයි කීය. එකළ නබිනායක තුමා 'එසේනම්, ඔබ අබූ සුරෛහ්ය' යනුවෙන් පැවැසීය.

(මූලාශ්‍රය : අබූදාවූද්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

විනිශ්චය කිරීමේ ගුණාංගයට හිමිකාරයා අල්ලාහ් (පම ණක්) බව මෙහි සනාථ වේ. ඔහු විනිශ්චය කරුවන් සැටම අග්‍ර විනිශ්චය කරුවාය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*තිරසාර විශ්වාසනීය සමාජයට විනිශ්චය කිරීමෙහි අල් -ලාහ්ට වඩා උතුම් වන්නයා කවරෙක්ද ?*

*(අල්කුර්ආන්-5:50)*

අල්ලාහ් තම ප්‍රකාශයන්හි, ක්‍රියාවන්හි හා පූර්ව සැලැස් මෙහි යුක්ති සහගත විනිශ්චය කරුවාය. පාලන බලය ඔහු සතුවම පවතින අතර, ක්‍රියාවන් සියල්ල යොමු කරනු ලබන් නේද ඔහු දෙසය. එසේම, සියළුම දේහි අවසන් විසඳුම ඔහු වෙතම පවතී. පරලොව දිනයේ මිනිසුන් අතරේ විනිශ්චය කරන්නේද, අපරාධ කළ අයගෙන් අපරාධයට ලක්වූ අයට යුක්තිය හා සාධාරණය ලබා දෙන්නේද ඔහුය. ඔහු කිසියම් අපරාධයකින් හා වංචාවකින් තොරව මිනිසුන් අතර ප්‍රශ්න කරයි. ඔහුගේ ප්‍රකාශයන් සත්‍යයෙන්ද, ඔහුගේ විනිශ්චය යුක්ති සහගතවද පවතී. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*තවද (ඔ : නබි,) ඔබ ස්වාමියාගේ ප්‍රකාශයන් (කියමන් හි) සත්‍යයෙන්ද, (ක්‍රියාවන්හි) යුක්තියෙන්ද පරිපූර්ණ විය.*

*(අල්කුර්ආන්-6:115)*

බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථවල නබි වදනක් 'ඔබ මගින්ම මම තර්ක කළෙමි. ඔබගෙන්ම මම යුක්තිය අයැදිමි' යැයි සඳහන්වේ. විනිශ්චය කරන්නා (අල්ලාහ්) පවිත්‍ර වන්තයාය. ඔහුගේ විනිශ්චය සමීක්ෂණය කරන කිසිවෙක් නොමැත. ඔහු සැම දේ ශ්‍රවණය කරන්නා හා ඥාන වන්තයාය.

**60**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව නවාස් බින් සම්ආන් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

(යුක්ති සහගත වූ) තුලාව රහ්මාන් (කරුණා වන්තයාවූ අල්ලාහ්)ගේ අතෙහි ඇත්තේය. (එමගින්) ඔහු සමහරයන් උසස් කරයි. අන් අය පහත් කරයි.

(මූලාශ්‍රය : ඉබ්නු මාජා)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අල්ලාහ්ට තුලාවක් ඇති බවත්, රහ්මාන් (අල්ලාහ්)ට අත් ඇති බවත් අල්කුර්ආනයෙන් සහ නබි තුමාගේ වදනෙන් සනාථවෙ. නමුදු, එය මිනිසුන්ගේ අත්වලට කිසිසේත් සමා නව නොපවතී. අසත්‍යය හා දොස්පද කියන්නන්ගේ කිය මන් කෙරෙහි අල්ලාහ් පවිත්‍ර වන්තයාය. මිනිසුන් උස් හා පහත් තත්ත්වයට පත්වන්නේ අල්ලාහ් මගිනි. අල්ලාහ් කව රෙකුව උසස් ස්ථානයට පත්කර ඇත්තේද හා කවරෙකුට ගරුත්වය ලබාදී ඇත්තේද, මිනිසුන් ඔහුගේ සම්බන්ධකම විසන්ධි කළත්, යථාර්ථයෙන් උසස් වන්තයා ඔහුමය.

එසේම, අල්ලාහ් කවරෙකුව පහත් ස්ථානයට පත්කර ඇත්තේද හා කවරෙකුව ඔහු අවනම්බුවට පත්කර ඇත් තේද, මිනිසුන් ඔහුට ගරුත්වය ලබාදී ඔහු වෙනුවෙන් උත් සව පැවැත්වුවද, යථාර්ථයෙන් නින්දිත වන්තයා ඔහුමය.

**61**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ නබිවදනක් අබූහුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

නියත වශයෙන්ම, අල්ලාහ්ගේ දකුණු අත පිරී පවතී. දානය කිරීමෙන් එය නොඅඩුවෙ. රාත්‍රියෙහි හා දහවල්හි ඔහු අහුරා ලබා දෙන්නේය. අහස් හා පොළොව නිර්මාණය

කළ දින සිට ඔහු දානය කරමින් සිටියත්, ඔහුගේ දකුණු අතෙහි (කිසිවක් හෝ) නොඅඩුව පැවැතීම ගැන ඔබ කල් පනා නොකළේද ? ඔහුගේ අර්ෂය (සිංහාසනය) පෙර ජල යෙහි පැවැතීය. ඔහුගේ අනෙක් (වම්) අතෙහි ග්‍රහණය කිරීමේ ගුණාංගය ඇත්තේය. (එබැවින්) රිස්කය (ජීවිතයට අත්‍යවශ්‍ය දේ) උසස් ලෙසද පහත් ලෙසද ලබා දෙයි.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අල්ලාහ්ට ඔහුගේ මහානුභාවයට ඔබින පරිදි අත් දෙකක් ඇති බව සනාථ වේ. එයට කිසියම් දෙයක් ප්‍රමාණ කිරීම ටද, උදාහරණ කිරීමටද, සමාන කිරීමටද හා එය ප්‍රතික්ෂේප කිරීමටද අපට නොහැක. ඔහුගේ එම දැතම යහපත හා අභිවෘධිය කිරීමෙහි දකුණු අත්ය. අල්ලාහ්ගේ විශාලමත් පරෝපකාරය හා දානය කිරීමේ උතුම් ගුණාංගය පැහැදිළි කර ඇත. ඔහුගේ භාණ්ඩාගාරය කුසලින් පිරී පවතින අතර, එය කිසියම් දිනක හෝ හිස්ව නොපවතී. අල්ලාහ්ට අර්ෂයක් (සිංහාසනයක්) ඇති බව මෙහි සනාථ වේ. එය පෙර ජලයෙහි පිහිටා තිබිනි.

නිසැකයෙන්ම, ක්‍රියාවන්, තරාතිරම්, කුසල් හා අකුසල් යනාදීන් කිරන තුලාවක් අල්ලාහ් වෙත ඇත්තේය. නියතව, ඔහු මිනිසුන්, සමාජයන් හා ක්‍රියාවන් අතර තමා කැමැති වන අය හා දෙය උසස් කරයි. එසේම ඔහු කැමැතිවන අය හා දෙය පහත් කරයි. ධනය වැඩිකිරීම, එමගින් මිනිසුන් පත්කිරීම හා උසස් කිරීම යනාදීන් අල්ලාහ්ගේ ක්‍රියාවන්ය. එය ඔහුගේ මහානුභාවයට ඔබින පරිදි පවතී.

අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ධනය අඩුකිරීමටත් වැඩිකිරීමටත් හැක්කේ අල්ලාහ්ට පමණකි. ඔබලා සියල්ලන්ම ආපසු ඔහු වෙතම යායුතුවේ.*
*(අල්කුර්ආන්-2:245)*

**62**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අනස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

අපායට සුදුස්සන් එහි පිවිසෙමින් සිටිති. එකල අපාය 'තවත් සිටින්නේද ? තවත් සිටින්නේද ?' යනුවෙන් අසමින් සිටී. අවසානයේ විශ්වය පාලනය කරන ස්වාමියා තම පාදය එහි තබයි. ඒවා එකට එක්වී තදබදයෙන් (අපාය) පිරී, 'ඔබගේ ගරුත්වය හා දයාව මත දිවුරා කියමි. ප්‍රමාණවත් වෙ, ප්‍රමාණවත්වෙ' යැයි අපාය පවසයි. (නමුත්,) ස්වර්ගය පුරප්පාඩුවෙන්ම පවතී. ඒ වෙනුවෙන් අල්ලාහ් මිනිසුන් පිළියළ කර, එම පුරප්පාඩුව පවතින තැන්වල පදිංචි කරවයි.
(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අල්ලාහ්ට ඔහුගේ මහානුභාවයට ඔබින පරිදි පාද ඇති බව මෙහි සනාථවේ. නමුත් ඒවා නිර්මානයන්ගේ පාදවලට සමානව නොපවතී. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔහු හා සමානව කිසිවක් හෝ නොමැත. ඔහු ශ්‍රවණය කරන්නා හා දර්ශනය කරන්නාය.*
*(අල්කුර්ආන්-42:11)*

අල්ලාහ්ගේ උතුම්භාවය හා ඔහුගේ බල පැවැත්ම මෙහි තහවුරුකර ඇත. ඔහුගේ අඩම්තෝට්ටම ඉතා උග්‍රව පවතී.

අල්ලාහ්ගේ අවසරයෙන් අපාය කතා කරයි. අල්ලාහ්ගේ කරුණාව ඔහුගේ කෝපය පසු කළේය. කොපමණනම්, ඔහු අපායයෙහි වැඩිවන අය එකට අකුලා වසා දමයි. ස්වර්ග යෙහි පවතින පුරප්පාඩු සඳහා වෙනත් මිනිසුන් පිළියෙළ කරයි. මෙහි අපායේ පවතින භයංකරය පිළිබඳව විග්‍රහකර ඇත. අල්ලාහ් අප සැම එකී භයංකරයෙන් ආරක්‍ෂා කරනු මැනවි.

නබි තුමාගේ ශ්‍රාවකවරුන් අල්ලාහ්ගේ නාම, ගුණාංග හා සැඟවුනු කරුණු පිළිබඳ නබිවදන් සවන්දී ඒවා විශ්වාස කළහ. ඒවා පිළිගෙන සත්‍ය කරමින් ඒ අනුව ක්‍රියා කළහ. එනම්, ඔවුහු ඒවා කිසිඳු සමාන කිරීමෙන්, ප්‍රමාණ කිරීමෙන්, උදාහරණ කිරීමෙන් හා ප්‍රතික්ෂේප කිරීමෙන් තොරව නබි වදනෙහි සඳහන් පරිදි එලෙසම තහවුරු කළහ.

**63**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අදී බින් හාතිම් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ඔබලාගෙන් කවරෙක් සමග හෝ ඔහුගේ ස්වාමියා කථා නොකර නොසිටී. එනමුත්, ඔහු හා ස්වාමියා අතර කිසියම් පරිවර්තකයෙක් හෝ නොසිටී. පසුව ඔහු තම දකුණු දෙස බලන කළ එහි ඔහු කළ ක්‍රියාවන් හැර කිසිවක් හෝ ඔහු නොදිටී. ඔහු තම වම් දෙස බලන කළ එහි ඔහු කළ ක්‍රියා වන් හැර කිසිවක් හෝ නොදිටී. ඔහු තම ඉදිරියෙහි බලන කළ එහි ඔහුගේ මුහුණට මුහුණලා අපාය හැර කිසිවක් හෝ නොදිටී. එබැවින්, ඉඳි අඩක ප්‍රමාණයක් දානය කර හෝ නරකාදියෙන් (ඔබලාව) ආරක්‍ෂාකර ගන්න.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අල්ලාහ්ගේ ප්‍රකාශයන් ඔහුගේ මහානුභාවයට ඔබින පරිදි පවතින බව සනාථ වේ. ඔහු පරලොව දිනයෙහි කිසි යම් පරිවර්ථකයෙකු හෝ නොමැතිව තම වහළා හා සමග කථා කරයි. පරලොව දිනයේ ප්‍රශ්න කරන කළ මිනිසාගේ ඉදිරියෙහි අපාය දර්ශණය කෙරේ. දානය කිරීම දඬුවමෙන් රැකවරණය ලබා දීමේ වැදගත් කරුණක් සහ අපායෙන් ආරක්‍ෂා කරන කරුණක්දවේ. මිනිසා කිසියම් කුසලක් හෝ අල්ප ලෙස නොසැළකිය යුතුයි. නිසැකයෙන්ම, කුසල් ක්‍රියාවන් මිනිසාගේ ජයග්‍රහණයට හේතුවේ. මිනිසාට තම කුසල් ක්‍රියාවන් හැර අන් කිසිවක් හෝ පරලොවෙහි කිසිඳු පලක් ලබා නොදෙන්නේය.

අල්ලාහ් මෙසේ පවසන්නේය.

*මෙම ග්‍රන්ථය ශක්ති වන්තයා හා සූක්‍ෂම වන්තයාවූ අල්ලාහ්ගෙන් සිට පහළ කරන ලද එකකි.*

*(අල්කුර්ආන්-45:2)*

**64**-ආයිෂා (රලි) තුමිය මෙසේ වාර්තා කරන්නීය.

'අල්ලාහ්ගේ දූතවරයාණෙනි, ලෛලතුල් කද්ර් නැමැති රාත්‍රිය ළඟාවූයේ නම්, මම කුමක් පිළිබඳව ප්‍රාර්ථනා කළ යුතුද ?' යනුවෙන් මම විමසීමි. එකළ නබිනායක මුහම්මදු (සල්) තුමා 'අල්ලාහුම්ම ඉන්නක අෆුවවුන් තුහිබ්බුල් අෆ්ව ෆඅෆු අන්නී' යනුවෙන් ඔබ ප්‍රාර්ථනා කරන්න' යනුවෙන් පැවැසීය.

(මූලාශ්‍රය : අහ්මද්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අල්ලාහ්ට ඔහුගේ මහානුභාවයට ඔබින පරිදි සමාව ලබා දීමේ හැකියාවද, ප්‍රිය කිරීමේ ගුණාංගයද ඇති බව සනාථ වේ. ඔහු මිනිසුන්ගෙන් සිදුවන වැරදි කමා කරන්නන් ප්‍රිය කරයි. අල්ලාහ් ප්‍රියකරන ගුණාංග තම ගුණාංග වශයෙන් මිනිසා සාදාගත යුතුයි. කුලිය ලැබෙන්නේ ක්‍රියාවන්ගේ වර්ග අනුවකි. කවරෙක් මිනිසුන්ගෙන් සිදුවන වැරදි කමා කරන්නේද, ඔහුගෙන් සිදුවන වැරදි අල්ලාහ් කමා කරයි. මිනිසා තම ස්වාමියගේ සමාව අපේක්ෂා කළ යුතු අතර, තම පාපයන් කෙරෙහි සමාව ලබාදී තම වැරදි කමා කිරීම සඳහා අල්ලාහ්ගෙන් පසුතැවිලිවී ප්‍රාර්ථනා කළ යුතුයි.

**65**–නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව ජාබිර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

පරලොව දිනයෙහි අපගේ ස්වාමියා (අල්ලාහ්) සිනහව මින් අපට දර්ශණය කරයි.

(මූලාශ්‍රය : මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අල්ලාහ්ට ඔහුගේ මහානුභාවයට ඔබින පරිදි පරලොව දිනයෙහි දර්ශණය කිරීමේ හැකියාව ඇති බව සනාථවේ. නිවැරදි නබිවදන් සාධක මත ඔහුට සිනහවීමේ ගුණාංග යද ඇති බව තහවුරු වේ. මෙය ඔහු තම යහපත් ශීලීන් ගරු කිරීම සඳහාය. ඔහු තම යහපත් ශීලීන්ට දර්ශණය කරන අතර, තම සතුරන්ට එය වසං කරයි. ඔවුහු ඔහුව බැහ නොදකිති.

**66**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබූ හුරෛරා (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

අල්ලාහ් මිනිසුන් දෙන්නෙක් පිළිබඳව සිනහවන්නේය. ඔවුන්ගෙන් කෙනෙක් තවත් කෙනෙකුව ඝාතනය කළේය. ඔවුන් දෙදෙනාම ස්වර්ගයෙහි සිටිති.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අල්ලාහ්ගේ මහානුභාවයට ඔබින පරිදි ඔහුගේ සිනහ වීමේ ගුණාංගය සනාථවී ඇත්තේ එකී බාහිර අර්ථය අනුවය. ඔහුගේ නම් පවිත්‍රවූ ඒවාය. ඔහුගේ දායාදයන් උතුම්වූ ඒවාය. නබිනායක තුමාගේ ශ්‍රාවකවරුන් ඒවා විශ්වාසකර, ඒවා සත්‍යය බව පිළිගෙන හා ඒ අනුව ක්‍රියා කළ බව නබි වදන්වල සඳහන්වේ. ඔවුහු ඒවා පිළිබඳව කලබල නොවූහ. කිසිවෙකුගෙන් හෝ නොවිමසූහ. කිසියම් විග්‍රහයක් හෝ නොකළහ. අල්ලාහ්ගේ සිනහය නිර්මානයන්ගේ සිනහය සේ නොපවතී. මන්දයත්, අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔහු හා සමනව කිසිවක් හෝ නොමැත. ඔහු ශ්‍රවණය කරන්නා හා දර්ශනය කරන්නාය.*

*(අල්කුර්ආන්-42:11)*

අල්ලාහ්ගේ කරුණාවෙහිද, පාපොච්චාරණය කරන්නන් ගේ පාපොච්චාරණය පිළිගැනීමෙහිද විශාලත්වය පිළිබඳව මෙහි සඳහන්වේ. කවරෙක් ඝාතනයක් කළ පසු ඒ ගැන අල්ලාහ්ගෙන් පාපොච්චාරණය කර, ඔහුගේ අණට කීකරුවී යහපත් භාවයෙන් ජීවත් වන්නේද, ඔහුගේ පාපොච්චාරණය අල්ලාහ් පිළිගෙන ඔහුට කමා කරයි. එසේම, ඔහුව ස්වර්ගයට ප්‍රවිෂ්ට කරයි.

67-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබූ හුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

දම්වැලින් විලංගු දමා ස්වර්ගයට ඇදගෙන යනු ලබන පිරිසක් ගැන අපගේ ස්වාමියා විමතියට පත්වේ.

(මූලාශ්‍රය : අබූදාවූද්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අල්ලාහ්ට ඔහුගේ මහානුභාවයට ඔබින පරිදි විශ්මයට පත්වීමේ ගුණාංගය ඇති බව සනාථවේ. නමුත්, මෙය නිර් මානයන් පත්වන විමතියට සමානව නොපවතී. මන්ද, 'ඔහු හා සමානව කිසිවක් හෝ නොමැත. ඔහු ශ්‍රවණය කරන්නා හා දර්ශනය කරන්නාය' (42: 11) යනුවෙන් අල්කුර්ආනයේ අල්ලාහ් පවසන්නේය.

සැබැවින්ම, මිනිසාගේ දර්ශණය කිරීමේ හැකියාව ඌණ තාවයෙන් පවතින බැවින් ඔහු සමහරවිට යහපත් දෙය තෝරා ගැනීමට අපොහොසත්වේ. කොපමණනම්, ඒ සඳහා ඔහුට වෙනත් කෙනෙකුගේ මග පෙන්වීම අවශ්‍යවේ.

මිනිසා සමහරවිට සත්‍යය පිළිගැනීම හා අසත්‍යයෙන් වැළකී සිටීම කෙරෙහි තමාට මග පෙන්වන්නාගෙන් ඔහු ඔහුට හිරහැර කළ හෝ වෙවා ප්‍රයෝජනය ලබාගනී. නියත වශයෙන්ම, මිනිස් හදවත අකුසල් ක්‍රියාවන් කෙරෙහි අධි කව උනන්දු කරයි. තම යහපත්ශීල මිත්‍රයා, උපදෙස් කරන යහළුවා හා කුසල් ක්‍රියාවන් කෙරෙහි උපකාර වන්නාගේ ශ්‍රේෂ්ඨත්වය පැහැදිළිකර ඇත. මේ ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

*යහකම්වල හා බියකම ඇති කරන කාර්යවල ඔබලා පරස්පරව උපකාර වන්න. පාපය හා සතුරුකම ඇතිකරන කාර්යන් කෙරෙහි ඔබලා පරස්පරව උපකාර නොවන්න.*
*(අල්කුර්ආන්-5:2)*

සමහර මිනිසුන් කුසල් ක්‍රියාවන් කෙරෙහි අන් අයගේ බලහත්කාරයට ලක්වෙති. පසුව ඔවුන්ගේ හදවත් ඒවාට කීකරුවී පිළිගැනීමෙන් එය සරලව පවතී. ස්වර්ගය මිනිසා පිළිකුල් කරන කරුණුවලින් වසා ඇත. සමහරවිට කුසල් ක්‍රියාවන්හි ආරම්භය හදවතට දුෂ්කර කරුණක් බව පවතී. මිනිසුන් අපායෙන් ආරක්ෂාවරණය ලබා ගැනීම සඳහා ඔවුන් සත්‍යය පිළිගැනීමට මුස්ලිම්වරයා ඔවුන්ට බලකළ යුතුයි. මිනිසුන් අකුසල තෝරාගන්නාකළ ඔවුන්ව ඔවුන්ගේ මනාපයට අත හැරිය නොයුතුයි. මෙම සමාජයේ ශ්‍රේෂ්ඨත්වය ගැන මෙහි පැහැදිළිකර ඇත. ඔවුන් පරස්පරව ස්වර්ගයට ඇදගෙන යන්නෝය.

**68**–අබ්දුල්ලාහ් බින් ෂක්හීර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

පුද්ගලයෙක් නබිනායක මුහම්මදු (සල්) තුමා වෙත පැමිණ 'ඔබතුමා කුරෛෂ්වරුන්ගේ නායකයාද ?' යැයි විමසීය. එයට එතුමා 'නායකයා අල්ලාහ්ය' යනුවෙන් පැවැසීය. පසුව ඔහු 'ප්‍රකාශයෙන් ඔබතුමා ඔවුන් අතර ශ්‍රේෂ්ඨයාය. තරාතිරමෙන් උතුම් වන්නයාය' යැයි කීය. එකළ එතුමා 'ඔබලගෙන් කවරෙක් හෝ (මා පිළිබඳව) ඔහු කී දේ පවසන්න. සාතාන් ඔහුව අභිබවා නොයා යුතුයි' යැයි පැවැසීය.
(මූලාශ්‍රය : අහ්මද්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

සෙයියිද් (නායකයා) යනු අල්ලාහ්ට පරිහරණය කරන වචනයකි. කවරෙකුගේ ශ්‍රේෂ්ඨත්වය හා උතුම්භාවය පරිපූර්ණයෙන් පවතින්නේද, කවරෙකුගේ දානය කිරීමේ හැකියාව සීමාවෙන් තොරව පවතින්නේද, කවරෙකුගේ කරුණාව පොදුවෙන් පවතින්නේද, මිනිසුන්ගේ හදවත්තුල කවරෙක් පිළිබඳ බියකම අධිකව පවතින්නේද සැබෑ නායකයා ඔහු මය. අල්ලාහ්ගේ නායකත්වය ඔහුගේ මහානුභාව සම්පන්න යට ඔබින පිරිදි පවතින අතර, එය කිසිසේත් මිනිසුන්ගේ නායකත්වයට සමානව නොපවතී. මක්නිසාදයත්, මිනිසාගේ නායකත්වය දුර්වල හා ඌණතා සහිතකි.

69-නබි මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ වදනක් බනූ ගිෆාර් ගෝත්‍රයේ විද්වතෙක් මෙසේ වාර්තා කරන්නේය.

නියත වශයෙන්ම, අල්ලාහ් වළාකුල නිපදවන්නේය. එය සියුම් ලෙස කථා කරයි. සියුම් ලෙස සිනහ වෙ.

(මූලාශ්‍රය : අහ්මද්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

නබිවදන්හි සඳහන් පරිදි කිසිදු සැක කිරීමකින් තොරව සත්‍යබව තහවුරු කර හා ඒවා වටහා දෙන කරුණු විශ්වාසකර අපි මෙම නබිවදන් පරිහරණය කළ යුතුයි. වළාකුල නිපදවීම, එය කථා කිරීම හා සිනහවීම එය නිර්මානය කළ තැනැත්තාගේ බලසම්පන්නයට සාධකයෙකි. ඔහු එය ආදර්ශයක් නොමැතිව නිර්මානය කළේය. ඔහුගේ ඥානය පරිපූර්ණයකි. සමහර මිනිසුන් හෙනය එගේ කථාව බවත්, අකුණ එගේ සිනහ බවත් නිගමනය කරති.

අල්ලාහ් පවසන්නේ මෙසේය.

*(වැස්ස උසුලා සිටින) තද වළාකුල නිපදුවේ ඔහුමය. හෙණ ඔහුව පවිත්‍රකර ප්‍රශංසා කරන්නේය. (එසේම) ඔහුගේ දේව දූතයන්ද ඔහුට බියවී ඔහුව ප්‍රශංසා කරන්නෝය. හෙණ එවන්නේ ඔහුමය. (පසුව) ඔහු තමා කැමැති අය එයට ලක් කරන්නේය. (නමුත්,) මවුහු අල්ලාහ් පිළිබඳව (ඔබගෙන්) තර්ක විතර්ක කරමින් සිටින්නෝය. තවද, (ඔවුන්ට දඬුවම් කිරීමට අල්ලාහ් මනාපවූයේ නම්, ඔවුන් ලිස්සී නොයා ඇල්ලීමෙ කෙරෙහි) ඔහු ඉමහත් බල සම්පන්නාය.*

*(අල්කුර්ආන්-13:12,13)*

**70**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ඉබ්නු උමර් (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ලුක්මාතුල් හකීම් තුමා 'නියතව, අල්ලාහ් වෙත කිසියම් දෙයක් හෝ භාර කළේනම්, ඔහු එය ආරක්‍ෂා කරයි.

(මූලාශ්‍රය : අහ්මද්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අල්ලාහ්ගේ ක්‍රියාවන් අතර, ආරක්‍ෂා කිරීමද එකකි. ඔහු මිනිසුන් සැමදෙනා කරන ක්‍රියාවන් සියල්ල ආරක්‍ෂා කරයි. මිනිසා තම ආගම, තම වගකීම් සහ තම ක්‍රියාවන්හි අවසානය අල්ලාහ් වෙත භාර කිරීම අනිවාර්ය වේ. ගමනක යෙදෙන්නා සමුගන්නා කළ ඔහු අමතා 'ඔබගේ ආගම, ඔබගේ වගකීම් හා ඔබගේ ක්‍රියාවන්හි අවසානය අල්ලාහ් වෙත භාර කරමි' යැයි ප්‍රාර්ථනා කළ යුතු බවට නිවැරදි නබිවදන් වටහා දෙන්නේය. මෙහි අල්ලාහ්ගේ පරිපූර්ණ

ඥානය හා ඔහුගේ දැනුම සඳහන්කර ඇත. සැබැවින්ම, ඔහු වෙත කිසියම් දෙයක් හෝ සැඟව නොපවතී. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*(ඕ : නබි, ඔබගේ) වචනය ශබ්ද නගා පැවැසුවද, නියතව, ඔහු රහස්‍යයද (එයටත් වඩා) සැඟව පවතින දෙයද දැන සිටින්නාය.*

*(අල්කුර්ආන්-20:7)*

**71**-අල්ලාහ් පැවැසූ බව නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ වදනක් අබූ සර්ද් අල්කුද්රි හා අබූ හුරෛරා (රලි) තුමාතත් මෙසේ වාර්තා කරන්නෝය.

නියත වශයෙන්ම, 'ගරුත්වය මගේ සරමකි. අහංකාරය මගේ සළුවකි. කවරෙක් හෝ මේවා දෙකෙන් එකක් හෝ කෙරෙහි මා සමග තරඟ කළේනම්, ඔහුව වේදනා කරමි' (මූලාශ්‍රය : මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

සියළුම හැකියාවන් හා සියළුම අහංකාරයන් අල්ලාහ්ට පමණක් හිමි බව මෙහි සනාථවේ. හැකියාව හා අහංකාරය පොදුවෙන් අල්ලාහ්ටම හිමි දෙයකි. මෙම ගුණාංග දෙකක් කෙරෙහි අල්ලාහ් සමග තරඟ කිරීම මිනිසාට තහනම්ය. මන්දයත්, මෙම ගුණාංග දෙක අල්ලාහ්ට පමණක් පෞද්ගලිකවූ හා හිමිවූ ඒවාය. ඔහුගේ දිව්‍යමයභාවය, කේවලත්වය හා මැඩ පවත්වා පාලන කරන හැකියාව යනාදීන් කවරෙකු මගින් හෝ ඔහුව අභිබවා යා නොහැකි බලවත් ශක්තිවන්තයා හා අහංකාර කරුවා බව වටහා දෙන්නේය.

මෙම ගුණාංග දෙකක් හෝ එයින් එකක් හෝ මිනිසා තම සතු කළේනම්, ඔහු තමාගේ ස්වාමියා සමග ඔහුගේ ගුණාංගයෙහි තරග කළේය. තම ස්වාමියාගේ මහානුභාව යට ඔහු ආදේශ කළේය. එහෙයින්, මිනිසා තම ස්වාමියාට කීකරුවීම, බියකමින් සිටීම හා යටහත්වීම යනාදි ගුණාංග යෙන් සිටීම අනිවාර්යවෙි. අල්ලාහ් මිනිසුන්ගෙන් අපේක්ෂා කරන්නේ මෙම වහල්භාවය වන අතර, එය ඔහු මිනිසුන්ට අනිවාර්ය කළේය. මෙහි අහංකාර කරුවන්ට හා මර්දනය කරන්නන්ට දැඩි අවවාදයක් හා තර්ජනයක් ඇත්තේය.

**72**–නබිනායක මුහම්මදු (සල්) තුමා පැවසූ බව අබූ මූසා අල් අෂ්අරී (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

තමාට කරන නින්දාව ගැන සවන් දෙමින් එය ඉවසා සිටින්නා අල්ලාහ්ට වඩා කවරෙක් හෝ නොමැත. මිනිසුන් ඔහුට ආදේශ කරන්නෝය. ඔහුට දරුවන් ඇති කරන්නේය. එසේ වුවද, ඔහු ඔවුන්ට ආහාර සපයන්නේය. (ඔවුන් අයැද සිටින දෙය) ඔවුන්ට ලබා දෙන්නේය.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අල්ලාහ් ඔහුගේ මහානුභාව සම්පන්නට ඔබින පරිදි ඔහුට කෙරෙන නින්දාවන් ඉවසා සිටී. මෙම ඉවසීම මිනි සුන්ගේ ඉවසීමට සමානව නොපවතී. ඔහු මිනිසුන් කෙරෙහි ඉමහත් කරුණා වන්තයා වන අතර, ඔහු ශක්ති වන්තයා හා දැඩි ලෙස දඬුවම් කරන්නාය. නමුත් ඔහුගේ කරුණාව ඔහුගේ කෝපයට වඩා අභිබවා පවතී. අල්ලාහ්ට ආදේශ කිරීම හා ඔහුට බිරිඳ සහ දරුවා ඇති කිරීම මහා පාපයකි.

අවිශ්වාස වන්තයා අල්ලාහ්ව ප්‍රතික්ෂේප කළත්, නියතව ඔහු ඔහුට අහාර සපයන්නේය. ඔහුට සමාව ලබා දෙන්නේය. පරලොව දිනයෙහි ඔහුගේ පාපයන් වෙනුවෙන් නිසි කුලිය ලබාදීම සඳහා ඔහුව (ලොවෙහි දඬුවම් නොකර) එසේම අත්හරින්නේය. මිනිසුන්ගේ කියමන් කරා අල්ලාහ් ශ්‍රවණය කිරීම ගැන මෙම වදනෙහි සනාථ වේ. මෙම ශ්‍රවණය කිරීමේ හැකියාවට උපමා කිරීම හෝ උදාහරණ කිරීම හෝ නොහැක. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔහු හා සමානව කිසිවක් හෝ නොමැත. ඔහු ශ්‍රවණය කරන්නා හා දර්ශනය කරන්නාය.*

*(අල්කුර්ආන්-42:11)*

# අල්ලාහ්ට අනවශ්‍ය ගුණාංග

**73**-නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බවට අබූ මලීහ් (රලි) තුමාගේ පියා මෙසේ වාර්තා කරන්නේය.

අල්ලාහ්ට කිසියම් සහකරුවෙක් හෝ නොමැත.

(මූලාශ්‍රය : අබූදාවූද්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

මෙය අල්ලාහ්ගේ දූතවරුන් සහ ඔහු පහළ කළ ධර්ම ග්‍රන්ථයන් අවවාද කළ දේහි සාරාංශයකි. එනම්, නියතව, අල්ලාහ් ඒකියකි. ඔහුට කිසියම් සහකරුවෙක් නොමැත. ලාඉලාහ ඉල්ලල්ලාහ්හි අර්ථයද මෙය වේ. ඔහු සැබැවින්ම වන්දනාමාන බලමහියට සුදුස්සාය. ඔහු ඔහුගේ කේවලත්වයෙහිද දිව්‍යමය භාවයෙහිද ඒකීකයාය. නාම සහ ගුණාංග කෙරෙහි (ඌණතාවලින්) පවිත්‍රවන්තයාය.

අල්ලාහ් මෙසේ පවසන්නේය.

*(නාම, ගුණාංග හා වෙනත් හැකියාවන්හි) ඔහුට සමාන වන්තයෙක් ඔබ දැන සිටින්නේද ?*

*(අල්කුර්ආන්-19:65)*

**74**-අල්ලාහ් පැවසූ බව නබිනායක මුහම්මදු (සල්) තුමා පැවසූ වදනක් ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

මිනිසා මාව අසත්‍ය කළේය. එය ඔහුට අනවශ්‍යයකි. මිනිසා මාව බැන්නේය. එය ඔහුට අනවශ්‍යයකි. ඔහු මාව අසත්‍ය කිරීම යනු ඔහු (නැසීගිය පසු) නැවත පෙර තත්ත්වයෙහි ඔහුව (මවා) ගෙන ඒමට මට හැකියාවක් නොමැති බව ඔහු සිතා ගැනීමකි. ඔහු මාව බැණීම යනු මාහට පුත්‍රයෙක් සිටින බව ඔහු කීමකි. මම බිරියෙක් හෝ පුත්‍රයෙක් රැගැනීම කෙරෙහි පවිත්‍ර වන්තයෙක්මි.

(මූලාශ්‍රය : බුහාරි)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

මිනිසුන් කෙරෙහි පවතින අල්ලාහ්ගේ කරුණාවෙ විශාලත්වය හා ඔහුගේ ඉවසීම ගැන මෙහි සඳහන්කර ඇත. නිවැරදි නබි වදන්වල සඳහන් පරිදි තමා සවන්දෙන නින්දා වන් කෙරෙහි ඉවසා සිටින්නා අල්ලාහ්ට වඩා කවරෙක් හෝ නොමැත. අල්ලාහ්ට බිරිය හා පුත්‍රයා නොමැති බව සනාථවෙ. නමුදු ඔහු ඒකියෙකි. කිසිඳු අවශ්‍යතාවයක් හෝ නොමැත්තෙකි. ඔහුට (යමෙකු) ඉපදුනේද නැත. වෙනත් කෙනෙකුට දාව (ඔහු) උපන්නේද නැත. තවද, ඔහුට සමානව කිසිවෙක් හෝ නැත.

මිනිසුන්ගෙන් සිදුවන පීඩාවන් කෙරෙහි ඉවසා සිටීම විශ්වාසනීය මිනිසාට අනිවාර්ය වේ. සැම දේ මවා පෝෂණය කරන ස්වාමියා මිනිසුන් විසින් අසත්‍ය කරමින් හා බැණ වැදිමින් සිටියදීත් ඔහු ඔවුන්ට දායාදයන් දානය කරමින් සිටී. එසේනම්, බෙලහීනතාවන් හා ඌණතාවන් ඇති මිනිසා ඔහු සමග කෙසේ හැසිරිය යුතුද ?

**75**–නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූ මූසා අල් අෂ්අරී (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

සැබැවින්ම, අල්ලාහ් නිදා නොගන්නේය. නිදාගැනීමද ඔහුට අනවශ්‍ය වේ. ඔහු තුලාව උස් හා පහත් කරයි. දහවල්හි කළ ක්‍රියාවන්ට පෙර රාත්‍රියෙහි කළ ක්‍රියාවන්ද, රාත්‍රියෙහි කළ ක්‍රියාවන්ට පෙර දහවල්හි කළ ක්‍රියාවන්ද ඔහු වෙත යොමු කරනු ලැබේ. ආලෝකය ඔහුගේ තිරයකි. ඔහු එය ඉවත් කළේනම්, ඔහුගේ මුහුණෙහි පවතින දීප්තිමත් ආලෝකය ඔහුගේ බැල්ම නිර්මානයන් දෙස කොපමණ දුරට පවතින්නේද, එවන් දුරට ඇති දේ (එනම්, නිර්මානයන්) සියල්ල දවා විනාශ කරයි.

(මූලාශ්‍රය : මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අල්ලාහ්ගේ පාලන බලය පරිපූර්ණයකි. ඔහු සදාතනිකද සමස්ත විශ්වයේ පාලකයාද වේ. ඔහු සැතපෙන්නේවත් නිද්‍රෝපගත වන්නේවත් නැත. නිද්‍රෝපගතවීම එක් බෙල හීනකමකි. එවන් බෙලහීනතාවන් කෙරෙහි අල්ලාහ් පවිත්‍ර වන්තයාය.

අල්ලාහ්ට ආලෝකමත් තිරයක් ඇති බව සනාථවේ. ඔහු සතුව (නිර්මානයන්ට ජීවනෝපායන් බෙදෙන) තුලාවක්ද ඇත්තේය. එයින් ඔහු තමා කැමැති අයට අඩුවෙන් හෝ වැඩියෙන් හෝ බෙදේ. සෑම දහවල්හි හා රාත්‍රියෙහි මිනිසා ගේ ක්‍රියාවන් අල්ලාහ් වෙත යොමු කරනු ලැබේ.

ඔහුගේ තේජසේ පරිපූරණත්වය, ඔහුගේ ආලෝකයෙහි මහානුභාවය හා ඔහුගේ අහංකාරකම පිළිබඳව මෙහි සඳහන්කර ඇත. ඔහු සෑම දෙය රැකබලා ගන්නා හා සෑම දෙනාගේ ක්‍රියාවන් ආරක්ෂා කරන්නාය. අල්ලාහ් මෙලෙස පවසන්නේය.

*නියත වශයෙන්ම, අල්ලාහ් අහස් සහ පොළොව යන දෙක ඒවාහි ස්ථානයෙන් වෙන් නොවන පරිදි ග්‍රහණය කරන්නේය. එසේ ඒවා දෙක එකී ස්ථානයෙන් වෙන්වූයේ නම්, එයින් පසු ඒ දෙක (වෙන් නොවී) ග්‍රහණය කරන්නා (ඔහු හැර) අන් කවරෙක් හෝ නොමැත. නිසැකයෙන්ම, අල්ලාහ් ඉමහත් ඉවසිලි වන්තයා හා ඉතා කමා කරන්නා ලෙස සිටී.*

*(අල්කුර්ආන්-35:41)*

අල්ලාහ්ගේ ගුණාංගයන් නබි වදන්වල කෙසේ සඳහන්ව පවතින්නේද, ඒවා කිසියම් ප්‍රමාන කිරීමෙන්, උපමා කිරීමෙන්, සමාන කිරීමෙන් හා ප්‍රතික්ෂේප කිරීමෙන් තොරව එසේම පිළිගත යුතුයි. ඒවා කුමණ අර්ථයෙහි අල්ලාහ්ගෙන් සිට සහ නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන් සිට පැමිණියද ඒවා එසේම විශ්වාස කළ යුතුයි.

# අල්ලාහ්ගේ දේව දූතවරුන්

76-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ඉබ්නු මස්ඌද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

මම ජිබ්රීල් (අලෛ) තුමාව දුටුවෙමි. ඔහුට පියාපත් හය සීයක් තිබිත.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

'ඔහුගේ අලංකාරමත් පියාපත්වල මුතු හා මැණික් පතුරු වන්නේය' යන අතිරේකය සමග මෙම නබි වදන අහ්මද් ග්‍රන්ථයෙහි සඳහන් වේ.

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

ජිබ්රීල් (අලෛ) තුමාට බොහෝ පියාපත් තිබීම අල්ලාහ් ගේ හැකියාවට සාධකයකි. ජිබ්රීල් (අලෛ) තුමාගේ මෙම රූපය ඉහත සඳහන් නබිවදනෙහි සඳහන් පරිදි අල්ලාහ් එතුමාව ප්‍රථමයෙන් නිර්මානය කළ රූපයද විය හැක. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔහු පියාපත් දෙක දෙක, තුන තුන සහ සතර සතර ඇති මලක්වරුන් (තම) දූතයන් වශයෙන් පත් කළ අයකි.*

*(අල්කුර්ආන්-35:1)*

ජිබ්රීල් (අලෛ) තුමාව පමණක් මෙවන් අධික සංඛ්‍යා පියාපත්වලින් විශේෂත්වය කිරීම එතුමාගේ තරාතිරම උසස් කිරීම සඳහා විය හැක.

# නබිනායක තුමාට වහී පහළවීම

77–ආයිෂා (රලි) තුමිය මෙසේ වාර්තා කරන්නීය.

හාරිද් බින් හිෂාම් (රලි) තුමා නබිනායක මුහම්මදු (සල්) තුමාව අමතා 'අල්ලාහ්ගේ දූතයාණනි, ඔබතුමාට වහී (දේව පිණිවිඩය) පහළවන්නේ කෙසේද ?' යනුවෙන් විමසීය. එකළ නබිනායක තුමා 'ඇතැම්විට සීනුවෙ නාදයක් සේ මා වෙත ඒවි. එය මාහට ඉතා බරපතල වශයෙන් පවතී. එම දේව දූතයා පාරායනා කර දුන් දෙය මා සිතුවිල්ලෙහි තබා සිටින කළ ඔහු මාගෙන් වෙන්වී යයි. සමහරවිට එම දේව දූතයා මිනිසෙකුගේ පෙනුමෙන් දර්ශණයවී මා සමග කථා කරයි. එකළ මා ඔහු පාරායනා කරන දෙය මාගේ සිතුවිල් ලෙහි තබා ගනිමි' යනුවෙන් පැවැසීය.

ආයිෂා (රලි) තුමිය 'උග්‍ර සීතල දිනවල (නබිතුමාට) වහී පහළවීම මම දිටීමි. එම දේව දූතයා නබිනායක තුමාගෙන් වෙන්වී පිටත්වන කළ (එම උග්‍ර සීතලයෙහිද) එතුමාගේ නළලෙන් දහඩිය වැගිරේ' යැයි පවසන්නීය.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

නබිනායක මුහම්මදු (සල්) තුමාට ක්‍රම දෙකක් මගින් වහී (දේව පණිවිඩය) පහළ විය. වහියෙහි බරපතලකම, අඛණ්ඩව පහළවීම හා එකී වැදගත්කම අනුව එය පහළ වන අවස්ථාවල එතුමා උග්‍ර අසීරුථාවයට පත්වන්නේය. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*(ම : නබි,) මෙම අල්කුර්ආනය අපි එක් කන්දක් මත පහළ කළේනම්, අල්ලාහ් කෙරෙහි පවතින භීතියෙන් එය වැව්ලී පැලී යාම ඔබ සැබවින්ම දකී.*

*(අල්කුර්ආන්-59:21)*

කුමක් හෝ ආකාරයෙන් උදාහරණයක් අවශ්‍ය බැවින්, නින්දිත දෙයක් මගින් උපමා කිරීම අනුමත වෙ. මක්නිසාද යත්, සීනුව නින්දිත දෙයක් වුවද, උපමා කර ඇත්තේ එකී නාදය පමණි. අල්ලාහ්ගේ අවසරයෙන් මලක්වරුන් මිනිසුන් ගේ පෙනුම දර්ශණයට ගනිති.

මෙහි මලක් යනු ජිබ්රීල් (අලෛ) තුමාය. පහළවන පණි විඩයේ බරකම, ප්‍රකාශයෙහි මහානුභාවය හා එයට නබි නායක මුහම්මදු (සල්) තුමා ලබා දුන් වැදගත්කම යනාදි යෙන් ඇතිවන ශරීරයේ සණකමින් එතුමා ශ්‍රමයට ලක් වන්නේය. ඒ සමග වහි පහළවීම දරා ගැනීමේ හැකියාව අල්ලාහ් එතුමාට ලබා දීම අල්ලාහ්ගෙන් සිට ලැබුනු සිතිඳු කමක් හා එතුමා හට උපකාරයක් වශයෙන්ද පැවැතීය. නොඑසේ නම්, 'අපි මෙම අල්කුර්ආනය එක් කන්දක් මත පහළ කළේනම්, අල්ලාහ් කෙරෙහි පවතින භීතියෙන් එය වැව්ලී පැලී යාම ඔබ සැබවින්ම දකී' යැයි අල්ලාහ් පවසන පරිදි එතුමාටද සිදුව ඇත.

# වහී ආරම්භවූයේ කෙසේද ?

**78**-අයිෂා (රලි) තුමිය මෙසේ වාර්තා කරන්නීය.

නබිනායක මුහම්මදු (සල්) තුමාට ප්‍රථමයෙන් නින්දෙහි දර්ශණයවන යහපත් සිහින මගින් දේව පණිවිඩ පහළවිය.

එතුමා දකින සිහිනයන් අරුණෝදය සේ පැහැදිලිවම පැවැතීය. පසුව එතුමා අසමානයෙන් තනිව සිටීමට ප්‍රිය කළේය. එතුමා අවශ්‍ය ආහාරයන් රැගෙන යාම් සඳහා තම පවුලේ අය වෙත පැමිණීමට පෙර බොහෝ රාත්‍රීන් හිරා ගුහාවෙහි අසාමානයෙන් රැඳී සිට වන්දනාමානවල යෙදී සිටින්නේය. (එම ආහාර අවසන්වූ පසු තම බිරියවූ) කදීජා (රලි) තුමිය වෙත පැමිණ නැවත (තවත් දින කීපයකට අවශ්‍ය) ආහාර රැගෙන යන්නේය.

මෙම තත්ත්වය හිරා ගුහාවෙහි සත්‍ය (වහී) පැමිණෙන තෙක් පවතීය. එනම්, (දිනක්) එක් මලක් වරයෙක් එතුමා වෙත පැමිණ 'පාරායනා කරන්න' යනුවෙන් පැවැසීය. එයට එතුමා 'මම පාරායනා කිරීමට නොදනිමි' යනුවෙන් කීය. (මේ පිළිබඳව එතුමා මෙසේ පවසන්නේය) පසුව ඔහු මම ශ්‍රමයට පත්වන තරමට මාව අල්ලා තදෙන් බදා ගත්තේය. පසුව මාව අතහැර 'පාරායනා කරන' මෙන් නැවත කීය. (එකළද මම) 'පාරායනා කිරීමට නොදනිමි' යනුවෙන් කීමි.

දෙවැති වතාවද මාව එතුමා මම ශ්‍රමයට පත්වන තරමට අල්ලා තදෙන් බදා ගත්තේය. පසුව මාව අතහැර නැවත 'පාරායනා කරන' මෙන් කීය. (එකළද මම) 'පාරායනා කිරී මට නොදනිමි' යනුවෙන් කීමි. තෙවැනි වතාවද මාව එතුමා මම ශ්‍රමයට පත්වන තරමට අල්ලා තදෙන් බදා ගත්තේය. පසුව මාව අතහැර මෙසේ පාරායනා කළේය.

*(සියළු දේ) නිර්මාණය කළ ඔබ ස්වාමියාගේ නාමයෙන් පාරායනා කරන්න. ඔහු අලක් නම් වූ තත්ත්වයෙහි සිට මිනිසාව නිර්මාණය කළේය. පාරායනා කරන්න. ඔබගේ*

*ස්වාමියා ඉමහත් කීර්ති වන්තයාය. ඔහු ලේඛනියෙන් මිනිසාට ඔහු නොදන්නා සියළු දේ ඉගැන්වූයේය.*

*(අල්කුර්ආන්-96:1-5)*

ආයිෂා (රළි) තුමිය මෙසේද පවසන්නීය.

පසුව එතුමා (එතැන් සිට) වෙවුලන සිතින් (තම බිරියවූ) කදීජා වෙතට පැමිණ මාව පොරවන්න, මාව පොරවන්න යනුවෙන් කීය. එතුමිය බිය නිවන තෙක් එතුමාව පොරවා තැබුවාය. එතුමා තමාට සිදුවූ දේ ගැන කදීජාට පැහැදිලි කර, තමා තම ජීවිතය ගැනද බියවන බව පැවසීය. එවිට කදීජා 'එසේ නොව, අල්ලාහ් මත දිවුරා කියමි, අල්ලාහ් ඔබතුමාට කිසි දිනක හෝ නින්දා නොකරයි. නියතව, ඔබ තුමා ඥාතීන් සමග එක්ව සිටින්නේය. පීඩාවට ලක්වූවන් ගේ බර උසුලන්නේය. නැති බැරි අයට උපයා දෙන්නේය. අමුත්තන් සළකන්නේය. යථාර්තයෙන් දුෂ්කරතාවයට ලක් වූවන්ට උපකාර කරන්නේය' යැයි කීවාය. පසුව එතුමාව තම කුඩා පියෙකුගේ පුත්‍රයාවන වරකා බින් නවෆල් වෙත එක්ක ගියාය.

අඥාන කාලයෙහි ක්‍රිස්තියානි ආගම වෙළඳ ගෙන සිටි වරකා හිබ්රු භාෂාවෙන් ලිවීමේ පළල් අවබෝධයක් ලබා සිටී කෙනෙකි. අල්ලාහ් කැමැති වූයේනම්, ඉන්ජීල් ග්‍රන්ථය හිබ්රු භාෂාවෙන් ලිවිමේ හැකියාවක් ලබා සිටී ඔහු ඇස් නොපෙනෙන වෘර්ධයෙකු ලෙස සිටීය. කදීජා (රළි) තුමිය ඔහු අමතා 'මාගේ පියාගේ සහෝදරයාගේ පුතනුවනී, ඔබ සහෝදරයාගේ පුතනුවන් කියන දෙයට සවන් දෙන්න' යනු වෙන් කීවාය. එවිට වරකා නබිතුමාගෙන් 'මාගේ සහෝදර යාගේ පුතනුවනී, ඔබ දුටුවෙ කුමක්ද ?' යැයි විමසීය.

එයට නබිනායක තුමා තමා දුටු දෙය විස්තර කළේය. (එයට සවන්දුන්) වරකා නබිනායක තුමා අමතා 'එය මූසා (අලෛ) තුමා වෙත පැමිණ නාමූස් (ජිබ්රීල්) තුමාය. ඔබගේ සමාජය ඔබව (ඔබ ගමෙන්) පලවා හරින කළ මා ජීවතුන් අතර ශක්තිමත් තරුණයෙකු ලෙස සිටිය යුතුනේ' යනුවෙන් පසුතැවිල්ලෙන් කීය. එකළ නබිනායක තුමා 'මාගේ සමාජය මාව පලවා හරීද ?' යැයි විමසූ කළ වරකා 'ඔව්. ඔබ රැගෙන පැමිණ සිටින දෙය (සත්‍යය) සේ ගෙන ආ කවර මිනිසෙකු හෝ (එකී සමාජය විසින්) විරෝධයට ලක් නොවී නොසිටීය. (ඔබ පළවා හරින) එම දිනයේ මා සිටියේනම්, මම ඔබට දැඩි ලෙස උපකාර කරන්නෙමි' යනුවෙන් කීය.

පසුව වරකා කෙටි කාලයක් ජීවත්වී උබාවයට පත්විය. මින් පසු වහී පැමිණීම මද කාලයක් නතරවිය.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබී වදනෙහි අන්තර්ගත කරුණු

වක්තෘවරුන් දකින සිහිනයන් සත්‍යයෙකි. ඉබ්රාහීම් නබිතුමා සිය දරුවා අමතා 'මාගේ පුතනුවනී, නියතව මම ඔබව කපා බිලි දෙනු බව සිහිනයෙහි දිටිමි (37:102)' යනුවෙන් පැවසූ බව අල්ලාහ් පවසන්නේය. කලබලයක් ඇති වන කළ හෝ වන්දනාමානය කිරීම හා මිනිසුන්ගෙන් ඈත් වීම වැනි යහපතක් වෙනුවෙන් අසාමාන්‍යයෙන් තනිව සිටීමට මෙම වදනෙහි සාධක ඇත්තේය. ගමනක යෙදීම වැනි හේතුන් මත ආහාර පානයන් රැගෙන යාමට හැක. මෙය අල්ලාහ් කෙරෙහි පවතින තවක්කුල (විශ්වාසය)ට පටහැනි නොවන අතර, මෙය හේතුන් මත සිදුවන එකකි.

ඉක්රඋ (පාරායනා කරන්න) යන පරිච්ඡේදය ප්‍රථමයෙන් පහළවූ අල් කුර්ආනයේ වැකියෙකි. මෙහි දැනීම, ඉගෙන ගැනීම, වටහා ගැනීම සහ පැහැදිලිවීම යනාදිය කෙරෙහි දිරිගන්වා ඇත. නබිනායක මුහම්මදු (සල්) තුමා ලියවීමට හෝ කියවීමට හෝ නොදන්නා උම්මි කෙනෙකු බව සනාථ වේ. ගුරුවරයා වැදගත් කරුණක් ශිෂ්‍යයාට කියන කළ ඔහු එය වටහා ගැනීම සඳහා ඔහුගේ ශරීරය අල්ලා පැහැදිලි කිරීමට හැක. වක්තෘවරුන්ද බියට පත්වන්නෝය.

මෙහි නබිනායක තුමාද සාමාන්‍ය මිනිසෙක් බව සනාථ වේ. කෙනෙක් තමා ලක්වූ පීඩාවන් හා කරදරයන් ගැන සිය බිරිඳට පැවසිය හැක. කදීජා (රලි) තුමියගේ පරිපූර්ණ බුද්ධිය, විශිෂ්ඨ ඥානය හා ඇගේ පැහැදිලි අදහස් මෙහි තහවුරු කර ඇත.

කුසල් කරන්නා අකුසලින් සිදුවන හානියෙන් ආරක්ෂාවරණය ලබයි. යහපත්ශීලීන් ආරක්ෂාගැනීම හා ඔවුන්ට යහපත් නිමාවක් ලබාදීම අල්ලාහ්ගේ නියමයකි. අල්ලාහ් කෙරෙහි හොඳ සිතුවිල්ල තැබීමද මේවා අතර එකකි. සැබැවින්ම, අල්ලාහ් තම ප්‍රේම වන්තයින්ට ආරක්ෂාවරණය ලබා දෙන්නා හා තම වහළුන්ට උපකාර කරන්නාය.

අල්ලාහ්ගේ සතුරන්ට ඔවුන්ගේ ක්‍රියාවන්ට සුදුසු දඬුවමක් වශයෙන් නින්දාව හා නපුරු නිමාව හිමිවේ. පවුල් ඥාතීන් සමග සුහදව හැසිරීම අල්ලාහ්ගේ වක්තෘවරුන්ගේ ගුණාංගය බැවින් ඒ ගැන දිරිගන්වා ඇත. මෙය මෙලොවෙහි හා පරලොවෙහි ජයග්‍රහණයට හා විමුක්තියට හේතුවක් වශයෙන් පවතී.

බෙලහීනයන්ට උපකාර කළ යුතු අතර, ඔවුන්ට උදව් කරුවෙක් හා සහාය කරුවෙක් වශයෙන් සිටිය යුතුයි. දුප්පතුන් හා දිළින්දන්ට ආදරය දක්වා ඔවුන්ට යහපත් ලෙස උපකාර කළ යුතුයි. මෙය නබිත්වයේ සත් ගුණධර්මයවේ.

එසේම ආගන්තුකයන් ගරු කළ යුතු අතර, දූත පිරිස්ට තෑගිභෝග හා උපකාර කළ යුතු බව සඳහන් වේ. මෙය අල්ලාහ්ගේ ගෞරවනීය වහලුන්ගේ ගුණාංගයන්ය. දුක් පීඩාවන්ට ලක්ව සිටින්නන්ට එයින් ඔවුන් මිදීම හා එය සරල කිරීම සඳහා උදව් උපකාර කළ යුතුයි. සත්‍ය ප්‍රකාශ කිරීම නබිනායක මුහම්මදු (සල්) තුමාගේ ගුණාංගයක් බැවින් එය ප්‍රකාශ කරන්නාට කුලිය හිමිවේ.

විශ්වාසනීය වගකීම් හා ගිවිසුම් නිසි ලෙස ඉටු කරන මෙන් දිරිගන්වා ඇත. කවරෙක් මිනිසාට ගරු කරන්නේද ඔහුට අල්ලාහ් ගරු කරයි. කරදර හා පීඩාවට ලක්වූ අය සැනසුම් කිරීම හා එය සරල කිරීම සතුටුදායක කරුණකි. උදව් කිරීම හා උපදෙස් දීම යන බිරිඳකගේ ශීලාචාර ක්‍රියා වන් තම සැමියාට පලදායිකව පවතී.

ධර්ම ග්‍රන්ථ පිළිබඳ ඥානය ඇති විද්වතුන්ගෙන් ඔවුන් ගේ ඥානය පරීක්ෂාකර බැලීමේ හා පාඩමක් ගැනීමේ අදහසින් ඔවුන් පවසන දේ කෙරෙහි සවන්දීමට හැක. සියළුම වක්තෘ වරුන්ගේ කැඳවීමේ කාර්ය එකමකි. ඔවුන්ගෙන් සමහරුන් තවත් සමහරුන්ව සත්‍ය කළහ.

අල්ලාහ්ගේ දූතවරුන් පිළිපදින්නන්ට අනිවාර්යයෙන්ම විරුද්ධකම් ඇතිවේ. මෙය පෙර කාලයේ විසූ ජනතාවගේ සිරිතක්වන අතර, මෙය (මෙසේ සිදුවිය යුතු බව අල්ලාහ්

විසින්) තීරණය කරනලද නියමයකි. අල්ලාහ් වක්තෘවරුන් හා සැබෑ විශ්වාසීන් සෝදිසි කිරීම සඳහා ඔවුන්ට පීඩාවන් ඇති කළේය. නමුදු ඔවුන්ට යහපත් නිමාවක් ඇති වේ.

අත්දැකීම් ලත් අය පවසන දේට සවන්දීම හා ඥානය කවරෙක් පැවැසුවද ඒවා ලබා ගැනීම කෙරෙහි දිරිගන්වා ඇත. නබි (සල්) තුමාට සිදුවූ සිද්ධිය පිළිබඳව පහළවූ සිය ළුම පැරණි ධර්ම ග්‍රන්ථවල හෝ සමහර ග්‍රන්ථවල සඳහන් වේ. ජිබ්රීල් (අලෛ) තුමා නබි (සල්) තුමා වෙත පැමිණි සේම නබි මූසා (අලෛ) තුමා වෙතද පැමිණ ඇත්තේය.

**79**-වහී පණිවිඩය පහළවීම විසන්ධිවූ කාල පරිච්ඡේදය පිළිබඳව නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ජාබිර් බින් අබ්දුල්ලාහ් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

මා ඇවිදමින් ගමන් කරන කළ අහසින් ඇසූ හඬෙන් මා හිස ඔසවා බැලීමි. එවිට, හිරා ගුහාවේ මා වෙත පැමිණි දේව දූතයා අහස හා පොළොව අතර එක් සිංහාසනයක වාඩිවී සිටීම දුටු මම තිගැස්සී බියට පත්වීමි. වහාම මම (මාගේ නිවසට) පැමිණ (කදීජාගෙන්) 'මාව පොරවන්න. මාව පොරවන්න' යැයි කීමි. පසුව මාව පොරවා තැබූහ. එකළ අල්ලාහ් මෙසේ පහළ කළේය.

*අහෝ, පොරවාගෙන සිටින්නානෙනි, ඔබ නැගිටින්න. පසුව (අල්ලාහ්ගේ දඬුවම ගැන මිනිසුන්ට) අවවාද කරන්න. තවද, ඔබ ස්වාමියාව ආඩම්බර කරන්න. තවද, ඔබගේ ඇඳුම් පවිත්‍රයෙන් තබා ගන්න. තවද, අපවිත්‍රය අප්‍රිය (කර ඉවත්) කරන්න.*

*(අල්කුර්ආන්-74:1-5)*

අපවිත්‍රය යනු පිළිමයන්ය. මින් පසු වහී පණිවිඩය අඛණ්ඩව පහළවිය.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

ප්‍රථමයෙන් වහී පහළවූයේ හිරා ගුහාවේය. එය '(සියළු දේ) නිර්මාණය කළ ඔබගේ ස්වාමියාගේ නාමයෙන් පාරායනා කරන්න ...' යනු වැකියකි. කදීජා (රලි) තුමිය නබි නායක මුහම්මදු (සල්) තුමාගේ (දෑවා) කැඳවීමේ කටයුතු වලට සහාය දැක්වූ බැවින් එතුමියගේ ශ්‍රේෂ්ටත්වය මෙහි පැහැදිලි කර ඇත. අහස් හා පොළොව අතර අසුන්ගෙන සිටියේ ජිබ්රීල් (අලෛ) තුමාය. මෙයට පෙරද එතුමා පැමිණ බව සනාථ වේ. දේව දූතවරුන් විවිධ රූපවලින් දර්ශණය කරවීමට අල්ලාහ් ශක්ති වන්තයාය. අල්ලාහ්ගේ වක්තෘවරුන්ටද බිය ඇතිවන්නේය. වහී විවිධ අවස්ථාවල පහළ විය. ඒවා අතර සමහර වහී අඛණ්ඩව හා අධික වශයෙන් පහළවීමෙන් ඒවා වැදගත්ව පැවැතීය.

ඇඳුම් කිලිටු නොවන සේ පිරිසිදුව තබා ගත යුතු බව මෙහි සඳහන්වේ. මේ හේතුව මත සමහර විද්වතුන් සලාතය ඉටු කිරීමට ඇඳුම් පිරිසිදුවෙන් පැවැතිය යුතු බව කොන් දේසි පනවා එයට මෙම අල්කුර්ආන් වැකිය සාධක ලෙස ඉදිරිපත් කරති. නබිතුමාගේ ශ්‍රවකරුවන් සුළු ප්‍රශ්නවල පවා මතභේදවලට පත්වූ බව මෙහි පැහැදිලිවේ. ප්‍රථමයෙන් පහළවූයේ ඉක්රඋ පරිච්ජේදය බව ආයිෂා (රලි) තුමිය හා වෙනත් සමහරුන්ගේ මතයකි. නමුත්, ජාබිර් (රලි) තුමාගේ මතය වනුයේ සූරා මුද්දස්සිර් යන පරිච්ජේදය බවය.

'නැගිට (මිනිසුන්ට) අවවාද කරන්න' යන වැකියේ තේරුම 'ඔබ විශ්වාස නොකර සිටින්නන්ට වේදනාව ඇති බව අව වාද කරන්න' යන්නේය.

# වහීයෙහි බරපතලකම

**80**-උබ්බාදා බින් සාමිත් (රලි) තුමා නබිවදනක් මෙසේ වාර්තා කරන්නේය.

නබිනායක මුහම්මදු (සල්) තුමාට වහී පහළවන කළ එතුමා ශ්‍රමයට පත්වේ. එයින් එතුමාගේ මුහුණ දූවිලි පටල යට අසුවූ දෙයක් සේ වෙනස් වේ.

(මූලාශ්‍රය : මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

වහී පහළවන කළ ශ්‍රමයට පත්වීම යනු එයට අධික වැදගත්කමක් ලබා දීමකි. මුහුණ වෙන්සවීම යනු එය රතු පැහැයට පත්වීමකි. මක්නිසාදයත්, එතුමාට පහළවන වහී අල්ලාහ්ගේ ප්‍රකාශය බැවින් එය එතරම් වැදගත් හා සණ සහගතව පවතී. එහි අණ කිරීම්, වළක්වාලීම්, අවවාද කිරීම් හා ළදරුවන්ගේ හිස කෙසේ පැසෙන, ඇඟ කිළිපොළා යන හා එකී භයංකරයෙන් හදවත් වැවුළෙන පණිවිඩ අන්තර් ගතවේ. සැම දේ රැක ගන්නා අල්ලාහ්ය.

**81**-*'(ඕ : නබි, මෙම වහිය කඩිනමින් කටපාඩම් කිරීම සඳහා ඔබ දිව නොසොලවන්න. (75:16)'* යන අල්කුර්ආන යේ වැකිය පිළිබඳව ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

නබිනායක මුහම්මදු (සල්) තුමාට වහී පහළවන කළ එතුමා ශ්‍රමයට පත්වන්නේය. එය එතුමා සිය තොල් දෙක සොලවීමෙන් පැහැදිළිවෙ. එකළ අල්ලාහ් '(මි : නබි, මෙම වහිය කඩිනමින් කටපාඩම් කිරීම සඳහා ඔබ දිව නොසොල වන්න. එය (සිතුවිල්ලලෙහි) තැන්පත් කිරීමද, (ඔබ දිවෙන්) පාරායනා කරවීමද අපගේ වගකීමකි. එබැවින්, අපි (ජිබ් රීල් මගින්) එය (ඔබට) පාරායනා කරන කළ ඔබ එය අනු ගමනය කරමින් පාරායනා කරන්න. පසුව ඒවාහි අර්ථය වටහා දීමද අපගේ වගකීමකි. (75:16-19) යනුවෙන් පැවැසූ වැකිය පාරායාතා කළ ඉබ්නු අබ්බාස් (රලි) තුමා, නබි (සල්) තුමා තම තොල් දෙක සොලවූ සේ මා සොලවමි යැයි පවසා තම තොල් දෙක සොලවා පෙන්නුවේය.

මෙම වැකි පහළවීමෙන් පසු නබිනායක තුමා වෙත ජිබ් රීල් (අලෛ) තුමා පැමිණ කළ (පාරායනා කිරීම සඳහා එතුමාට) සවන්දී අසා සිටීම සිරිතක් වශයෙන් පත්කර ගත් තේය. ජිබ්රීල් (අලෛ) තුමා සමුගත් පසු එතුමා පාරායනා කළ සේම නබිනායක තුමාද පාරායනා කළේය.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අල්කුර්ආනය කල්පනාකාරීව පාරායනා කළ යුතුයි. වහී පහළවන අවස්ථාවල නබිනායක මුහම්මදු (සල්) තුමා තම මුළු අවධානයම එය කරා යොමු කිරීමෙන් හා එයට අධික වැදගත්කමක් ලබා දීමෙන් එය බරක් හා දුෂ්කරයක් බවට පත්විය. අපහාස කිරීමේ හා විහිළු කිරීමේ චේතනාවෙන් තොරව යහපතක් උදෙසා කෙනෙක් කතා කරන සේ හා ක්‍රියා කරන සේ සංඥාකර පෙන්නුම් කිරීමට හැක.

අල්ලාහ් තම ගෞරවනීය අල්කුර්ආන් ග්‍රන්ථය විනාශ නොවී ආරක්ෂා කිරීමට වගකීම් භාරගෙන සිටී. නබිනායක මුහම්මදු (සල්) තුමා ලිවීමට හා කියවීමට නොහැකි උම්මි කෙනෙක් වුවද අල්ලාහ්ගේ ග්‍රන්ථය කටපාඩම් කර තම හදවතෙහි තැන්පත් කළේය.

මෙය භාස්කමකි. තමා කළ ප්‍රකාශයක් පිළිබඳ විවරණ යක් එම අවස්ථාවේදීම නොකර ප්‍රමාද කිරීමට හැක. අල් කුර්ආනයේ අර්ථය වටහා ගැනීම හා ඒ ගැන පර්යේෂණ කිරීම සඳහා එය පාරායනා කෙරෙන කළ එයට සාවදාන යෙන් සවන් දීම ආගමානුකූල කරුණකි.

ගුරුවරයා කියන දේට සාවදානයෙන් කන් දීමේ හා ඔහු කතා කරන කළ බාධා නොකර නිශ්ශබ්දව සිටීමේ වැද ගත්කම මෙහි පැහැදිළිකර ඇත. ඉගෙන ගන්නා කරුණු කටපාඩම් කිරීමටත්, ඒවා හදවතෙහි තැන්පත් කිරීමටත් ඒවා අමතකවීමෙන් හා විනාශවීමෙන් තොරව ආරක්ෂා කිරී මටත් දිරිගන්වා ඇත. ගුරුවරයා කියූ පසු එය නැවත කීම හා ඔහු කියන කළ එයට සවන්දීම ගැන සඳහන්කර ඇත. විද්වතුන්ගේ දේශනයට සවන්දීම හා ඒවා පිළිගැනීම මගින් ඔවුන්ගෙන් දැනුම් ඥානය ලබාගත යුතුයි.

කෙනෙක් දැනුම් ඥාන සියල්ල එකම අවස්ථාවේ ලබා ගැනීමට අදහස් කළේනම් ඔහු ඒවා සියල්ල විනාශ කළේය. හදවතෙහි තැන්පත් කළ ඥානයන් පසු අවස්ථාවල නැවත බැලිය යුතුයි. එය 'ජිබ්රීල් (අලෛ) තුමා සමුගෙන පිටත්වූ පසු එතුමා පාරායානා කළ සේම නබිනායක තුමාද පාරා යනා කළේය' යන වාක්‍යයෙන් වටහාගත හැක. දැනුම්

ඥානය ලබා ගැනීමට වෙහෙස දැරිය යුතු අතර, එයින් ඇතිවන දුෂ්කරතාවන් ඉවසා සිටිය යුතුයි. මන්දයත්, දැනුම් ඥානය එතරම් වැදගත් එකකි.

# වේශධාරීන්ගේ සළකුණු

අල්ලාහ් මෙසේ පවසන්නේය.

*නියතවශයෙන්ම, වේශධාරීන් අල්ලාහ්ට වංචා කිරීමට අදහස් කරති. නමුදු, ඔහු ඔවුන්ට වංචා කරන්නෙකු ලෙස සිටී. තවද, සලාතය ඉටු කිරීම සඳහා ඔවුන් සිටගත් කළ කම්මැලියන් ලෙස සිට ගනිති. මිනිසුන්ට (තමන්ද සලාතය ඉටු කරන්නන් ලෙස) පෙන්වීම සඳහා (සිටිති.) තවද, ඉතා සුළු වශයෙන් හැර ඔවුන් අල්ලාහ්ව සිහි නොකරති.*

*(අල්කුර්ආන් - 4:142)*

**82**- නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබූ හුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

වේශධාරිගේ සළකුණු තුනකි. ඔහු (යමක්) ප්‍රකාශයක් කළේනම්, අසත්‍යය පවසයි. ගිවිසුමක් කළේනම්, එය බිඳ දමයි. විශ්වාස කළේනම්, ද්‍රෝහිකම් කරයි.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අවස්ථාවාදය, ක්‍රියාව හා ප්‍රතිපත්තිය යන කොටස් දෙක කට ඇතුළත් වේ. මෙහි අදහස් කර ඇත්තේ ක්‍රියාව පිළි බඳ අවස්ථාවාදයකි. සමහරවිට මුස්ලිම්වරයෙක් මත අවස්ථා වාදයෙහි එක් සළකුණක් හෝ අධික සළකුණු පැවැතීමට

හැක. අවස්ථාවාදයට බොහෝ කොටස් ඇත්තේය. ඒවායින් සමහරයන් ඉතා නපුරු සහගත කරුණුය.

මෙවන් කරුණුවල ඕනෑකමින් රැඳී සිටින්නා අවස්ථාවාදියාය. අවස්ථාවාදයේ සළකුණු අවස්ථාවාදියාව හඳුන්වා දෙයි. බොරු කීම වෙශධාරීන්ගේ සළකුණක් බැවින්ද, කළ ගිවිසුම ඉටු නොකර පැහැර හැරීම විශ්වාසීන්ගේ ගුණාංගයක් නොවන බැවින්ද ඒවා තහනම්කර ඇත. එසේම, විශ්වාසය මත භාරකරන ලද වගකීම්වලට ද්‍රෝහිකම් කිරීමද තහනම්ය. මෙසේ ද්‍රෝහිකම් කරන්නා වෙශධාරියෙකි. ක්‍රියාව පිළිබඳ අවස්ථාවාදය ප්‍රතිපත්තිමය පිළිබඳ අවස්ථාවාදය සේ ආගමෙන් පිටමන් කරන කරුණක් නොවන අතර, එයද මහා පාපයෙන් එකකි.

**83**–නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබ්දුල්ලාහ් බින් අම්ර් (රලි) මෙසේ වාර්තා කරන්නේය.

කවරෙක් මත ගුණාංග හතරක් තිබේද, ඔහු පැහැදිලි අවස්ථාවාදියෙකි. තවද, කවරෙක් මත මෙයින් එක් ගුණාංගයක් හෝ තිබී එය ඔහු අත්හරින තෙක් අවස්ථාවාදයේ එම ගුණාංගය ඔහු මත රැඳී පවතී. ඒවා ඔහු විශ්වාස කළේනම් ද්‍රෝහිකම් කරයි. ඔහු යමක් ප්‍රකාශ කළේනම් අසත්‍ය පවසයි. ඔහු ගිවිසුමක් කළේනම්, එය බිඳ දමයි. ඔහු තර්ක කළේනම්, පාපයෙහි යෙදෙයි.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අවස්ථාවාදය විවිධ වර්ග හා කරුණු මත පවතී. මෙහි සඳහන් කළ ඇත්තේ සළකුණු කීපයක් පමණකි. මේවාට

අමතරව වෙශධාරීන්ගේ ගුණාංග තව කීපයක් ඇත්තේය. මිනිසුන් අවස්ථාවාදයේ විවිධාකාරයෙන් සිටිති. එනම්, සම හරුන් ස්වල්ප අවස්ථාවාදයෙන්ද, තවත් සමහරුන් අධික අවස්ථාවාදයෙන්ද, වෙනත් සමහරුන් මුළු අවස්ථාවාදයෙන්ද සිටිති.

ගිවිසුම් කරන කළ වංචා කිරීම තහනම්ය. එය අවස්ථා වාදීන්ටම අයත් විශේෂ ගුණාංගයෙකි. යම් කරුණක් ගැන තර්ක කරන කළ සත්‍යයට පටහැනිව කථා කිරීමද තහ නම්ය. එය අවස්ථාවාදය හා ආගම කෙරෙහි නොසැළකිලි කම ඇති බවට තහවුරු කරයි.

**84**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අනස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

අන්සාර්වරුන් ප්‍රියකිරීම විශ්වාසයේ සළකුණකි. අන්සාර් වරුන් අප්‍රිය කිරීම අවස්ථාවාදයේ සළකුණකි.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අන්සාර්වරුන්ගේ ශ්‍රේෂ්ඨත්වය පැහැදිලිකර ඇත. ඊමාන (විශ්වාස)යට සළකුණු සහ ලකෂණ කීපයක් ඇත්තේය. එසේම, අවස්ථාවාදයටද සළකුණු හා ලකෂණ කීපයක් ඇත් තේය. අන්සාර් යනු නබිනායක මුහම්මදු (සල්) තුමා මක් කාවෙන් සිට මදීනාවට හිජ්රත් (හැර) ගිය අවස්ථාවෙහි එතුමාට උදව් උපකාර කළ අයට ඉස්ලාමය කළ නාමයකි. මෙම නාමය අල්කුර්ආනය හා නබිනායක තුමාගේ වදන් වලද සඳහන්ව පවතී.

මිනිසුන් කළ ක්‍රියාවන් හා ඔවුහු මුහුණදුන් පීඩාවන් අනුව ඉස්ලාම්හි ඔවුන්ගේ උස් හා පහත් තත්ත්වය පවතී. නබිනායක මුහම්මදු (සල්) තුමාට උදව් කිරීම මගින් අන් සාර්වරුන් මෙම ශ්‍රේෂ්ඨත්වයට පත්වූහ. මෙමගින් ඉස්ලාම් ආගමට උපකාර කරන්නන් ප්‍රිය කිරීමද ඊමානයේ එක් අංගයක් බව සනාථවේ.

එසේම හදවතෙන් සිදුවන කුසල් ක්‍රියාවන්ද ඊමානයේ අංගයෙකි. ඊමාන් යනු කුසල් ක්‍රියාවන් හෙයින් මිනිසුන් අතර එය උස් හා පහත් තත්ත්වයෙන් පවතී. එනම්, කුසල් ක්‍රියාවන් අනුව මිනිසාගේ ඊමානය සමහර අවස්ථාවල උසස් වේ. තවත් සමහර අවස්ථාවල පහත් වේ. ප්‍රිය කිරීම සහ අප්‍රිය කිරීම කුලිය සහ දඬුවම ලබා දෙන ක්‍රියාවන්ය.

# දේව ප්‍රතික්ෂේපයෙහි උස්, පහත් තත්ත්වය

**85**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබ්දුල් ලාහ් බින් මස්ඌද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

මුස්ලිම්වරයෙකුට බැණීම පාපයකි. ඔහුව ඝාතනය කිරීම (දේව) ප්‍රතික්ෂේපයෙකි.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

විශ්වාස වන්තයා තමා නොදැන සිටින ආකාරයෙන් තමාගේ කුසල් ක්‍රියාවන් විනාශවී දැයි බියවිය යුතුයි. සම හර විද්වතුන් 'ආගමෙන් පිටමන් කරන සැබෑ ප්‍රතික්ෂේපය

(කුෆ්රය) මෙහි සඳහන් කර නොමැති අතර, තදෙන් අව වාද කිරීම සඳහා ප්‍රතික්ෂේප කිරීම යන වචනය භාවිතා කර ඇත' යනුවෙන්ද, තවත් සමහර විද්වතුන් 'කවරෙක් මුස්ලිම් වරයෙකුව ඝාතනය කළ හැකි බව අනුමත කරමින් ඝාතනය කරන්නේද, ඔහුට (ධර්මයෙන් පිටමන් කරන) ප්‍රතික්ෂේපය යොදවනු ලැබේ' යනුවෙන්ද පවසති.

මහා පාප ක්‍රියාවන් මිනිසාව මහා පාපියෙක් ලෙස පත් කරන බව මෙහි සඳහවන්වේ. ඔහු මුස්ලිම්වරයෙක් වුවත්, ඔහු කළ මහා පාප ක්‍රියාවන් හේතුවෙන් ඔහු මහා පාපි යෙක් ලෙසට පත්වේ.

මුස්ලිම් වරයොගේ නම්බුව රැකීම සඳහා ඔහුට බැණ වැදීම තහනම්ය. කේළාම් කීම, නින්දා කිරීම, ශාප කිරීම හා විකටකම් කිරීම යනාදීන්ද මෙම තහනමෙහි අන්තර් ගතව පවතී. එසේම, මුස්ලිම් වරයෙකුව ඝාතනය කිරීමද තහනම්ය.

මුස්ලිම් වරයෙකුව ඝාතනය කිරීමට හැකි බව අදහස් කරන්නා කාෆිර් (දේව ප්‍රතික්ශේප කරන්නා)ය. මෙය කෙටි වදනක් වුවත්, නබිනායක තුමාගේ භාෂා ශෛලය අඩංගු ගැඹුරු හා විශාල අර්ථ ලබා දෙන වදනකි. මෙය (කුඩා) වැකි දෙකකින් සමන්විත කොටස් දෙකක් වුවද, මෙහි නීතිරීතීන් අධික වශයෙන් අන්තර්ගතව පවතී.

# මහා පාපයෙන් මුස්ලිම්වරයෙක් කාෆිර් නොවීම

**86**-බද්ර් යුද්ධයට සහ අකබා ගිවිසුම කළ අවස්ථාවට සහභාගිවූ නායකයෙක් වූ උබාදා බින් සාමිත් (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

තම ශ්‍රාවකවරුන් පිරිසක් පිරිවරා සිටි එක් අවස්ථාවක නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පැවැසීය.

ඔබලා කිසිවක් හෝ ආදේශ නොකරන බවද, සොරකම් නොකරන බවද, දුරාචාරයෙහි නොයෙදෙන බවද, ඔබලා ගේ දරුවන් ඝාතනය නොකරන බවද, ඔබලාගේ ඇත් හා කකුල් අතරෙහි කාල්පනික දොස්පද නොගොතන බවද, කිසිදු කුසල් ක්‍රියාවන්හි හෝ වෙනස්කම් නොකරන බවද මා වෙත දිවුරුම් ප්‍රකාශ කරන්න.

ඔබලාගෙන් කවරෙක් ඒවා ඉටු කරන්නේද, ඔහුට අල්ලාහ්ගෙන් කුලිය ලැබේ. කවරෙක් හෝ මේවායින් කුමක් හෝ කර, (ඒ සඳහා) මෙලොවෙහි දඬුවමකට ලක්කරනු ලැබේ නම්, එය ඔහුට ප්‍රතිකාරයක් බව පවතී. කවරෙක් මේවායින් කුමක් හෝ කර, පසුව අල්ලාහ් එය වසං කළේ නම්, ඔහු අල්ලාහ්ගේ වගකීමෙන් සිටී. ඔහු කැමැතිනම්, ඔහුට සමාව ලබා දෙයි. නැතහොත්, ඔහුට දඬුවම් කරයි.

එහෙයින්, නබිතුමාගේ මෙම ප්‍රකාශය අනුව අපි මෙම කරුණු කෙරෙහි එතුමා වෙත දිවුරුම් ප්‍රකාශ කළෙමු.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

අවස්ථා හා ස්ථාන අනුව නබිනායක මුහම්මදු (සල්) තුමා වෙත කෙරෙන දිවුරුම් ප්‍රකාශය විවිධව පවතී. සැම දේ අතර වැදගත්ම කරුණුනම් ඒකදේව වාදයකි. ඉමහත් පාපයනම් අල්ලාහ්ට ආදේශ කිරීමකි. සොරකම් කිරීම මහා පාපයක් බැවින් එය තහනම්ය. එසේම, දුරාචාරයෙහි යෙදීමද මහා පාපයක් බැවින් එය සමාජයටම තහනම්කර ඇත. දිළිඳුකමට බියවී දරුවන් ඝාතනය කිරීම අඥාන කාලයේ ක්‍රියාවක් බැවින් එය වළක්වා ඇත.

එසේම, බොරු කීම හා දොස්පද කීමද තහනම්ය. යහපත් කරුණු කෙරෙහි පමණක් කීකරුවිය යුතුයි. යහපත් කාර්යවල (නබිනායක තුමාට) වෙනස්කම් කිරීම තහනම්ය. කුසල් ක්‍රියාවන්ට අදාල කුලිය අල්ලාහ්ගෙන් හැර අන් අය ගෙන් අපේක්ෂා කළ නොයුතුයි. මිනිසා තමාගේ ක්‍රියාවන් මගින් අල්ලාහ්ගේ දායාදයන් ලබා ගත යුතුයි. අල්ලාහ්ට ආදේශ කිරීමද ක්‍රියාවකි. පාපයක් නොකර වැළකී සිටින් නාට එයින් වැළකී සිටීමට හා එයින් වැළකීම සඳහා ඉවසීමෙන් සිටීමට අල්ලාහ් කුලිය ලබා දෙයි.

පාපයන් වෙනුවෙන් ලබා දෙනු ලබන දඬුවම් මිනිසාව පවිත්‍ර කිරීමක් හා එම පාපයට ප්‍රතිකාරයක් බවට පත්වේ. මිනිසාට සිදුවන පීඩාවන්ද එසේම පවතී. දඬුවමට අදාල පාපයක් කළ තැනැත්තා දඬුවම ලබා ගැනීම සඳහා ඉදිරිපත්වීම අනවශ්‍යයකි. නමුදු ඔහු එම පාපය ප්‍රසිද්ධ නොකර ඒ වෙනුවෙන් අල්ලාහ්ගෙන් පාපොච්චාරණය කළ යුතුයි. මහා පාපයන් කළ අය අල්ලාහ්ගේ පැවැත්මෙහි රඳී සිටිති.

ඔහු කැමැති නම්, දඬුවමට ලක් කරයි. නැතහොත් ඔහුට කමා කරයි.

මහා පාප ක්‍රියාවක් කළ මුස්ලිම් වරයා එය අනුමත බව නොසළකා සිටින තෙක් ඒකී හේතුවෙන් ඔහු කාෆිර් බවට නොපත්වෙ. මහා පාපයන් කළ අය නරකාදියෙහි පිවිසෙන අතර, පසුව ඔහුගේ ඒක දේවත්ව විශ්වාසය හේතුවෙන් එයින් පිටමත් කරනු ලැබේ. කුසල් ක්‍රියාවන් ඊමානයට අදාල කරුණුය. අල්ලාහ්ට කීකරුවීමෙන් පුද්ගලයෙකුගේ ඊමානය වැඩිවෙ. ඔහුට වෙනස්කම් කිරීමෙන් එය අඩුවෙ.

**87**-අබූදර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

මම නබිනායක මුහම්මදු (සල්) තුමා වෙත පැමිණියෙමි. එකළ එතුමා නින්දයෙහි පසුවිය. එතුමා මත සුදු පැහැති ඇඳුමක් තිබින. (මම ආපසු හැරී ආවෙමි.) පසුව, නැවත එතුමා වෙත පැමිණීමි. එකළද එතුමා නින්දෙයහි පසුවිය. (මා නැවත හැරී ආවෙමි.) පසුව, නැවත මම එතුමා වෙත පැමිණීමි. එකළ එතුමා අවදිව සිටියේය. මම එතුමා අභියස හිඳ ගත්තෙමි.

එකළ එතුමා 'කවරෙක් වන්දනාමානය කිරීමට සුදුසු ස්වාමියා අල්ලාහ් හැර අන් කවරෙක් හෝ නොමැති බව ප්‍රකාශ කර පසුව ඔහු එම ස්ථාවරයෙහිම නැසී ගියේනම්, ඔහු ස්වර්ගයට පිවිසේ' යනුවෙන් පැවැසීය. එකළ මා 'ඔහු දුරාචාරයෙහි යෙදුනත්ද, ඔහු සොරකම් කළත්ද?' යැයි විම සීමි. එයට එතුමා 'ඔහු දුරාචාරයෙහි යෙදුනත්, ඔහු සොර කම් කළත් ස්වර්ගයට පිවිසේ' යැයි පැවැසීය. මම නැවත 'ඔහු දුරාචාරයෙහි යෙදුනත්ද ඔහු සොරකම් කළත්ද?' යැයි

විමසීමි. එකල්හිද එතුමා 'මහු දුරාචාරයෙහි යෙදුනත්, සොර කම් කළත් ස්වර්ගයයෙහි පිවිසේ' යනුවෙන් තුන් වතාවක් පැවැසීය. සිව්වන වතාවේ එතුමා 'අබූදර්ගේ නාසයෙහි පස් බද්ධවුවත්' යනුවෙන් පැවැසීය.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

තම සමාජය කෙරෙහි පවතින නබිනායක මුහම්මදු (සල්) තුමාගේ කරුණාව හා ප්‍රේමය මෙහි සනාථකර ඇත. මහා පාප ක්‍රියාවන්හි යෙදෙන්නා එය අනුමත බව නොසළ කන තෙක් කාෆිර්වරයෙකු ලෙසට නොපත් වේ. ඒකදේව වාදීන් අතර සිටින පාපීන්ගේ රැඳුම් ස්ථානය ස්වර්ගයෙකි. නියතව, ඒකදේවවාදය මහා පාපයන් විනාශ කරන ආයුධ යකි. ආගමෙන් පිටමන්වීම කුසල් ක්‍රියාවන් විනාශ කරයි.

මිනිසාගේ ක්‍රියාවක් එහි නිමාව අනුව නිගමනය කරනු ලැබේ. යම් කරුණක් පිළිබඳව සැකයක් මතුවූ කළ ඒ ගැන විද්වතුන්ගෙන් විමසීමටද, එය පැහැදිලි නොවී කල බලයකට පත්වූ කළ නැවත නැවත විමසීමටද හැක. අර මුණ පැහැදිලිවීම සඳහා සමහර වචනවලින් සිසුන් දිරිගැන් විම් කළ හැක.

# නිර්දේශ කිරීම

**88**–අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

අබූහුරෛරා (රලි) තුමා නබි මුහම්මදු (සල්) තුමාගෙන් 'අල්ලාහ්ගේ දූතවරයාණෙනි පරලොව දිනයෙහි ඔබතුමාගේ

නිර්දේශයට මිනිසුන් අතර සුදුසු අය කවරෙක්ද?' යනුවෙන් විමසීය. එයට එතුමා 'අහෝ අබූහුරෛරා, නබිවදන් ගැන ඔබට ඇති උනන්දුව මම දකින හෙයින් මේ පිළිබඳව ප්‍රථම වරට ඔබ හැර අන් කවරෙක් හෝ නොවිමසනු ඇති බව සිතාගෙන සිටියෙමි' යනුවෙන් කී නබිතුමා 'කවරෙක් තම හදවතෙහි පිරිසිදු චේතනාවෙන් ලාඉලාහ ඉල්ලල්ලාහ් යනු වෙන් පවසන්නේද, පරලොව දිනයෙහි මාගේ නිර්දේශයට සුදුසු වන්නයා ඔහුමය' යැයි ප්‍රකාශ කළේය.

(මූලාශ්‍රය : බුහාරි)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

ඒක දේවවාදීන් ඔවුහු මහා පාප ක්‍රියාවන්හි යෙදුනත්, නබිනායක මුහම්මදු (සල්) තුමාගේ නිර්දේශයට සුදුස්සන් වේ. නමුදු අවස්ථාවාදීන්ට එතුමාගේ නිර්දේශය නොලැබේ. මන්ද යත්, ඔවුහු ලා ඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් ප්‍රකාශ කළත්, එය පවිත්‍ර චේතනාවෙන් හා සත්‍යභාවයෙන් ප්‍රකාශ නොකරයි. නබිනායක තුමාගේ නිර්දේශය එතුමාගේ සමාජයට ලැබෙන බව මෙහි සනාථ වේ.

ලාඉලාහ ඉල්ලල්ලාහ්හි විශේෂත්වය මෙහි සඳහන් කර ඇත. එය සෑම ක්‍රියාවන්ටම පදනමකි. මෙහි දැනුම් ඥානය හා නබිවදන් කෙරෙහි උනන්දුවීමේ ශ්‍රේෂ්ටත්වය පැහැදිළි කර ඇති අතර, අබූහුරෛරා (රලි) තුමාගේ විශේෂත්වය හා නබිවදන් පිළිබඳව එතුමාට ඇති උනන්දුවද සඳහන්කර ඇත.

# විශ්වාසීන් ස්වර්ගයෙහි ස්වාමියා බැහදැකීම

**89**-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ජරීර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ඔබලා මෙම හඳ කිසියම් තදබදයකින් තොරව දකින සේ නියත වශයෙන්ම, ඔබලා ඔබලාගේ ස්වාමියාවද දකිති. ඉර උදාවීමට පෙර (ෆජ්ර්) සලාතය ඉටුකිරීමට වඩා හා ඉර බැසීමට පෙර (අස්ර්) සලාතය ඉටු කිරීමට වඩා (ඔබලාගේ වෙනත් කාර්යයන්) අභිබවා නොයාමට (වශබලාගත) හැකි නම්, ඒවා ඉටු කරන්න.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

විශ්වාසීන් පරලොව දිනයෙහි තම ස්වාමියාව බැහ දකින බව මෙහි සනාථවෙ. ඔවුන් තම ස්වාමියාව හඳ දකින සේ දැකීම යනුවෙන් උපමාකර ඇත්තේ එසේ පැහැදිළිව දැකීමට හැකි යන අර්ථයෙනි. එසේ නොමැතිව අල්ලාහ් හඳට සමානව සිටින අර්ථයකින් නොවෙ. මෙවැනි ඌණතාවන් කෙරෙහි අල්ලාහ් ඉතා උතුම් වන්නයාය. මෙසේ අල්ලාහ්ව බැහ දැකීම පහසු කරන හේතූන් අතර සලාතය එකකි. සලාතය අතර ෆජ්ර් හා අස්ර් සලාතය ඉතා ශ්‍රේෂ්ඨවෙ.

කවරෙක් ෆජ්ර් හා අස්ර් යන ශීතල වෙලාවෙ ඉටුකරන සලාතයන් දෙක රැකවලදී ඉටු කරන්නේද, ඔහු ස්වර්ගයට පිවිසේ. මන්ද යත්, එම සලාතයන් දෙක නිදා ගන්නා හා කම්මැලිකම ඇතිවන වෙලාවන්හි ඉටු කරන සලාතයන්ය.

යහකම් කිරීම සෑම කුසලටම හේතු බවට පත්වේ. අල්ලාහ් බැහ දැකීම උතුම් භාග්‍යයකි. අල්ලාහ් ඔහුගේ ගෞරවනීය මුහුණ බැහැ දැකීමේ භාග්‍යය අප සැමට ලැබෙනු මැනවි.

**90**–නබි මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව එතුමාගේ සමහර බිරිඳන් මෙසේ වාර්තා කරන්නෝය.

ඔබලා මරණයට පත්වන තෙක් ඔබලාගේ ස්වාමියාව ඔබලාට බැහ දැකීමට නොහැක.

(මූලාශ්‍රය : මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

නියතව මෙලොවෙහි අල්ලාහ්ව බැහැ දැකීමට නොහැකි බවත්, පරලොවෙහි පමණක් ඔහුව දැකීමට හැකි බවත් මෙහි සනාථකර ඇත. ඔහුගේ විශ්වාසනීය මිනිසුන් ඔහුව බැහ දකින අතර, ඔහුගේ සතුරන් වූ කාෆිර්වරුන් ඔහුව නොදකිති. පරලොවෙහි අල්ලාහ්ව දැකිය නොහැකි බවට වැරදි සහගත මත දරන්නන් මෙහි හෙළා දැක ඇත. මන්ද යත්, විශ්වාසීන් මරණයෙන් පසු අල්ලාහ්ව බැහ දකින බව මෙහි තහවුරුකර ඇත.

**91**–අබූ සර්ද් අල්කුද්රී (රලි) තුමා වදනක් මෙසේ වාර්තා කරන්නේය.

නබිනායක මුහම්මදු (සල්) තුමාගේ කාලයේ සමහරුන් 'අල්ලාහ්ගේ දූතයාණෙනි, පරලොව දිනයේ අප ස්වාමියාව අපි බැහ දැකිය හැකිද ?' යනුවෙන් විමසූහ. එකළ නබි නායක තුමා 'ඔව්' යැයි පවසා 'වළාකුල නොමැති මධ්‍යම දහවල් කාලයේ ඉර දැකීමට ඔබලා ශ්‍රමයට ලක්වන්නේද ?

(එසේම) වළාකුල නොමැති පසලොස්වක රාත්‍රියේ හඳ දැකීමට ඔබලා ශ්‍රමයට ලක්වන්නේද ?' යනුවෙන් විමසීය. එයට ඔවුහු 'අල්ලාහ්ගේ දූතයාණෙනි, අපි ශ්‍රමයට ලක් නොවන්නෙමු' යනුවෙන් කීහ. පසුව නබිතුමා '(ඉර හා හඳ) මේවා දෙකෙන් එකක් දැකීමට ඔබලා ශ්‍රමයට නොපත්වන සේ පරලොවෙහි අල්ලාහ්ව බැහ දැකීම සඳහාද ඔබලා ශ්‍රමයට නොපත්වෙති.

පරලොව දිනය පැමිණ විට දැනුම් දෙන්නෙක් 'සියළුම සමාජයන්ම ඔවුනොවුන් වන්දනාමානය කළ දෙ(වියාව)ය ලුහුබැඳමින් යනු' යැයි දැනුම් දෙයි. එකළ අල්ලාහ් හැර පිළිම් හා බිලිදෙන අල්තාර (ස්වාමීන් ලෙස) වන්දනාමානය කළ සැමදෙනා නරකාදියෙහි වැටිති. අවසානයේ යහපතුන්, අයහපතුන් හා වේදකාරීන්ගෙන් අල්ලාහ්ටම වන්දනාමානය කළ අය පමණක් ඉතිරිව සිටිති.

පසුව යුදෙව්වරුන් කැඳවා 'ඔබලා වන්දනාමානය කර මින් සිටියේ කවරෙකුටද ?' යනුවෙන් විමසූකළ ඔවුහු 'අපි අල්ලාහ්ගේ පුත්‍රයාවූ උසෙර්ට වන්දනාමානය කරමින් සිටියෙමු' යැයි පවසති. 'ඔබලා බොරු කියන්නෝය. අල්ලාහ්ට කිසියම් බිරිඳක් හෝ දරුවෙක් හෝ නොමැත. පසුව 'ඔබලාට අවශ්‍ය කුමක්ද ?' යනුවෙන් ඔවුන්ගෙන් විමසූ කළ ඔවුහු 'අහෝ අප ස්වාමිනී, අපි පිපාසයෙන් සිටින බැවින් අපට පානීය ජලය ලබා දෙන්න' යනුවෙන් අසති. එබැවින්, ඔවුන්ට ජලය කරා සංඥා කෙරේ. පසුව ඔබලා ජලය පානය නොකළේද ? යැයි ඔවුන්ගෙන් විමසා නිරය දෙසට ඔවුන් රැස්කෙරේ. එකින් එක ගෙටෙන එම අපාය(යෙහි ගින්න) මිරිඟුව ලෙස ඔවුන්ට දර්ශණයවේ. පසුව ඔවුහු එහි වැටෙති.

පසුව කිතු බැතිමතුන් කැඳවා 'ඔබලා කවරෙකුට වන්දනාමානය කරමින් සිටියේද ?' යැයි විමසූ කළ ඔවුහු 'අපි අල්ලාහ්ගේ පුත්‍රයාවූ මසීහ් (ජේසුස් වහන්සේ)ට වන්දනාමානය කළ බව පවසති. 'ඔබලා බොරු කියන්නෝය. අල්ලාහ්ට කිසියම් බිරිඳක් හෝ දරුවක් හෝ නොමැත. පසුව 'ඔබලාට අවශ්‍ය කුමක්ද ?' යනුවෙන් ඔවුන්ගෙන් විමසූවිට ඔවුහු 'අහෝ අප ස්වාමිනී අපි පිපාසයෙන් සිටින බැවින් අපට පානීය ජලය ලබාදෙන්න' යනුවෙන් අසති. එබැවින්, ඔවුන්ට ජලය කරා සංඥා කෙරේ. පසු ඔබලා ජලය පානය නොකළේද ? යැයි ඔවුන්ගෙන් විමසා නිරය දෙසට ඔවුන් රැස්කරනු ලැබේ. එකින් එක ගෙටෙන එම අපාය(යෙහි ගින්න) මිරිඟුව ලෙස ඔවුන්ට දර්ශණයවේ. පසුව ඔවුහු එහි වැටෙති. අවසානයේදී අල්ලාහ්ට නැමදුම් කළ යහපතුන් හා අයහපතුන් පමණක් ඉතිරිව සිටිති.

විශ්වය නිර්මානය කළ අල්ලාහ් ඔවුන් පෙර දැක රූපයට සමාන රූපයෙන් ඔවුන් ඉදිරියෙහි පැමිණ 'සෑම සමාජයන්ම ඔවුනොවුන් වන්දනාමානය කළ අය අනුගමනය කරමින් පිටත්වූහ. ඔබලා මෙහි රැඳී සිට බලාපොරොත්තු වන්නේ කුමක්ද ?' යැයි විමසයි. එයට ඔවුහු 'අප ස්වාමිනී, ලොවෙහි අපි ඔවුන්ට ඉතා අවශ්‍යවූවන් ලෙස සිටියත්, අපි ඔවුන් සමග එක්ව නොසිට ඔවුන්ගෙන් ඉවත්වී සිටියෙමු. (එනම් අපි දැන් ඔවුන් සමග කෙසේ එක්ව සිටිය හැකිද ?)' යනුවෙන් පවසති. එකළ අල්ලාහ් 'ඔබලාගේ ස්වාමියා මමය' යනුවෙන් පැවැසූවිට ඔවුහු 'ඔබගේ උවදුරුවෙන් අල්ලාහ්ගෙන් ආරක්ෂා පතන්නෙමු. අපි අල්ලාහ්ට කිසිවක් හෝ ආදේශ නොකරන්නෙමු' යැයි (දෙවරක් හෝ තෙවරක්)

කියති. අවසානයේ ඔවුන්ගෙන් සමහරුන් එතැනින් පිටත් වීමට පවා සූදානම් වෙති.

පසුව අල්ලාහ් 'ඔබලා වෙත ඔබලාගේ ස්වාමියාව හඳුනා ගැනීමට හැකි කිසියම් සළකුනක් හෝ ඇත්තේද ?' යනුවෙන් විමසයි. එයට ඔවුහු 'ඔව් ඇත්තේය' යනුවෙන් පවසති. වහාම අල්ලාහ් ඔහුගේ විලුඹ සිට සිය තිරය ඉවත් කරයි. (පසුව) ලොවෙහි ස්වයං මනාපයෙන් අල්ලාහ්ට හිස නමා වන්දනාමානය කළ අයට (පමණක්) එම අවස්ථාවෙහි හිස නමා වන්දනාමානය කිරීමට අවසරය ලබා දෙයි. (දූර් නාමයට) බියවීමෙන් හා මිනිසුන්ට පෙන්වීමෙන් ලොවෙහි හිස නමා අල්ලාහ්ට නැමදුම කළ අයට අල්ලාහ් ඔවුන්ගේ පිට කොන්ද නැවීමට නොහැකි තත්ත්වයට පත් කරයි. එයින් ඔවුහු හිස නමා වන්දනාමානය කිරීමට තැත් කරන සෑම අවස්ථාවන්හිම ඔවුහු පෙරළා වැටෙති.

හිස නමා වන්දනාමානය කළ අය ඔවුන්ගේ හිස් ඔසවා බලති. එකළ අල්ලාහ් ඔවුහු ඔහුව ප්‍රථමයෙන් දිටී රූපයෙන් දර්ශණයකර, 'ඔබලාගේ ස්වාමියා මමය' යනුවෙන් පවසයි. ඔවුහුද 'අප ස්වාමියා ඔබමය' යනුවෙන් පවසති.

පසුව, අපාය මත පාලමක් ඉදිකරනු ලබන අතර, එහි නිර්දේශ කිරීම සිදු කෙරේ. එකළ ඔවුහු 'අහෝ ස්වාමිනී, අපව රැකගන්න. අපව රැකගන්න' යැයි කියන බව නබි නායක තුමා පවසන්නේය.

එතුමාගෙන් අල්ලාහ්ගේ දූතවරයාණෙනි, පාලමක් යනු කුමක්ද ? යැයි විමසූ කළ එතුමා 'එය ලිස්සන එකකි. එහි යකඩ කොකු හා නජ්ද් ප්‍රදේශයේ ලැබෙන සළදාන් යනු

ශක්තිමක් කටු ඇත්තේය. විශ්වාසීන් (තමතමන්ගේ ක්‍රියාවන් අනුව) ඇස් පිය හෙලෙන මොහොතේද, අකුණු වේග යෙන්ද, සුළඟ වේගයෙන්ද, සීඝ්‍රව දුවන අශ්වයන්ගේ වේග යෙන්ද එය පසුකරමින් පිටත්වෙති. මෙලෙස සමහරුන් එයින් ආරක්ෂාවරණය ලබති. තවත් සමහරුන් එකී කොකු වලට හා කටුවලට අසුවී සිටිති. වෙනත් සමහරුන් අපාය තුල තල්ලුවී වැටෙති. අවසානයේදී විශ්වාසීන් අපායෙන් සිට නිදහස් වෙති.

මාගේ ප්‍රාණය කවරෙකුගේ අතෙහි පවතින්නේද, එම ස්වාමියා මත දිවුරා කියමි. එම විශ්වාසීන් අපායෙහි වැටී සිටින තම සහෝදරයන් වෙනුවෙන් අල්ලාහ් වෙත කරන පැමිණිල්ලට වඩා ඔබලාගෙන් කවරෙක් හෝ ලොවෙහි අපරාධයක් කල අයගෙන් තම අයිතිවාසිකම ලබා ගැනීම වෙනුවෙන් අල්ලාහ් වෙත දැඩි ලෙස පැමිණිලි නොකරති. ඔවුහු අපායේ සිටින තම සහෝදරයන් වෙනුවෙන් 'අහෝ, අප ස්වාමිනී, ඔවුන් අප සමග සලාතය ඉටු කළහ. උපවාස යෙහි යෙදුනාහ. හජ් කර්තව්‍යය ඉටු කළහ' යනුවෙන් කියති. එකල 'ඔබලාට හඳුනන අය අපායෙන් සිට පිටත් කරන්න' යැයි ඔවුන්ට පැවැසේ. පසුව (අපායෙන් පිටමන් කරනු ලබන) ඔවුන් අපායට තහනම් කෙරේ. ඔවුහු දෙපා වන්හි අඩක් සහ දණහිස් දෙක දක්වා අපාය දුෂ්ට කළ අධික පිරිසක් අපායෙන් සිට පිටත් කරති.

පසුව ඔවුහු 'අප ස්වාමිනී, ඔබ (පිටමන් කරන මෙන්) අණ කළ අය අතර කවරෙක් හෝ අපායෙහි ඉතිරිව නැත' යැයි පවසති. එයට අල්ලාහ් 'ඔබලා නැවත ගොස් කවරෙකු ගේ හදවතෙහි එක් දීනාර් ප්‍රමාණ කුසල් තිබෙන්නේද,

මඟුවද අපායෙන් පිටත් කරන්න' යනුවෙන් පැවැසීමෙන් අනතුරුව ඔවුහු අධික පිරිස් අපායෙන් පිටමත් කරති. පසුව ඔවුහු 'අප ස්වාමිනී, ඔබ අණ කළ සැම දෙනා අපායෙන් පිටත් කළෙමු' යැයි කියති. එයට අල්ලාහ් 'ඔබලා නැවත ගොස් කවරෙකුගේ හදවතෙහි අඩ දීනාර් ප්‍රමාණයක කුසල් තිබෙන්නේද, ඔවුහුද පිටමත් කරන්න' යනුවෙන් පවසයි. ඒ අනුව ඔවුහු අධික පිරිස් අපායෙන් පිටත් කරති. පසුව 'ස්වාමිනී, ඔබ අණ කළ අයගෙන් කවරෙක් හෝ ඉතිරි නොවෙන තරමට සැමදෙනා පිටත් කළෙමු' යැයි ඔවුහු පවසති.

පසුව අල්ලාහ් ඔවුන් අමතා 'ඔබලා නැවත ගොස් කවරෙකුගේ හදවතෙහි අබ ඇට ප්‍රමාණයක කුසල් තිබෙන්නේද, ඔවහුද පිටමත් කරන්න' යනුවෙන් පවසයි. පසුව 'ස්වාමිනී, ඔබ අණ කළ අයගෙන් කුසල් කළ කිසිවෙක් හෝ ඉතිරි නොවන තරමට සැමදෙනා පිටත් කළෙමු' යැයි ඔවුහු පවසති.

පසුව අල්ලාහ් 'දේව දූතවරුන්, වක්තෘවරුන් හා විශ්වාස වන්තයින් නිර්දේශ කළහ. දැනට ඉතිරිව පවතින්නේ අසීමිත කරුණා වන්තයාවූ අල්ලාහ් පමණී' යනුවෙන් පවසා අපායෙන් සිට එක් මිටත් අහුරා එයින් කිසියම් කුසලක් හෝ නොකළ පිරිසක් පිටත් කරයි.

අඟුරු බවට පරිවර්තනවී සිටින ඔවුන්ව අල්ලාහ් ස්වර්ග දොරටුවෙහි පිහිටා ඇති ජීව නදිය නම්වූ ගඟෙහි ගිල්වයි. එමගින් ඔවුහු ගලායන ගඟක ගොඩෙහි පැළවන බීජයන් සේ පිපිදී සිටිති.

බීජ ගල් සහ පැලෑටි වර්ග අසල පැළවීමද, ඒවා අතර, ඉර එළියෙන් වර්ධනයවන දේ කොළ හා කහ පැහැයෙන් හා සෑවණැල්ලෙහි වර්ධනයවන දේ සුදු පැහැයෙන් තිබීමද ඔබලා නොදුටු වෙද ? යනුවෙන් නබිනායක තුමා පැවැසූ විට සහාබාවරුන් 'අල්ලාහ්ගේ දූතයාණෙනි, ඔබතුමා මින් පෙර ගම්මානයක එළුන් දක්කා ගෙන සිටි අයෙකු සේ පවසන්නේය ? යනුවෙන් කීහ.

එකල නබිනායක තුමා 'ඔවුන් මුතු ඇට සේ පිටත්වෙති. ඔවුන්ගේ බෙල්ලේ ස්වර්ග වැසියන් බව හැඳින්වෙන වළලු මුද්‍රාවක් පවතී. ඔවුන් අල්ලාහ් විසින් අපායෙන් නිදහස් කළ අයවෙ. කිසියම් කුසලක් හෝ යහකමක් හෝ නොකළ ඔවුහුව අල්ලාහ් ස්වර්ගයට ඇතුළු කළේය.

පසුව අල්ලාහ් ඔවුන් අමතා 'ඔබලා ස්වර්ගයෙහි ඇතුළු වන්න. එහි ඔබලා දකින සෑම දේ ඔබලාටම අයිතිය' යනු වෙන් පවසයි. එකල ඔවුහු 'අහෝ අප ස්වාමිනී, ලොවෙහි කවරෙකුට හෝ ලබා නොදුන් භාග්‍යයන් අපහට ඔබ ලබා දී ඇත්තේය' යැයි පවසති.

එයට අල්ලාහ් 'මේ සෑමට වඩා වශේෂ දෙයක් ඔබලා වෙනුවෙන් මා වෙත ඇත්තේය' යනුවෙන් පවසයි. එකල ඔවුහු 'අහෝ ස්වාමිනී, මෙයට වඩා විශේෂ දෙයක්ද ? එය කුමක්ද ? යැයි විමසති. එයට අල්ලාහ් 'එය (ඔබලා පිළිබඳ) මාගේ තෘප්තියකි. මින් ඉදිරියට මා ඔබලා කෙරෙහි කෝප නොවන්නෙමි' යනුවෙන් පවසයි.

(මූලාශ්‍රය : බුහාරි හා මුස්ලිම්)

## නබි වදනෙහි අන්තර්ගත කරුණු

විශ්වාස වන්තයින් පරලොව දිනයෙහි අල්ලාහ්ව බැහ දකින බවත්, ස්වාමියාට විලුඹ ඇති බවත් සනාථවේ. මෙය කිසියම් ප්‍රමාණ කිරීමකින් හා උදාහරණ කිරීමකින් තොරව නබි වදනෙහි සඳහන් වේ.

අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔහු හා සමනව කිසිවක් හෝ නොමැත. ඔහු ශ්‍රවණය කරන්නා හා දර්ශනය කරන්නාය.*

*(අල්කුර්ආන්-42:11)*

අල්ලාහ් හැර වෙනත් ස්වාමිවරුන් පිළිගත් සැම දෙනා නොමග ගිය හා මංමුළාවට පත්වූ අයවේ. පාපීන්වූ ඒක දේව වාදීන් නිරයෙහි සදා කාලික නොසිටිති.

මහා පාප ක්‍රියාවල යෙදු අයට අල්ලාහ් කමා නොකළේ නම්, ඔවුහු දඬුවමට ලක්වීමට හැක. අන් අයට පෙන්වීම සඳහා ක්‍රියාවක යෙදීමේ විපාකය මෙහි සඳහන් වේ. එය සුළු අවස්ථාවාදයකි. අන් අයට පෙන්වීම සඳහා ක්‍රියාවන්හි යෙදෙන්නා ඔහු සලාතය ඉටු කළත්, උපවාසයෙහි යෙදුනත් හා හජ් කර්තව්‍යය ඉටු කළත් ඒවා නිශ්ප්‍රයෝජන වේ. ලොවෙහි කරන ක්‍රියාවන් හා එකී නීතිරීතීන් සියල්ල නිගමනය කරනු ලබන්නේ ඒවාහි භාහිරත්වය අනුවය. එනමුත්, අභ්‍යන්තරත්වය පිළිබඳ වගකීම් අල්ලාහ් සතුව පවතී.

දේව දූතවරුන්, වක්තෘවරුන් හා විශ්වාස වන්තයින්ගේ නිර්දේශ කිරීම් පවතින බව සනාථ වේ. එසේම, අල්ලාහ්

තෘප්තිවන බවද ඔහු කෝපවන බවද මෙහි සනාථකර ඇත. ඔහු තම මහානුභාවයට ඔබින පරිදි තම ප්‍රේම වන්තයින් කෙරෙහි තෘප්තිවන අතර, තම සතුරන් කෙරෙහි කෝප වේ. අපාය මධ්‍යයෙහි පාලමක් ඇති බවද මෙහි තහවුරු වේ.

මිනිසුන් ඔවුන්ගේ ක්‍රියාවන් අනුව එම පාලම පසුකර ගෙන යති. අල්ලාහ්ට ඔහුගේ මහානුභාවයට ඔබින සහ නිර්මානයන්ගේ රූපවලට සමාන නොවන රූපයක් ඇති බව මෙහි තහවුරුකර ඇත. මිනිසුන් තම ජීවිතයෙහි දැන සිටින කරුණු මගින් පරලොව හා සැඟවුනු කරුණු පිළි බඳව උදාහරණ කිරීමට හැක.

සර්ව බලධාරී අල්ලාහ් !

අප සැම රැක ගනු මැනව ...

وصلى الله على نبينا محمد وعلى آله وصحبه وسلم ،

والحمد لله رب العالمين.

# පටුන


1-ඉස්ලාමය හා ඊමානය ........................................- 7

2-ඉස්ලාමය කරා කැදවීම ........................................- 13

3-ඉස්ලාම්හි විශේෂත්වය ........................................- 17

4-ඉස්ලාම්හි අනිවාර්ය කරුණු ........................................- 28

5-ඉස්ලාම්හි විත්තයන් හා සලකුණු ........................................- 30

6-ඒකදේවත්වය කෙරෙහි අණ කිරීම ........................................- 34

7-ඒකදේවත්වයේ විශේෂත්වය ........................................- 40

8-පාපකාර ඒකදේවවාදීන්ට අපාය නිත්‍යවීම ..........- 42

9-ආදේශ කිරීම පිළිබඳ අවවාදය ........................................- 44

10-ඊමාන්හි විශේෂත්වය ........................................- 50

11-ඊමානයේ ගුණාංග හා සලකුණු ........................................- 52

12-ඊමානය අඩුවීම හා වැඩිවීම ........................................- 61

13-ලාඉලාහ ඉල්ලල්ලාහි කොන්දේසි ........................................- 64

14-ලාඉලාහ ඉල්ලල්ලාහි විශේෂත්වය ........................................- 70

15-අල්ලාහ්ගේ නම් හා ගුණාංග ........................................- 74

16-අල්ලාහ්ට අනවශ්‍ය ගුණාංග ........................................- 95

17-අල්ලාහ්ගේ දේව දූතයන් ........................................- 99

18-නබිනායක තුමාට වහී පහළවීම ........................................- 100

19-වහී ආරම්භවූයේ කෙසේද ? ........................................- 101

20-වහියෙහි බරපතලකම ........................................- 109

21-වේශධාරීන්ගේ සලකුණු ........................................- 112

22-දේව ප්‍රතික්ෂේපයෙහි උස් පහත් තත්වය ..........- 115

23-මහා පාපයෙන් මුස්ලිම්වරයෙක් කාෆිර් නොවීම - 117

24-රෙකමදාරු කිරීම ........................................- 120

25-විශ්වාසීන් ස්වර්ගයෙහි ස්වාමියාව බැහැදැකීම ....- 122